NATIONAL SCIENCE FOUNDATION



වාර්ෂික වාර්තාව 2021

ஆண்டறிக்கை 2021

Annual Report 2021

ජාතික විද්‍යා පදනම

தேசிய விஞ்ஞான மன்றம்

National Science Foundation

තම ආයතනය වෙත පැවරී ඇති විධි නියෝගයන් අනුව කටයුතු කරමින්ද, "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව මෙන්ම තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා කැපවෙමින්ද ජාතික විද්‍යා පදනම, එහි සභාපතිවරයාගේ හා කළමනාකරණ මණ්ඩලයේ මගපෙන්වීම අනුව කටයුතු කරන සිය කැපවූ කාර්ය මණ්ඩලය සමගින්, 2021 වර්ෂය පුරා ප්‍රශස්ත නිමැවුමක් ලබාදෙමින් ශක්තියෙන් සහ ජවයෙන් යුතුව ඉදිරිය බලා ගමන් කළේය. මෙම වසරේ වාර්ෂික වාර්තාවට, වසරේ ක්‍රියාකාරී සැලසුම තුළ දක්වා ඇති පරිදි සම්පූර්ණ කරන ලද වැඩ කටයුතු ඇතුළත් වේ. (පිටු අංක 28-31). මෙම වාර්තාව ප්‍රස්තාරීය ඉදිරිපත් කිරීම් 53 ක් , වගු 13 ක්, පින්තූර 88 ක, දළ රූප සටහන් 02ක් සහ ඇමුණුම් 07 කින් සමන්විත වන අතර උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට ආයතනයේ කාර්ය සාධනය, අනාගත අපේක්ෂාවන් සහ ආයතනය තුළ පවතින ගැටළු පිළිබඳව අදහසක් ගැනීමට අවශ්‍ය සියලු තොරතුරු එහි ඇතුළත් වේ. සම්පූර්ණ වාර්ෂික වාර්තාවල විගණන වාර්තාව සහ විගණන වාර්තාව පිළිබඳ ජාතික විද්‍යා පදනමේ අදහස්ද සහිතව පිටු 160 කින් යුක්ත වේ. 2021 වසරේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්ෂික වාර්තා සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශ අනුගමනය කරමින් මෙම වාර්තාව සකස් කර ඇත.

ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ - 07,
ශ්‍රී ලංකාව.

දුරකතන : +94 112694170
+94 112696771
ෆැක්ස් : +94 112694754

ඊ මේල් : dg@nsf.gov.lk

වෙබ් : www.nsf.gov.lk

: https://www.facebook.com/nsflk/

: https://twitter.com/NSFSriLanka

: https://www.youtube.com/user/NSFSL



පටුන

ජාතික විද්‍යා පදනම 01

- අප පිළිබඳ 03
- පනත මගින් පවරා ඇති කාර්යයන් 03
- දැක්ම 04
- මෙහෙවර 04
- ඉලක්ක 04
- අරමුණු 04
- පාලන රාමුව 05

  - » සංවිධාන ව්‍යුහය 07
  - » කළමනාකරණ මණ්ඩලය පිළිබඳ කෙටියෙන් 08
  - » කාර්යමණ්ඩල ශක්තිය 11
  - » පෙර වසර 10ට අදාළ මූල්‍ය හා සම්බන්ධ සුවිශේෂී කරුණු 12
  - » ජාතික විද්‍යා පදනමේ බාහිර සම්පත් සංචිතය 15

සභාපතිවරයාගේ සමාලෝචනය 17

අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව 19

- සාරාංශය සහ සුවිශේෂී කරුණු 20
- ප්‍රධාන කාර්යසාධන දර්ශක සමග ක්‍රියාකාරී සැලැස්ම 28

- නිමැවුම්/ ප්‍රතිඵල මත පදනම් වූ කාර්යසාධනය සමාලෝචනය 32

  - » පර්යේෂණ හා සංවර්ධන සහ ධාරිතා සංවර්ධනය 32
  - » විද්‍යා හා තාක්ෂණ තොරතුරු ව්‍යාප්ත කිරීම 51
  - » විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන දර්ශක සහ දත්ත සඳහා මූලාශ්‍රයක් සැපයීම 65
  - » විද්‍යාව ප්‍රචලිත කිරීම 69
  - » උප කාර්යයන් සහ තිරසාරත්වය 75
  - » අනාගත ප්‍රක්ෂේපණ වාර්තාව 80

විගණනය කළ මූල්‍ය වාර්තාව 83

විගණකාධිපතිවරයාගේ වාර්තාව 121

විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන්
ජාතික විද්‍යා පදනමේ ප්‍රතිපෝෂණය 129

ඇමුණුම් 135

ඇමුණුම 1- ප්‍රධාන කාර්ය මණ්ඩලය - 2021 දෙසැම්බර් 31 දිනට 136

ඇමුණුම 2- පිරිනමන ලද පර්යේෂණ හා සංවර්ධන ප්‍රදාන - 2021 140

ඇමුණුම 3- සම්පූර්ණ කරන ලද පර්යේෂණ හා සංවර්ධන ප්‍රදාන - 2021 143

ඇමුණුම 4- 2021 වසරේදී සම්පූර්ණ කරන ලද පර්යේෂණ ශිෂ්‍යත්ව 146

ඇමුණුම 5- පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන සහාය යෝජනා ක්‍රමය (SUSRED) යටතේ ප්‍රදානයන් 2021 148

ඇමුණුම 6- ප්‍රකාශන ගාස්තු සඳහා සහාය යෝජනා ක්‍රමය (SSPF) 151

ඇමුණුම 7- පුහුණු හා ධාරිතා සංවර්ධනය 152



ජාතික විද්‍යා පදනම

අප පිළිබඳ

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික විද්‍යා පදනම වසර 53කට වැඩි කාලයක් මුළුල්ලේ දැය උදෙසා මහත් කැපවීමෙන් සේවය සලසමින් සිටී. මෙම සංවිධානය මුලින්ම ස්ථාපිත කරනු ලැබුවේ. 1968 වසරේදී ජාතික විද්‍යා සභාව (NSC) ලෙසයි (1968 අංක 09 දරන පනත මගින්) ජාතික විද්‍යා සභාව 1982 වසරේදී ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය (NARESA) ලෙස (1981 අංක 78 දරන පනත මගින්) ප්‍රතිව්‍යුහගත කරන ලදී. වසර 16 ක සේවයකින් පසුව ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය 1998 වසරේදී ජාතික විද්‍යා පදනම ලෙස 1994 අංක 11 දරන පනත මගින් ප්‍රතිසංවිධානය කරන ලදී.

පනත මගින් පවරා ඇති කාර්යයන්

1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතෙහි විධි විධාන අනුව පහත සඳහන් කාර්යයන් සඳහා ජාතික විද්‍යා පදනමට බලය පැවරී තිබේ.

අ) පහත දෑ පිළිබඳ අදහස පෙරදැරිව විශ්ව විද්‍යාල, විද්‍යා හා තාක්ෂණ ආයතන සහ විද්‍යාඥයන් විසින් සිදු කරනු ලබන මූලික හා ව්‍යවහාරික විද්‍යාත්මක පර්යේෂණ සඳහා මූලාරම්භය සැපයීම, පහසුකම් සැපයීම හා උපකාර වීම -

(i) සමාජ විද්‍යා පර්යේෂණයන් හා විද්‍යා අධ්‍යාපන වැඩසටහන් ඇතුළුව විද්‍යාත්මක පර්යේෂණ විභව්‍යතාවන් ශක්තිමත් කිරීම.

(ii) ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය කිරීම.

(iii) ශ්‍රී ලංකාවේ ජනතාවගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සහ

(iv) විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂකයන් පුහුණු කිරීම.

ආ) ශ්‍රී ලංකාවේ සිටින හා විදෙස්ගත විද්‍යාඥයන් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරුව සඳහා උපකාරී වීම.

ඇ) විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි සිදු කරනු ලබන විද්‍යාත්මක අධ්‍යයනය සහ විද්‍යාත්මක කටයුතු සඳහා ශිෂ්‍යත්ව හා අධි ශිෂ්‍යත්ව පිරිනැමීම.

ඈ) විද්‍යාත්මක හා තාක්ෂණික පුද්ගලයන් පිළිබඳව තත්කාලීන නාම ලේඛනයක් පවත්වා ගැනීම හා ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක හා තාක්ෂණික සම්පත් ලබා ගැනීමට පවතින හැකියාව සහ වර්තමානයේ තිබෙන ප්‍රමාණය හා ප්‍රක්ෂේපිත අවශ්‍යතා පිළිබඳව දත්ත රැස් කිරීම, අර්ථ කථනය කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා අතරමැදි ආයතනයක් වශයෙන් කටයුතු කිරීම මෙන්ම විද්‍යා, තාක්ෂණ මෙන්ම අනෙකුත් ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා අවශ්‍ය කෙරෙන තොරතුරු සම්පාදනය සිදු කරන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

ඉ) වැඩසටහන් සඳහා මූල්‍යාධාර සැපයීම මගින් මහජනයා අතර විද්‍යාව ප්‍රචලිත කිරීම.

දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය සමෘද්ධිය සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමේ ජාතියේ ප්‍රමුඛතම ගාමක බලවේගය බවට පත්වීම.

මෙහෙවර

කාර්ය මණ්ඩලයේ නිපුණත්වය හා තෘප්තිමත්භාවය සහතික කරමින් සහ තිරසාර සංවර්ධන ඉලක්ක කෙරෙහි නිසි අවධානය යොමු කරමින් පහත දැ ඉටු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා සාමාජීය සමෘද්ධිය සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.

- පර්යේෂණ, සංවර්ධනය, නවෝත්පාදන සහ තාක්ෂණ හුවමාරුව සඳහා මූලාරම්භය සැපයීම, පහසුකම් සැලසීම සහ සහාය දීම.
- දැනුම නිර්මාණය කිරීම, බෙදා හැරීම, ධාරිතා සංවර්ධනය, හවුල්කාරිත්වයන, විද්‍යාව ප්‍රචලිත කිරීම සහ විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම යන කාර්යයන් සඳහා හැකියාව ලබාදීම හා අරමුදල් සැපයීම; සහ
- ප්‍රතිපත්ති පර්යේෂණ සිදු කිරීම සහ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා සහාය වීම.

ඉලක්කය

ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛතා යටතේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම මගින් ජාතියේ ශීඝ්‍ර සංවර්ධනයට ක්‍රියාකාරීව හා ඵලදායී අන්දමින් දායක වීම.

අරමුණු

1. රාජ්‍ය - පෞද්ගලික, ආයතන -කර්මාන්ත හවුල්කාරිත්වයන් ගොඩනැංවීම මගින් දැනුම් ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සිදු කිරීම.
2. අපගේ ජනතාවගේ ජීවිතයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා සියලු විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන් තුළ අවශ්‍ය ධාරිතා සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තාක්ෂණ හුවමාරුවල දැනුම නිර්මාණය හා බෙදා හදා ගැනීම සඳහා පහසුකම් සැලසීම.
3. ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් තීරණ ගැනීම ප්‍රවර්ධනය කරමින් විද්‍යා හා තාක්ෂණ දර්ශක සංවර්ධනය සඳහා උපකාර කිරීමට ප්‍රතිපත්ති අධ්‍යයනයන් හා සමීක්ෂණ, දත්ත එක් රැස් කිරීම සහ සාක්ෂි පදනම් කරගත් වාර්තාකරණය සිදු කිරීම.
4. විද්‍යා සන්නිවේදනය තුළින් මහජනතාව සහ සමාජයේ අනෙකුත් අංශ වෙත සේවය සැලසීම සහ මහජනතාවගේ විද්‍යා සාක්ෂරතාව හා ඔවුන් විද්‍යාව හා සම්බන්ධ කාර්යයන්හි නියැළීම වර්ධනය කිරීම.
5. කාර්යසාධනය මත පදනම් වූ සහ ප්‍රතිඵල මූලික කරගත් සහෝපකාරී වැඩ පරිසරයක් තුළ දක්ෂ ශ්‍රම බලකායක් ඇති කිරීම.



පාලන රාමුව

සංවිධාන ව්‍යුහය - ජාතික විද්‍යා පදනම



AO - ගිණුම්කරණ නිලධාරීන්
CS - රහස්‍ය ලේකම්
HRDO - මානව සම්පත් සංවර්ධන නිලධාරි
IA - අභ්‍යන්තර විගණක
IAO - අභ්‍යන්තර විගණන නිලධාරි
IAD - ජාත්‍යන්තර සබඳතා අංශය
IO - තොරතුරු නිලධාරි
ITM - තොරතුරු නිලධාරි කළමණාකරු

JIO - කණිෂ්ඨ තොරතුරු නිලධාරි
JPD - සඟරා ප්‍රකාශන අංශය
LA - පුස්තකල සහායක
MA - කළමනාකරණ සහකාර
NA - ජාල පරිපාලක
NSLRC - ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය
P & TO - ප්‍රසම්පාදන හා ප්‍රවාහන නිලධාරි
PIO - ප්‍රධාන තොරතුරු නිලධාරි

PL - ප්‍රාථමික මට්ටම
PM - මුද්‍රණ කළමණාකරු
PO - මුද්‍රණ නිලධාරි
PSO - ප්‍රධාන විද්‍යාත්මක නිලධාරි
RD - පර්යේෂණ අංශය
SA/ A - ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි/ ගණකාධිකාරි
SAO - ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරි
SIO - ජ්‍යෙෂ්ඨ තොරතුරු නිලධාරි

SO - විද්‍යාත්මක නිලධාරි
SCOD - විද්‍යා සන්නිවේදන හා වාණිජ්‍ය අංශය
SSO - ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරි
STPRD - විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය
TDID - තාක්ෂණ සංවර්ධන හා නවෝත්පාදන අංශය
* - දරන්නාට පුද්ගලික වේ

කළමනාකරණ මණ්ඩලය පිළිබඳ කෙටියෙන්

ජාතික විද්‍යා පදනම පාලනය කරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලයක් මගිනි. සභාපති; අධ්‍යක්ෂ ජනරාල්; විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC), ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS), ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL), ජාතික අධ්‍යාපන ආයතනය (NIE) හා මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් එක් සාමාජිකයෙකු බැගින් සහ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන ගරු ඇමතිතුමන් විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් හතර දෙනෙක් මෙයට ඇතුලත් වේ.



විශ්‍රාමික මහාචාර්ය රංජිත් සේනාරත්න *(2020 ජනවාරි 17 වන දින සිට අද දක්වා)*
සභාපති

දමයන්ති කේ විජේසිංහ මෙය *(2021 පෙබරවාරි 22 සිට අගෝස්තු 03 දක්වා)*
වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක ලේකම්
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය



රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා *(2021 අගෝස්තු 10 වන දින සිට 2022 මාර්තු 10 දක්වා)*
වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක ලේකම්
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය



ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න *(2020 මාර්තු 02 වන දින සිට අද දක්වා)*
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය



ඉංජිනේරු (මහාචාර්ය) එස් බී එස් අබයකෝන් *(2020 ජනවාරි 29 වන දින සිට 2021 සැප්තැම්බර් දක්වා)*
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය
ඉංජිනේරු පීඨය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය



මහාචාර්ය ආනන්ද ජයවර්ධන *(2020 ජූලි 03 වන දින සිට අද දක්වා)*
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය
මොරටුව විශ්වවිද්‍යාලය



ආචාර්ය එන් එන් ජේ නවරත්න *(2020 ජනවාරි 29 වන දින සිට අද දක්වා)*
මහාචාර්ය
මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය
කළමනාකරණ හා මූල්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය



මහාචාර්ය එම් එම් පත්මලාල් *(2020 ජනවාරි 29 වන දින සිට අද දක්වා)*
පීඨාධිපති
උපාධි අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



මහාචාර්ය ජේ කේ ඩී එස් ජයතෙත්ති *(2021 මැයි 12 වන දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා)*
පීඨාධිපති
තාක්ෂණ පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය



ආචාර්ය ලක්ෂ්මන් වෙඩික්කාර *(2020 ජනවාරි 29 වන දින සිට අද දක්වා)*
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සමාජ විද්‍යා අධ්‍යාපන අධ්‍යයනාංශය
අධ්‍යාපන පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය



ආචාර්ය ප්‍රේමසිරි මාපලගම *(2020 ජනවාරි 29 වන දින සිට 2022 මාර්තු 7 දක්වා)*
ව්‍යාධිවේද විශේෂඥ වෛද්‍ය
මහ රෝහල
මාතර



ආර් ජේ ආබ්දීන් මෙය *(2021 මාර්තු 31 වන දින සිට 2022 මාර්තු 01 දක්වා)*
අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

කාර්ය මණ්ඩල ශක්තිය

ජාතික විද්‍යා පදනම ක්‍රියාත්මක වන්නේ 144 ක අනුමත සේවක සංඛ්‍යාවකිනි. ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ තනතුරු සමාලෝචනයක් *1 වන වගුවේද* එය ප්‍රස්තාරිකව *රූප සටහන 1* හිද ඉදිරිපත් කෙරේ.

වගුව 01: කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය

කාණ්ඩය	වර්ෂය					
	2020.12.31 දිනට			2021.12.31 දිනට		
	අනුමත	දැනට සිටින	පුරප්පාඩු	අනුමත	දැනට සිටින	පුරප්පාඩු
HM	10	7	3	10	8	2
AR 2	6	6	-	6	5	1
AR 1	26	21	5	26	19	7
MM	11	11	-	11	9	2
JM	10	5	5	10	4	6
MA	56	48	8	56	47	9
PL	25	19	6	25	18	7
එකතුව	**144**	**124**	**20**	**144**	**110**	**34**



රූප සටහන 01: 2021 වසරේ අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව සිටි කාර්ය මණ්ඩලය

2021 දෙසැම්බර් 31 වන දිනට ජාතික විද්‍යා පදනමේ ප්‍රධාන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු *ඇමුණුම 1* හි දැක්වේ.

පෙර වසර 10ට අදාළ මූල්‍ය හා සම්බන්ධ සුවිශේෂී කරුණු

ජාතික විද්‍යා පදනම සියළුම මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ වාර්තා තබා ගන්නා අතර විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සංවර්ධනය සඳහා වන ප්‍රමුඛතා ක්ෂේත්‍රවල වඩාත් යහපත් ආයෝජනයක් සඳහා එවැනි වාර්තා නිතර සමාලෝචනය කරයි. මේ අනුව, ඔබේ පාරිභෝගිකයා දැනගැනීම (Know Your Customer) ප්‍රතිමානයන්ට අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාව එමගින් සිහි ගන්වයි. පිටු අංක 74 සහ 75 හි දක්වා ඇති තොරතුරු සමඟ මෙම විශ්ලේෂණය මගින් ජාතික විද්‍යා පදනමේ වත්මන් සහ අනාගත මූල්‍ය සෞඛ්‍යය ඉදිරිපත් කෙරේ.

පෙර වසර 10 සඳහා වූ ආයෝජන 02 වගුවේ සහ *රූප සටහන 02, 03* සහ *04* හි දක්වා ඇත.

වගුව 02: පෙර වසර දහය සඳහා මූල්‍ය සමාලෝචනය

වර්ෂය	මූල්‍ය තොරතුරු (රුපියල් මිලියන)		
	වෙන් කළ මුදල	ලද අරමුදල	වැය කළ මුදල
2011	300	110.7	154.95
2012	283	157.4	168.3
2013	250	135	140
2014	260	223	211
2015	290	235	246
2016	250	232	237
2017	260	243	259.97
2018	300	283	308
2019	342.32	307.19	277.51
2020	59	59	82.07



රූප සටහන 02: වෙන් කළ මුදලට සාපේක්ෂව මූල්‍ය තත්වය ප්‍රතිශතයක් වශයෙන්



රූප සටහන 03: ප්‍රධාන වැඩසටහන් යටතේ වැය කළ මුදල



රූප සටහන 04: ප්‍රධාන වැඩසටහන් යටතේ වැය කළ මුදල වෙන් කළ මුළු මුදලින් ප්‍රතිශතයක් වශයෙන්

- විද්‍යාත්මක පර්යේෂණ විභවය ශක්තිමත් කිරීම
- විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ සිදු කිරීම
- විද්‍යා හා තාක්ෂණ තොරතුරු සඳහා ජාතික පිවිසුම් මගක් නිර්මාණය කිරීම
- විද්‍යාව ප්‍රචලිත කිරීම
- ධාරිතා සංවර්ධනය සහ ජාත්‍යන්තර සහයෝගිතාව
- සම්පත් වැඩි දියුණු කිරීම සහ පද්ධති පරිපාලනය

ජාතික විද්‍යා පදනමේ බාහිර සම්පත් සංචිතය

සිය ආයතනය විසින් ප්‍රවර්ධනය කරන ලද විද්‍යාත්මක පර්යේෂණ මූලාරම්භයන්ගේ දිශානතිය නැවත මෙහෙයවීමේ හදිසි අවශ්‍යතාව හේතුවෙන් ජාතික විද්‍යා පදනම, 2021 වසරේදී පර්යේෂණ ශාඛාව සහ තාක්ෂණ සංවර්ධන හා නවෝත්පාදන ශාඛාව පිහිටුවන ලදී. කර්මාන්ත හා නිෂ්පාදන සංවර්ධන රාමුවේ පවතින පරතරයන් පිරවීම සඳහා සපුරාලිය යුතු ජාතික ප්‍රමුඛතා පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමට මෙම මූලාරම්භය මඟින් හැකියාව ලැබෙනු ඇත. ප්‍රදාන පිරිනැමීම හරහා කරන ලද ආයෝජනවල ආර්ථික ප්‍රතිලාභ සහතික කිරීම මෙහි අවසාන අරමුණ විය. රටෙහි පවතින හොඳම විද්‍යාත්මක සම්පත් උපයෝගී කර ගනිමින් "සෞභාග්‍යයේ දැක්ම" තුළ දක්වා ඇති රජයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ඒවා යොමු කරනු ඇත. මෙම පරිවර්තනීය වෙනස බහුවිධ ක්ෂේත්‍ර මුල් කොටගත් ප්‍රවේශයන් අවධාරණය කරමින් දේශීය පර්යේෂණවල නව ප්‍රවණතා පෝෂණය කරනු ඇතැයි විශ්වාස කෙරේ, විශේෂයෙන් නවෝත්පාදන සංස්කෘතියක් ස්ථාපිත කිරීම, පරිවර්තී පර්යේෂණ සහ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් පෝෂණය කරන අතරම කර්මාන්ත වර්ධනය සමඟ පිරිවැය ඵලදායී හා කාර්යක්ෂම නිෂ්පාදන සංවර්ධනය යනාදිය කෙරෙහි එහිදී විශේෂ අවධානය යොමු කෙරෙනු ඇත.

මෙම ක්‍රියාවලියට උපකාර කිරීම සඳහා පහත කමිටු, කර්තෘ මණ්ඩල සහ ක්‍රියාකාරී කණ්ඩායම් ද පිහිටුවන ලදී.

1. කෘෂිකර්ම අංශයේ පර්යේෂණ හා සංවර්ධන මෙහෙයුම් කමිටුව
2. ඉංජිනේරු සේවා සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන මෙහෙයුම් කමිටුව
3. ධීවර හා ජලජීවී වගා අංශයේ පර්යේෂණ සහ සංවර්ධන මෙහෙයුම් කමිටුව
4. පිරිවැය-කාර්යක්ෂම බලශක්ති ප්‍රභවයන් සහ ගබඩා කිරීම පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන මෙහෙයුම් කමිටුව
5. තොරතුරු තාක්ෂණය සහ සේවාවන් පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන මෙහෙයුම් කමිටුව
6. සෞඛ්‍ය ආරක්ෂණ නවෝත්පාදන පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන මෙහෙයුම් කමිටුව
7. ජලය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන මෙහෙයුම් කමිටුව
8. පරිසරය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන මෙහෙයුම් කමිටුව
9. සමාජ නවෝත්පාදන පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන මෙහෙයුම් කමිටුව
10. ජාතික විද්‍යා පදනම් සඟරාවේ කර්තෘ මණ්ඩලය
11. ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ කර්තෘ මණ්ඩලය
12. විද්‍යා සහ තාක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
13. විද්‍යාව ප්‍රචලිත කිරීම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
14. වෙළඳපොළට ඇතුළු වන ඔසු නිෂ්පාදනවල තත්ත්ව පාලනය සහ තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
15. ආහාර සුරක්ෂිතතාව සහ ආහාර වලින් ඇති විය හැකි සෞඛ්‍ය අවදානම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
16. තත්ත්ව ආරක්ෂණය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
17. පාර්ශවකරුවන් සමඟ ජාතික නවෝත්පාදන පරිසර පද්ධති සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
18. උපකරණ දත්ත පද්ධතියක් සම්පාදනය කිරීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
19. University Business Link Cells සමඟ සහයෝගීතාව පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
20. ධාරිතා සංවර්ධනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම
21. මිනිසා සහ පෙවගෝලය පිළිබඳ ජාතික කමිටුව





සභාපතිවරයාගේ සමාලෝචනය

සමාජ-ආර්ථික සංවර්ධනය උදෙසා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමේ කාර්යභාරය පැවරී තිබෙන ප්‍රමුඛතම ජාතික ආයතනය වන ජාතික විද්‍යා පදනමේ 2021 වාර්ෂික වාර්තාව වෙත මෙම පණිවිඩය මා එක් කරනුයේ ඉමහත් සතුටිනි. 1968 වසරේදී ආරම්භ කරන ලද අප ආයතනය, විද්‍යාව හා තාක්ෂණය ප්‍රවර්ධනය, පර්යේෂණ හා සංවර්ධන ආයතනවල හා විද්වත් පරිසරය හා ප්‍රජාවේ ධාරිතා සංවර්ධනය සහ නිපුණතා වැඩි දියුණු කිරීම, විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සහ මහජනයාගේ විද්‍යාත්මක සාක්ෂරතාවය ඉහළ නැංවීම ඇතුළු පුළුල් පරාසයක ආයෝජන සහ මැදිහත්වීම් හරහා ජාතික සංවර්ධනයට කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත.

ලෝකය නිරන්තරයෙන් වෙනස්කම්වලට භාජනය වෙමින් පවතින අතර ආර්ථික, තාක්ෂණික, පාරිසරික, සමාජීය හා දේශපාලන තත්වය ප්‍රගතියට පත්වෙමින් හා වේගයෙන් වෙනස් වෙමින් පවතින අතර වෙළඳපලවල් වඩ වඩාත් තරඟකාරී, නවීන සහ ගෝලීයකරණය වූ තත්වයට පත් වෙමින් පවතී. ඊට අමතරව, මුළු ලෝකයම කොවිඩ්-19 වසංගතය සහ වෙනත් අහිතකර බලපෑම් හමුවේ කම්පනයට පත් වී ඇත. මෙම තීරණාත්මක අවධිය තුළ, ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ තිඹිරිගෙය වන ජාතික විද්‍යා පදනමට එහි බලපෑම අවම කිරීමේ ලා සහ ශක්තිමත් හා ප්‍රත්‍යාස්ථ ආර්ථිකයක් ගොඩනැගීමේ ලා ප්‍රධාන භූමිකාවක් ඉටු කිරීමට තිබේ.

මෙම වාතාවරණය තුළ, එම වෙනස්වීම්වලට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ජාතික විද්‍යා පදනම එහි ආයෝජන පරාසය හා අරමුදල් සැපයීමේ ප්‍රමුඛතා සමාලෝචනය කිරීමේ සහ ඒ දෙස නව දෘෂ්ටි කෝණයකින් බැලීමේ ක්‍රියාවලියක නිරතව සිටින අතර නව මුල පිරීම් ආරම්භ කිරීමේ කාර්යයේ යෙදී සිටී ජාතික සංවර්ධනය උදෙසා විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකීය විද්‍යාත්මක ප්‍රජාවේ සහ වෘත්තීයවේදීන්ගේ සේවය ලබා ගැනීම සඳහා ඩිජිටල් වේදිකාවක් ස්ථාපිත කිරීම, ධනය උත්පාදනය සඳහා උපාය මාර්ගික රාජ්‍ය- පුද්ගලික හවුල්කාරිත්වයන් ගොඩනැගීම සහ එන්නත් නිෂ්පාදනය සඳහා ධාරිතාව ගොඩනැගීම ඉලක්ක කරගත් වැඩසටහනක් ආරම්භ කිරීම යනාදිය මෙහිදී කැපී පෙනෙන මැදිහත්වීම් වේ.

වසංගතයක් පවතින තත්වයක් තුළ, හදිසි සහ වැදගත් තරඟකාරී ඉල්ලීම් හේතුවෙන් අරමුදල් ලබා ගැනීම දුෂ්කර වේ කෙසේ වෙතත්, මනා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් තිබේ නම්, ඩිජිටල් තාක්ෂණයන්හි දියුණුව, මූල්‍ය සම්පත් සීමිත වූ අවධියක පවා ප්‍රගතිය සහ සංවර්ධනය සඳහා අවස්ථා බොහෝ ප්‍රමාණයක් පිරිනමයි.

විද්‍යාව හා තාක්ෂණය යනු ආර්ථික සංවර්ධනයේ මූලික ධාවකයකි. එබැවින්, පොදු යහපත උදෙසා විද්‍යාව හා තාක්ෂණයේ අභිප්‍රාය ඉදිරියට ගෙන යාමට සිය ආයතනය දරන උත්සාහය වඩාත් බලවත් කිරීමට ජාතික විද්‍යා පදනම කටයුතු කරනු ඇති අතර එමගින් ජාතික විද්‍යා පදනම ශ්‍රී ලංකාව සංවර්ධිත දේශයක් බවට පරිවර්තනය කිරීමේ උපායමාර්ගික හවුල්කරුවෙකු සහ ගතික බලවේගයක් බවට පත් වනු ඇත.

මහාචාර්ය රංජිත් සේනාරත්න
සභාපති
ජාතික විද්‍යා පදනම



අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය

පෙර වසරවල් හා සමානව, 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් බල ගැන්වූ බලතල පහ යටතේ සිදු කරන ලද වැඩසටහන් ගණනාවකින් 2021 වසර පිරී තිබුණි. පැහැදිලි දැක්මක් සහ අවධානයක් ඇතිව එහි ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් 99.93%ක් ප්‍රයෝජනයට ගනිමින් ජාතික විද්‍යා පදනම තිරසර සංවර්ධන ඉලක්ක සහ ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛතා අනුව කටයුතු කරමින් සිය මෙහෙවර ඉදිරියට ගෙන ගියේය. ප්‍රධාන ජයග්‍රහණ සමඟ ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව අත්කරගත් ප්‍රගතිය මතු කර දක්වන සාරාංශයක් සමාලෝචනයේ අඩංගු වන අතර ඉන් අනතුරුව ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති කාර්යභාරයන්ට අනුව සිදු කරන ලද කාර්යයන් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් වේ.

පෙර වසරවල ක්‍රියාකාරකම් මත පදනම්ව ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සාක්ෂාත් කර ගනිමින් වැඩිවන නිමැවුම් සහ ප්‍රතිඵල ලබා දීම අපගේ අරමුණයි අපගේ අනාගත දිශානතිය වනුයේ පර්යේෂණ වැඩි ප්‍රමාණයක් සඳහා පහසුකම් සැලසීම, ශක්තිමත් කරන ලද සහයෝගීතා ක්‍රියාකාරකම් හරහා ධාරිතා සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කළ ක්‍රමවේදයන් හා ක්‍රියාවලීන් හරහා රටේ ප්‍රධාන පාර්ශවකරුවන් සහ ජනතාව අතර නිමැවුම් ප්‍රචලිත කිරීම මගින් ජාතික විද්‍යා පදනමේ කාර්ය සාධනය ඉහළ නැංවීමයි. මෙම අරමුණ ඇතිව, පවතින යෝජනා ක්‍රම සහ වැඩසටහන් ඵලදායීතාවය සඳහා නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කිරීම, වැඩි බලපෑමක් ඇති කිරීමේ අරමුණින් අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

ජාතික විද්‍යා පදනමේ කාර්යභාරය ඉටු කිරීමේදී ලබාදුන් මග පෙන්වීම වෙනුවෙන් ජාතික විද්‍යා පදනමේ සභාපතිවරයා සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වෙතත්, සම්පත් සීමාවීම් මධ්‍යයේ වුවද ආයතනයේ අවශ්‍යතා කාර්යක්ෂම ලෙස ඉටු කරමින් දැක්වූ කැපවීම වෙනුවෙන් අප ආයතනයේ ඉහළම ශක්තිය වන ජාතික විද්‍යා පදනම් කණ්ඩායම වෙතත් මාගේ අවංක කෘතඥතාව හා ප්‍රශංසාව පුදු කර සිටිමි.

ආචාර්ය සේපාලිකා සුදසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

සාරාංශය සහ සුවිශේෂී කරුණු

පහත ඉදිරිපත් කෙරෙන්නේ 2021 වසරේ ජාතික විද්‍යා පදනමේ කාර්යසාධනය හා සම්බන්ධ විශේෂ කරුණුය.

- 2021 වසරේ භෞතික කාර්ය සාධනය සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්වලට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස *රූප සටහන 05* සහ *06* හි දක්වා ඇති ජාතික ප්‍රතිපත්ති රාමුවේ දැක්වෙන ප්‍රමුඛතා සමඟ ජාතික විද්‍යා පදනමේ කාර්යයන් සම්බන්ධ වන ආකාරය *වගුව 03* මඟින් ඉදිරිපත් කෙරේ. 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ දක්වා ඇති පරිදි කාර්යයන් ඉටු කිරීම සඳහා මුළු ප්‍රතිපාදන වූ රුපියල් මිලියන 67.897ක ප්‍රමාණයම පාහේ වැය කිරීමට ජාතික විද්‍යා පදනමට හැකි විය. ජාතික විද්‍යා පදනමේ කාර්යයන් ඉටු කරමින් වර්ෂය තුළ අත්කරගත් මූල්‍ය ප්‍රගතිය *රූප සටහන 07* හි ප්‍රස්තාරීයව ඉදිරිපත් කෙරේ.



රූප සටහන 05: ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛතා අනුව 2021 වසරේ භෞතික කාර්යසාධනය

* සංශෝධනය සිදු කිරීමේදී මෙම ක්‍රියාකාරකම ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කරන ලදී.



රූප සටහන 06: ජාතික විද්‍යා පදනමේ කාර්යයන්ට අනුව 2021 වසරේ භෞතික කාර්යසාධනය

වගුව 03: ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති කාර්යභාරය ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛතා සමග ගැලපීම

ජාතික විද්‍යා පදනමේ කාර්යයන්	ජාතික ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛතා
පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය	ප්‍රමුඛතාව 1, ප්‍රමුඛතාව 2, ප්‍රමුඛතාව 4, ප්‍රමුඛතාව 5, ප්‍රමුඛතාව 8, ප්‍රමුඛතාව 9
විද්‍යා හා තාක්ෂණ තොරතුරු ප්‍රචාරණය	ප්‍රමුඛතාව 1 , ප්‍රමුඛතාව 6, ප්‍රමුඛතාව 7
විද්‍යා හා තාක්ෂණ ධාරිතා සංවර්ධනය	ප්‍රමුඛතාව 3
විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ	ප්‍රමුඛතාව 1
විද්‍යාව ප්‍රචලිත කිරීම	ප්‍රමුඛතාව 1, ප්‍රමුඛතාව 6, ප්‍රමුඛතාව 7
යහ පාලනය සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම	ප්‍රමුඛතාව 10



රූප සටහන 07: 2021 වසරේ මූල්‍ය කාර්යසාධනය

ජාතික විද්‍යා පදනම විසින් ප්‍රදාන හරහා සහ රූප සටහන 08 හි දැක්වෙන පරිදි සේවා සැපයීමෙන් සුළු ආදායමක් උපයා ගන්නා ලදී.



රූප සටහන 08: ආයතන සහ ප්‍රජාව වෙත සේවා සැපයීමෙන් ඉපැයූ ආදායම

- සිදු කෙරීගෙන යන පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති වලින් බිහි වන ප්‍රධාන නිමැවුම් පිළිබඳ විශ්ලේෂණය *රූප සටහන 09 සහ 10* හි දක්වා ඇති විවිධ අංශ අතර පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ව්‍යාප්ත වී ඇති ආකාරය *රූප සටහන 11* හි ඉදිරිපත් කර ඇත.



රූප සටහන 09: ක්‍රියාත්මක වෙමින් පවතින පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති: විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය උදෙසා දායකත්වය විශ්ලේෂණය



රූප සටහන 10: සිදු කෙරීගෙන යන ප්‍රධාන තුළින් අපේක්ෂිත ප්‍රධාන නිෂ්පාදන



රූප සටහන 11: පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති ආයතන අතර ව්‍යාප්ත වී ඇති ආකාරය

• ජාතික විද්‍යා පදනම විසින් සියලුම ක්‍රියාකාරකම් යටතේ වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන් *රූප සටහන 12* හි දැක්වේ.



රූප සටහන 12: 2021 වසරේදී සිදු කරන ලද කාර්යයන්

• ජාතික සංවර්ධනය සඳහා ගෝලීය කුසලතා සංචිතය යොදා ගැනීමේ සුවිශේෂී අරමුණ ඇතිව විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික වෘත්තිකයන්ගෙන් සමන්විත ඩිජිටල් වේදිකාවක් පිහිටුවීමේ ක්‍රියාවලියක් ජාතික විද්‍යා පදනම විසින් ආරම්භ කරන ලදී.



මෙම ප්‍රයත්නයේ අනෙකුත් අරමුණු වනුයේ:

1. උසස් අධ්‍යාපනය සහ ධාරිතා සංවර්ධනය සඳහා වඩාත් උසස් මට්ටමේ අවස්ථා සැපයීම.
2. විද්වතුන් අතර සහයෝගීතාව සහ පර්යේෂණ සහයෝගීතාව වැඩි දියුණු කිරීම.
3. නිර්මාණශීලීත්ව හා නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම.
4. ඒකාබද්ධ ප්‍රකාශන ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාලවල ශ්‍රේණිගත මට්ටම ඉහළ දැමීම සහ
5. තාක්ෂණ හුවමාරුව සඳහා පහසුකම් සැලසීම.

මෙම ඩිජිටල් වේදිකාවෙහි පසු අන්තය (back end) සමන්විත වනුයේ සංවර්ධිත ආර්ථිකයන්, එනම් උතුරු ඇමරිකාව, යුරෝපය, ඕෂනියාව සහ ආසියාවේ වෙසෙන කීර්තිමත් ශ්‍රී ලාංකිකයින් 800 කට අධික සංඛ්‍යාවකගේ දත්ත පද්ධතියකිනි. විදේශයන්හි වෙසෙන මෙම ශ්‍රී ලාංකික වෘත්තිකයින්ගේ පදනම ජීව විද්‍යාවන්, සමාජ විද්‍යාව/මානව ශාස්ත්‍ර, තොරතුරු/දත්ත විද්‍යාව, කළමනාකරණය, ඉංජිනේරු විද්‍යාව, පාරිසරික විද්‍යාව වැනි විෂයය ක්ෂේත්‍රයන්හි සිට නැනෝතාක්ෂණය, කෘත්‍රිම බුද්ධිය, IoT, VR/AR/MR සහ රොබෝ විද්‍යාව වැනි නැගී එන විෂයාන්තර විද්‍යාවන් දක්වා පුළුල් පරාසයක විහිදේ. දත්ත පද්ධතියේ ඇති වාර්තා සංඛ්‍යාව ඉහළ නැංවීමට ජාතික විද්‍යා පදනම අඛණ්ඩ උත්සාහයක නිරත වේ. ශ්‍රී ලංකා මෘදුකාංග සහ සේවා සමාගම් සංගමය (SLASSCOM) මෙම ඩිජිටල් වේදිකාව සැලසුම් කිරීම සහ ගොඩනැගීම සඳහා නොමසුරුව සහාය ලබා දුන්නේය. වේදිකාව නිර්මාණය කිරීම අවසන් කර ඇති අතර, 2021 වසර අවසානය වන විට සියුම් සුසරකරණය සිදු කෙරෙමින් පැවතුණි.

- 2020 වසරේදී "කොවිඩ් 19: එහි බලපෑම, එහි බලපෑම් අවම කිරීම, අවස්ථා සහ ප්‍රත්‍යාස්ථීය ගොඩනැගීම" යන මැයෙන් වූ දෙදින ජාතික සමුළුවට අදාළ සියලු සූදානම් කිරීමේ කටයුතු අවසන් කර, සමුළුව 2021 ජනවාරි 27 සිට 28 දක්වා බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී දෙමුහුන් ආකෘතියට අනුව තාක්ෂණික සැසි තුනක් සමගින් සාර්ථකව පැවැත්විණි. ශ්‍රී ලාංකීය සම්භවයක් ඇති ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් උසුලන විද්‍යාඥයින් වන ආසියාවේ මහාචාර්ය මලික් පීරිස්, යුරෝපයේ මහාචාර්ය ශාන්ති මෙන්ඩිස්, උතුරු ඇමරිකාවේ මහාචාර්ය ඩිලන්ත ප්‍රනාන්දු, ඕෂනියාවේ මහාචාර්ය රයිනා මැකින්ටයර්, අප්‍රිකාවේ ආචාර්ය මහේෂ් නිර්මලන් සහ විදේශ සම්පත්දායකයෙකු වන ආචාර්ය ස්ටීවන් හොෆ්මන් කොවිඩ් වෛරසයට එරෙහිව සටන් කිරීමේ ලා ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම් මෙම සම්මන්ත්‍රණයේදී බෙදාහදා ගත්හ'



- ජාතික විද්‍යා පදනම විසින් අධ්‍යාපන අමාත්‍ය මහාචාර්ය ජී එල් පීරිස් මහතාගේ සම්භාවනීය අනුග්‍රහය යටතේ 2021 ජූලි 30 වැනි දින බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී "කොවිඩ්-19 : එහි බලපෑම, එහි බලපෑම් අවම කිරීම, අවස්ථා සහ ප්‍රත්‍යාස්ථීය ගොඩ නැගීම" යන මැයෙන් සුවිශේෂී ප්‍රකාශනයක් දියත් කරන ලදී. ජාතික විද්‍යා පදනමේ සභාපති මහාචාර්ය රංජිත් සේනාරත්න, එක්සත් රාජධානියේ Huddersdfield විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඩිලන්ති අමරතුංග, ස්විට්සර්ලන්තයේ ජිනීවාහි ලෝක සෞඛ්‍ය සංවිධානයේ හිටපු ජ්‍යෙෂ්ඨ උපදේශක මහාචාර්ය ශාන්ති මෙන්ඩිස් සහ ඕස්ට්‍රේලියාවේ කැන්බරාහි ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ප්‍රේමා-චන්ද්‍ර අතුකෝරළ විසින් සංස්කරණය කරන ලදල බහුවිධ විෂයය ක්ෂේත්‍ර ආවරණය කෙරෙන මෙම කලාපය ආසන්න වශයෙන් පිටු 800ක් හා පත්‍රිකා 65කින් සමන්විත වේ.



මෙම ග්‍රන්ථය ජාතික විද්‍යා පදනම විසින් CC BY-NC-ND (Attribution-Non Commercial-No Derivs) Creative Commons බලපත්‍රය යටතේ ප්‍රකාශයට පත් කර ඇත.

- ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) විසින් සංවිධානය කරන ලද 2019 හොඳම වාර්ෂික වාර්තාව සහ ගිණුම් සම්මාන උළෙලේදී ජාතික විද්‍යා පදනම "පර්යේෂණ ආයතන" කාණ්ඩය යටතේ, "ලෝකඩ සම්මානය" දිනා ගත්තේය.



- 2021 වසර ආරම්භයේදී ජාතික විද්‍යා පදනම 117 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් ක්‍රියාත්මක වූ අතර 2021 දෙසැම්බර් 31 වන විට එම සංඛ්‍යාව 110 දක්වා අඩු විය.



රූප සටහන 13: ආයතන සහ ප්‍රජාව වෙත සේවා සැපයීමෙන් ඉපැයූ ආදායම

ජාතික විද්‍යා පදනම විසින් ඉටු කරනු ලබන කාර්යයන් තිරසර සංවර්ධන ඉලක්ක සහ සෞභාග්‍යයේ දැක්ම, ජාතික ප්‍රතිපත්ති රාමුව සමග ගැලපීම

පෙර වසරවල මෙන්ම, ක්‍රියාකාරී සැලැස්ම තුළ තිරසර සංවර්ධන ඉලක්ක කෙරෙහි අවධානය පැහැදිලි කර ඇත්තේ, මහජනතාවට ඔවුන්ගේ ජීවිත තුළ විද්‍යා හා තාක්ෂණ යෙදුම් සඳහා වඩාත් ප්‍රවේශ විය හැකි තත්වයක් උදා කර දෙමින් විවිධ විද්‍යාත්මක විෂය ක්ෂේත්‍රවල නිර්මාණශීලිත්ව සහ විද්‍යා හා තාක්ෂණ සංස්කෘතිය උත්තේජනය කිරීම හරහා අන්ත දරිද්‍රතාවය තුරන් කිරීමට දායක වීම අරමුණු කරගනිමිනි. ජාතික ප්‍රතිපත්ති රාමුවේ දක්වා ඇති ප්‍රතිපත්ති දහයද මේ සඳහා යොදා ගෙන ඇත්තේ දළ *රූප සටහන 01* හි දක්වා ඇති පරිදි එම අරමුණු සමඟ අදහස් කරන ලදී.



දළ රූප සටහන 01 : ජාතික විද්‍යා පදනම විසින් ඉටු කරනු ලබන කාර්යයන් ජාතික ප්‍රතිපත්ති රාමුව සහ තිරසර සංවර්ධන ඉලක්ක සමඟ ගැලපීම.

Action plan with KPIs

ප්‍රමුඛතා ක්ෂේත්‍රය ‹ජාතික ප්‍රතිපත්ති රාමුව සඳහා යොමුව›	ව්‍යාපෘතිය/වැඩසටහන	ප්‍රතිපාදන 2021 (රු.මි)	නිමැවුම	ප්‍රතිඵලය	ප්‍රධාන කාර්යසාධන දර්ශකය (KPI)
	ජාතික විද්‍යා පදනම්ව පැවරී ඇති කාර්යය ඇ) පර්යේෂණ හා සංවර්ධන පවර්ධනය				
ප්‍රමුඛතා 1 (ඊලඟ: 50), ප්‍රමුඛතා 2(ඊලඟ: 40), ප්‍රමුඛතා 3(ඊලඟ: 40), ප්‍රමුඛතා 5(ඊලඟ: 40), ප්‍රමුඛතා 6(ඊලඟ: 40, ප්‍රමුඛතා 7(ඊලඟ: 20), ප්‍රමුඛතා 8(ඊලඟ: 39), ප්‍රමුඛතා 9(ඊලඟ: 21), ප්‍රමුඛතා10(ඊලඟ: 28)	නවෝත්පාදන පාදක ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ඇරඹීම (පාසල්-තරුණ තරුණියන් ප්‍රජාව වෙතින්)	67.8969	*නවෝත්පාදන/ වාණිජ්කරණය සහ ව්‍යවසායකත්වය පාදක වැඩසටහන් - 10	*නවෝත්පාදන බිහි කිරීම සඳහා පෙලඹුණු ප්‍රජාව පාදක කොටගත් ව්‍යවසායකත්වය	*රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයන් 10ක් පිහිටුවන ලදී
	ජාතික විශ්ලේෂණ සහ පරීක්ෂණ මධ්‍යස්ථානය /පහසුකම පිහිටුවීම		*විස්තිරණ සෙවුම් කළ හැකි දත්ත පද්ධතිය - 01 *අවසන් සමීක්ෂණ වාර්තාව * ජාතික විශ්ලේෂණ සහ පරීක්ෂණ මධ්‍යස්ථානය /පහසුකම පිහිටුවීම් සඳහා සකස් කර ඇති යෝජනාවක්	*අඩු වියදමකින් සහ කඩිනමින් පරීක්ෂණ සිදු කිරීමේ පහසුකම ලැබීම	*සකස් කරන ලද දත්ත පද්ධති සංඛ්‍යාව (01) *සමීක්ෂණ වාර්තා සංඛ්‍යාව (01) *සකස් කරන ලද යෝජනා සංඛ්‍යාව (01)
	නවෝත්පාදන, අලුතින් පිහිට වූ ව්‍යාපාර, වාණිජ්කරණය සහ සන්නාමකරණයට අදාළ ක්‍රියාකාරකම්		* වාණිජ්කරණයට ලක් කළ ව්‍යාපෘති සංඛ්‍යාව සහ අරමුදල් නිදහස් කිරීම් ප්‍රමාණය. *නව ව්‍යාපාර අදහස් ඉදිරිපත් කරන අවස්ථා වෙතින් ප්‍රතිලාභ ලද නව නිපැයුම්කරුවන් සංඛ්‍යාව	* ජාතික ආර්ථිකයට දායකත්වය. * නව නිපැයුම්කරුවන්ට සිය නිෂ්පාදන වැඩි දියුණු කරගැනීම සඳහා අවස්ථා නිර්මාණය කිරීම.	* වාණිජ්කරණය සඳහා අරමුදල් සපයන ලද නාක්ෂණ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව. *UBLCs සමග සංවිධානය කරන ලද නව ව්‍යාපාර අදහස් ඉදිරිපත් කරන අවස්ථා.
	ව්‍යවසායකයින් පුහුණු කිරීම සහ ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය		* නව නිපැයුම්කරුවන් සඳහා පවත්වන ලද අන්තර්ක්‍රියාකාරී දැනුම හුවමාරු සැසි සංඛ්‍යාව. * පුහුණු කරන ලද නව නිපැයුම්කරුවන් සංඛ්‍යාව.	* නව නිපැයුම්කරුවන් සඳහා නිපුණතා සංවර්ධනය.	* නව නිපැයුම්කරුවන් සඳහා පවත්වන ලද අන්තර්ක්‍රියාකාරී දැනුම හුවමාරු සැසි සංඛ්‍යාව. * පුහුණු කරන ලද නව නිපැයුම්කරුවන් සංඛ්‍යාව.
	ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය (NCE) සමග හවුල්කාරීත්ව ව්‍යාපෘතිය		* දේශීය /විදේශීය විශ්වවිද්‍යාල සමග අපනයන අංශයේ ව්‍යවසායන් පිහිටුවීමේ සබැඳි (02)	* අපනයන වෙළඳපොල සඳහා අගය එකතු කළ භෝ නව නිෂ්පාදන සංවර්ධනය කිරීම	*පිහිටුවන ලද සබැඳි සංඛ්‍යාව (02) * සහාය ලබාදෙන ලද නව නිෂ්පාදන සංවර්ධන සංඛ්‍යාව (02)
	පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම සඳහා ස්වයංක්‍රීය පද්ධතිය (ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සමග)		* පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය තුළින් සහාය ලබාදෙන ලද නව නිපැයුම්කරුවන් සංඛ්‍යාව * ධාරිතා සංවර්ධනය කරන ලද අභ්‍යන්තර කාර්ය මණ්ඩල සමාජිකයින් සංඛ්‍යාව	* පේටන්ට් බලපත්‍ර ඉල්ලා සිටින ආකාරය /තොරතුරු සෙවීම පිළිබඳ ඉහළ නංවන ලද දැනුවත්භාවය.	* සිදු කරන ලද පේටන්ට් තොරතුරු සෙවීම් සංඛ්‍යාව * සපයන ලද උපදේශන සේවා සංඛ්‍යාව * සපයන ලද සෙවුම් වාර්තා සංඛ්‍යාව - 03. * පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව.
	ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයනු ලබන සාර්ථක ව්‍යාපෘතියක් සඳහා නව ව්‍යාපාරයක් පිහිටුවීමට පහසුකම් සැලසීම		*ජාතික විද්‍යා පදනමේ ප්‍රදානයක් මගින් බිහි වූ නිමැවුමක් මුල්කොට නව ව්‍යාපාරයක් පිහිටුවීම	* ධනය ඉපැයීම සඳහා විද්‍යා හා තාක්ෂණ අංශයේ දායකත්වය * බිත්ති බැඳීමේ තාක්ෂණයට තිරසර විකල්පයක් සහිත දේශීය වෙළඳපොල * දේශීය ප්‍රජාව පුහුණු කිරීම මගින් දේශීය ව්‍යවසායකයින් නිර්මාණය කිරීමේ අවස්ථා	* පිහිටුවන ලද නව ව්‍යාපාර සංඛ්‍යාව * පුහුණු කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව * නිර්මාණය කරන ලද දේශීය ව්‍යවසායකයින් සංඛ්‍යාව
	ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධනයේ පර්යේෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා සහභාගීත්ව ප්‍රවේශයන් හඳුනාගැනීම සහ සැලසීම		*සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ පර්යේෂණ අවශ්‍යතා හඳුනාගැනීම	*අදාළ පාර්ශව සම්බන්ධීකරණය කිරීම මගින් හඳුනාගත් ගැටළු සඳහා විසඳුම් සැපයීම	*බහික් නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීම. * පළමු පියවර වශයෙන් බස්නාහිර පළාතේ බහික් නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් වෙතින් එක් රැස් කරන ලද තොරතුරු. * බහික් අංශයේ තත්ව සහතිකකරණ යෝජනා ක්‍රමය සඳහා පරාමිතීන් හඳුනාගැනීම
	පුද්ගලික අංශය සමග හවුල්කාරීත්ව ව්‍යාපෘති		* දේශීය වෙළඳපොලට ඇතුළු වන ජාතික විද්‍යා පදනමේ ප්‍රදාන නිමැවුම්	* ධනය ඉපැයීම සඳහා විද්‍යා හා තාක්ෂණ අංශයේ දායකත්වය * අගය එකතු කළ නිෂ්පාදනවලින් සපිරුණු දේශීය වෙළඳපොල	* දේශීය වෙළඳපොලට ඇතුළු වන ජාතික විද්‍යා පදනමේ ප්‍රදාන නිමැවුම් සංඛ්‍යාව * පහසුකම් සලසන ලද තාක්ෂණ හුවමාරු සංඛ්‍යාව
	විද්‍යාත්මක පර්යේෂණ විභවතාව ශක්තිමත් කිරීමේ වැඩසටහන අඛණ්ඩව සිදු කිරීම		*සඟරා ප්‍රකාශන සංඛ්‍යාව - 15 *සන්නිවේදන සංඛ්‍යාව - 30	*ශක්තිමත් කරන ලද පර්යේෂණ හා සංවර්ධන විභවතාව, ස්වභාවික සම්පත්වලට අගය එකතු කිරීම සහ අඩු කරන ලද අලාභ හා සාරවත් කරන ලද /නගා සිටුවන ලද පුද්ගල සුභසාධනය	*සංවර්ධනය සඳහා දායක වූ ව්‍යාපෘති සංඛ්‍යාව
	තාක්ෂණ සංවර්ධන ප්‍රදාන සහ කොවිඩ් 19 ප්‍රදාන				
	විද්‍යා හා තාක්ෂණ විශිෂ්ටත්වය සම්භාවනාවට පාත්‍ර කිරීම		* නිසි කලට හා සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ ප්‍රදාන සහ පශ්චාත් උපාධි – 10	*අභිප්‍රේරණය කරන ලද තරුණ පර්යේෂකයන් සහ විද්‍යාඥයන්	* සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය වෙනුවෙන් වූ සම්මාන ගණන
	තත්ත්ව ආරක්ෂණය		* යෝජිත තත්ත්ව ආරක්ෂණය ක්‍රියාවට නැංවීම සඳහා සැලසුම. * තත්ත්ව ආරක්ෂණය ක්‍රියාවට නැංවීම පිළිබඳ වාර්තාව.	* ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල තත්ත්ව ආරක්ෂණය.	*තත්ත්ව සංවේදක සමග වාණිජ්කරණය සඳහා හඳුනාගන්නා ලද ව්‍යාපෘති සංඛ්‍යාව. *තත්ත්ව ආරක්ෂණය සහතික කරන ව්‍යාපෘති සංඛ්‍යාව.
	ආයුර්වේද ඖෂධ සඳහා අගය එකතු කිරීම		*හඳුනාගනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා සංඛ්‍යාව.	* ඖෂධීය /ආයුර්වේද නිෂ්පාදනවල සජලතාව අධ්‍යයනය කිරීම සඳහා වන මූලලේඛය	*හඳුනාගන්නා ලද පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා සංඛ්‍යාව

ප්‍රමුඛතා ක්ෂේත්‍රය ‍ජාතික ප්‍රතිපත්ති රාමුව සඳහා යොමුව*	ව්‍යාපෘතිය/වැඩසටහන	ප්‍රතිපාදන 2021 (රු.මි)	නිමැවුම	ප්‍රතිඵලය	ප්‍රධාන කාර්යසාධන දර්ශකය (KPI)
ප්‍රමුඛතා 1 -මිලියන 50), ප්‍රමුඛතාව 2-මිලියන; 40), ප්‍රමුඛතාව 3-මිලියන; 40), ප්‍රමුඛතාව 5-මිලියන; 40), ප්‍රමුඛතාව 6-මිලියන; 40), ප්‍රමුඛතාව 7-මිලියන; 20) ප්‍රමුඛතාව 8-මිලියන; 39), ප්‍රමුඛතාව 9-මිලියන; 21), ප්‍රමුඛතාව10-මිලියන; 28), ප්‍රමුඛතාව11-මිලියන; 28), ප්‍රමුඛතාව 9-මිලියන; 21), ප්‍රමුඛතාව 8-මිලියන; 39), ප්‍රමුඛතාව 7-මිලියන; 20), ප්‍රමුඛතාව 6-මිලියන; 40), ප්‍රමුඛතාව 5-මිලියන; 40), ප්‍රමුඛතාව 4-මිලියන; 40), ප්‍රමුඛතාව 3-මිලියන; 40), ප්‍රමුඛතාව 2-මිලියන; 40), ප්‍රමුඛතාව 1 -මිලියන 50),	ආහාර සුරක්ෂිතතාව සහ අගය එකතු කිරීම		* ආහාර පරිභෝජන රටා ගැනි ඇතිවිය හැකි අවදානම් පිළිබඳ වාර්තාව.	* ආහාර අංශයේ ප්‍රතිපත්තිමය නිර්දේශ සඳහා ආහාර සුරක්ෂිතතා මාර්ගෝපදේශ.	* හඳුනාගන්නා ලද ඇතිවිය හැකි සහ මතුවෙමින් පවතින ආහාර උපදුව සංඛ්‍යාව. * හඳුනාගන්නා ලද ඇතිවිය හැකි ආහාර සුරක්ෂිතතා අවදානම් සංඛ්‍යාව.
	කෘෂිකර්මාන්ත අංශයේ අගය එකතු කිරීම		*අගය එකතු කිරීම් සපයන ලද ක්ෂේත්‍ර සංඛ්‍යාව.	* කෘෂිකර්මාන්ත අංශයේ අගය එකතු කිරීම.	*කෘෂිකර්මාන්ත අංශයේ අගය එකතු කිරීම සඳහා පවතින ක්ෂේත්‍ර සංඛ්‍යාව.
	ප්‍රමුඛතා අවශ්‍යතාවලට අනුව නිසි පරිදි සකස් කරන ලද ව්‍යාපෘති යෝජනා ලබා ගැනීම		* RD විසින් පැහැදිලිව විස්තර කරන ලද යෝජනා * අරමුදල් සපයන ලද ප්‍රමුඛතා ව්‍යාපෘති සංඛ්‍යාව.	විසඳන ලද /අවම කරන ලද වත්මන් ගැටළු ජාතික ආර්ථිකය වෙත දායකත්වය.	ව්‍යාපෘතිවල අරමුණුවලට අනුව බිහි වන ලද නිමැවුම්. විසඳන ලද ගැටළු සංඛ්‍යාව
			* TD විසින් පැහැදිලිව විස්තර කරන ලද යෝජනා 6 * අරමුදල් සපයන ලද ප්‍රමුඛතා ව්‍යාපෘති සංඛ්‍යාව		ව්‍යාපෘතිවල අරමුණුවලට අනුව බිහි වන ලද නිමැවුම්. විසඳන ලද ගැටළු සංඛ්‍යාව.
	ධාරිතා සංවර්ධන වැඩසටහන් අඛණ්ඩව සිදු කිරීම		* සලසා දෙන ලද පත්වාත් උපාධි සහ වර්ධනය කරන ලද දැනුම – 10 * පර්යේෂණ ව්‍යාපෘති සාර්ථක අන්දමින් සම්පූර්ණ කිරීම- 05	*වැඩි දියුණු කරන ලද ආර්ථික වර්ධනය සඳහා ධාරිතා සංවර්ධනය සහ දැනුම හා නිපුණතා සංවර්ධනය, කර්මාන්ත ආශ්‍රිත ගැටළු විසඳීම, බහු පාර්ශවකාර හවුල්කාරිත්වයන් ගොඩනැගීම.	*සම්පූර්ණ කරන ලද පර්යේෂණ ශිෂ්‍යත්ව 05
	උපකරණ ප්‍රදාන යෝජනා ක්‍රමය අඛණ්ඩව සිදු කිරීම		*සම්පූර්ණ කරන ලද ප්‍රදාන - 05	*ශක්තිමත් කරන ලද පර්යේෂණ පහසුකම්	*අංග සම්පූර්ණ විද්‍යාගාර සංඛ්‍යාව
	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ අවශ්‍යතා සැලිරීම		* ප්‍රතිලාභ ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාව.	* ජාතික ආර්ථිකය සඳහා දායකත්වය.	* හඳුනාගන්නා ලද තාක්ෂණ අවශ්‍යතා සංඛ්‍යාව. * ප්‍රතිලාභ ලද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංඛ්‍යාව.
	වයඹ විශ්වවිද්‍යාලයේ කාර්මික සේවා මධ්‍යස්ථානය සමග හවුල්කාරිත්ව ව්‍යාපෘතිය		* U-I සන්ධාන නිර්මාණය කිරීම (02)	*වෙළඳපොල තුළ නව නිෂ්පාදන *රැකියා අවස්ථා නිර්මාණය කිරීම	* ස්ථාපිත කරන ලද සන්ධාන සංඛ්‍යාව
	ජාතික විද්‍යා පදනමට පැවරී ඇති කාර්යය ආ) විද්‍යා හා තාක්ෂණ තොරතුරු ව්‍යාප්ත කිරීම				
	ආදායම් උත්පාදනය සඳහා භාවිතා කරනු ලබන ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය		*නව ව්‍යාපෘති - 03	*ඩිජිටල්කරණය කරන ලද සම්පත් වෙත අවදානය වැඩිවීම සහ ඒ සඳහා ප්‍රවේශය * වැඩිවන ලද පරිශීලකයින් සංඛ්‍යාව *ඉ- කෝෂ්ඨාගාරය ක්‍රියාවට නැංවීම * ආදායම් උත්පාදන උපායමාර්ග	* උත්පාදනයකරන ලද ආදායමේමූල්‍යඅගය * ඉ- කෝෂ්ඨාගාරය
	විද්‍යාත්මක හමු හා අවස්ථා සඳහා සහාය යෝජනා ක්‍රමය (SSSME)		සහාය දෙන ලද අවස්ථා සංඛ්‍යාව: 01	*අදාළ පාර්ශවකරුවන් වෙත බෙදා හරින ලද විද්‍යා හා තාක්ෂණ නිමැවුම් *ශ්‍රී ලාංකීය විද්‍යාඥයන් සඳහා ජාත්‍යන්තර පිළිගැනීම *සංවිධානය කළ අවස්ථාවන්හි ජාත්‍යන්තර සහයෝගිතාව	සහාය දෙන ලද අවස්ථා සංඛ්‍යාව
	ප්‍රකාශන ගාස්තු සඳහා සහාය යෝජනා ක්‍රමය (SSPF)		සහාය දෙන ලද ලිපි සංඛ්‍යාව: 06		සහාය දෙන ලද ලිපි සංඛ්‍යාව සහාය දෙන ලද දේශීය කතුවරුන් සංඛ්‍යාව
	ජාතික විද්‍යා පදනමේ සඟරාව		*අවම වශයෙන් අෂ්ටිපත් 250ක් පළ කිරීමේ ක්‍රියාවලියට ලක් කිරීම *නිසි කලට කලාප හතර පළ කිරීම. *වසර තුළ අවම වශයෙන් ලිපි 40ක් පළ කිරීම.	*පර්යේෂණ සොයාගැනීම් ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත කිරීම	*පළ කරන ලද සඟරාව
	ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව		*අවම වශයෙන් අෂ්ටිපත් 250ක් පළ කිරීමේ ක්‍රියාවලියට ලක් කිරීම *නිසි කලට කලාප හතර පළ කිරීම. *වසර තුළ අවම වශයෙන් ලිපි 40ක් පළ කිරීම.	*පර්යේෂණ සොයාගැනීම් ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත කිරීම	*පළ කරන ලද සඟරාව
	ශ්‍රී ලාංකීය සඟරා සඳහා සහාය යෝජනා ක්‍රමය		*සඟරා 05ක් සඳහා උපදෙස් සපයන ලදී	*ජාත්‍යන්තර දත්ත පද්ධතිවල සුචිගත වීමට අයැදුම් කිරීම සඳහා සුදුසුකම් ලබන සඟරා *ඉහළ දමන ලද ශ්‍රී ලාංකීය සඟරාවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන්	*2023 වසර වන විට ESCI සඳහා ඇතුළත් වීමට අවම වශයෙන් සඟරා 05කට සහාය වීම
	ශ්‍රී ලංකා මාර්ගගත සඟරා (SLJOL)		*උඩුගත කරන ලද සඟරා ලිපි - 820 *නව සඟරා - 130	*ශ්‍රී ලාංකීය සඟරා වෙත අවදානය යොමුවන මට්ටම ඉහළ දැමීම	*වැඩි දියුණු කරන ලද විද්‍යා හා තාක්ෂණ සඟරා

ප්‍රමුඛතා ක්ෂේත්‍රය ‘ජාතික ප්‍රතිපත්ති රාමුව සඳහා යොමුව’	ව්‍යාපෘතිය/වැඩසටහන	ප්‍රතිපාදන 2021 (රු.මි)	නිමැවුම	ප්‍රතිඵලය	ප්‍රධාන කාර්යසාධන දර්ශකය (KPI)
ප්‍රමුඛතා 1: පි.වි.ප්‍ර: 50), ප්‍රමුඛතාව 2:පි.වි.ප්‍ර: 40), ප්‍රමුඛතාව 3:පි.වි.ප්‍ර: 40), ප්‍රමුඛතාව 4:පි.වි.ප්‍ර: 40), ප්‍රමුඛතාව 5:පි.වි.ප්‍ර: 40), ප්‍රමුඛතාව 6:පි.වි.ප්‍ර: 40), ප්‍රමුඛතාව 7:පි.වි.ප්‍ර: 70), ප්‍රමුඛතාව 8:පි.වි.ප්‍ර: 39), ප්‍රමුඛතාව 9:පි.වි.ප්‍ර: 21), ප්‍රමුඛතාව 10:පි.වි.ප්‍ර: 28), ප්‍රමුඛතාව 6:පි.වි.ප්‍ර:210), ප්‍රමුඛතාව 7:පි.වි.ප්‍ර:440), ප්‍රමුඛතාව 8:පි.වි.ප්‍ර:39), ප්‍රමුඛතාව 9:පි.වි.ප්‍ර:21), ප්‍රමුඛතාව 10:පි.වි.ප්‍ර:28	විද්‍යා හා තාක්ෂණ වෘත්තිකයින්ගේ වේදිකාව හරහා විද්‍යාත්මක දැනුම හා සම්පත් ලබාගැනීමේ හැකියාව පිළිබඳ තොරතුරු සැපයීම		*විද්‍යා හා තාක්ෂණ වෘත්තිකයින්ගේ වේදිකාව තුළ පුළුල් කරන ලද ආයතනික විස්තර සැපයුම - 60 * විද්‍යා හා තාක්ෂණ වෘත්තිකයින්ගේ වේදිකාවේ සබැඳිය අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන ආයතනවල වෙබ් අඩවිවලට ඇතුළු කිරීම *එම වේදිකාවේ ලියාපදිංචිවූවන්ගේ ප්‍රතිලාභය සඳහා එක් සේවාවක් හඳුන්වාදීම	*ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී විද්‍යා හා තාක්ෂණ තොරතුරු වඩාත් පුළුල් ලෙස භාවිතා වීම *ඉහළ නංවන ලද අවධානය යොමුවන මට්ටම හා භාවිතය	*විද්‍යා හා තාක්ෂණ තොරතුරු එකම තැනකින් ලබාගත හැකි මූලාශ්‍රයක් *ලියාපදිංචි වූවන් සංඛ්‍යාව *ඇතුළත් කරන ලද ආයතන සංඛ්‍යාව *දත්ත සැපයීම් සංඛ්‍යාව *වේදිකාව වෙත පිවිසෙන පිරිසේ සංඛ්‍යාව *වෙබ් අඩවියෙන් බාගත කරන ලද ෆයිල් සංඛ්‍යාව
	ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති කාර්යය ඇ) විද්‍යා හා තාක්ෂණ ධාරිතා සංවර්ධනය				
	විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින්ගේ කුසලතා සංචිතය ප්‍රයෝජනයට ගැනීම සඳහා ඩිජිටල් වේදිකාවක් ස්ථාපිත කිරීම		*අන්තර්ක්‍රිය ප්‍රතිලාභ සඳහා හවුල්කාරිත්වයන් - 05	*නවෝත්පාදන පරිසර පද්ධතියේ අභිවෘද්ධිය *සමාජ ආර්ථික සංවර්ධනය සඳහා විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින්ගේ දායකත්වය	*උසස් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින් හා සහයෝගීත්වය ඇතිකරගැනීමට වේදිකාවක් *ඩිජිටල් වේදිකාවේ ලියාපදිංචි වූ විදේශයන්හි වෙසෙන ලාංකිකයින් සංඛ්‍යාව *ඇතිකරගත් නව සහයෝගිතා සංඛ්‍යාව *දැනුම නුවමාරු වැඩසටහන් තුළින් ප්‍රතිලාභ ලද පර්යේෂකයින් සංඛ්‍යාව *උසස් නිමැවුම් බිහි කරන පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව
	විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සංවර්ධනය සඳහා ධාරිතා සංවර්ධනය කිරීමේ කාර්යයට විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් සම්බන්ධකර ගැනීම		*ධාරිතා සංවර්ධනය කරන ලද පර්යේෂකයින් සංඛ්‍යාව - 10	*ශ්‍රී ලංකාව නවෝත්පාදන මධ්‍යස්ථානයක් බවට පත්කිරීමට සූදානම් විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන පර්යේෂණ හා සංවර්ධන ශ්‍රම බලකාය හරහා සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීම	*පුනුණුකරන ලද පර්යේෂකයින් සංඛ්‍යාව * මූල පුරන ලද නව පර්යේෂණ හා සංවර්ධන සහයෝගීතා සංඛ්‍යාව * ඉහළ නංවන ලද විද්වත් ප්‍රකාශන සංඛ්‍යාව *උසස් පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා ධාරිතා සංවර්ධනය කරන ලද පර්යේෂකයින්
	දේශීය පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට පහසුකම් සැලසීම් සඳහා පවතින ජාත්‍යන්තර අරමුදල් සැපයුම් අවස්ථා ගවේෂණය කිරීම		*අවම වශයෙන් ප්‍රදාන 02ක් ලබාදීම් සඳහා යෝජනා 10ක් ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීම	*රජය මත අඩුබරක් පැටවෙන ලෙස වැඩිදියුණු කරන ලද පර්යේෂණ හා සංවර්ධන නිමැවුම්	*ඉදිරිපත්කරන ලද පර්යේෂණ යෝජනා සංඛ්‍යාව *ලබාගත් විදෙස් අරමුදල් ප්‍රමාණය
	යුනෙස්කෝ MAB වැඩසටහන යටතේ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම		*හවුල්කාරිත්වයන් 02ක් පිහිටුවීම *සංරක්ෂණ වැඩසටහන් 02ක් සඳහා පහසුකම් සැලසීම	*පාරිසරික තිරසරභාවය *නිවැරදි ආකාරයට සකස් කරන ලද MAB වැඩසටහන * ජෛව ගෝලීය සංචිත වඩාත් හොඳින් කළමනාකරණය කිරීම	*හඳුනාගත් පර්යේෂණ පරතරයන් සංඛ්‍යාව *පහසුකම් සලසන ලද පර්යේෂණ අධ්‍යයන සංඛ්‍යාව
	ජාතික විද්‍යා පදනම ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන් කටයුතු කරමින් ජාත්‍යන්තර විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සංවිධාන සමග ජාලගත වීම ශක්තිමත් කිරීම		*නව සබැඳි 05ක් ඇති කිරීම	*ඉහළ නංවන ලද නවෝත්පාදන පරිසර පද්ධතිය	*ඒකාබද්ධ වැඩසටහන් මඟින් ප්‍රතිලාභ ලද පර්යේෂකයින් සංඛ්‍යාව
	හවුල්කාරිත්ව වැඩසටහන		*ලෝකය වෙතින් නව දැනුම නුවමාරුව සඳහා වෙබිනා වැඩසටහන් - 03	*ප්‍රත්‍යන්ත දැනුම බෙදා ගත් හා ගෝලීය භාවිතයන් හා ප්‍රවණතා පිළිබඳ වඩාත් හොඳින් දැනුවත් පර්යේෂණ ප්‍රජාව	*ප්‍රතිලාභ ලද පර්යේෂකයින් සංඛ්‍යාව
	ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති කාර්යය ඈ) විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ				
	ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය 2020		* පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය පිළිබඳ සංඛ්‍යාලේඛනමය අත්පොත 2018 පළ කරන ලදී 01 * පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය පිළිබඳ සංඛ්‍යාලේඛනමය අත්පොත 2020 40% ක් සම්පූර්ණ කරන ලදී - 01	* රටේ පර්යේෂණ හා සංවර්ධන කාර්යසාධනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින් වෙත තොරතුරු, දත්ත ලබාගැනීමේ හැකියාව	*වැඩි දියුණු කරන ලද ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය 2018 සංඛ්‍යාලේඛන * ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය 2020 සංඛ්‍යාලේඛන 40% ක් සම්පූර්ණ කිරීම
	ජාතික විද්‍යා පදනම වෙත පැවරී ඇති කාර්යය ඉ) විද්‍යාව ප්‍රචලිත කිරීම				
	විද්‍යා සාක්ෂරතාව වැඩි දියුණු කිරීම සහ විද්‍යා අධ්‍යාපනය වෙතට පහසුකම් සැලසීම් සඳහා වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කිරීමට ප්‍රජා ජාල නිර්මාණය කිරීම සහ ඒවා ශක්තිමත් කිරීම		*ස්ථාපිත කරන ලද ජාල සංඛ්‍යාව - 02	*ප්‍රජාවේ වෙනස් මට්ටමක් වෙත විද්‍යාව ගෙන යාම සහ විද්‍යා සාක්ෂරතාව වැඩි දියුණු කිරීම සඳහා ජාලගත වීම	*සාර්ථක අන්දමින් ස්ථාපිත කරන ලද ජාල
	වැදගත් පර්යේෂණ සොයාගැනීම් හා තාක්ෂණයන් අදාළ පාර්ශවකරුවන් හා කර්මාන්ත වෙත ගෙන යාම		*හඳුනාගත් පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා - 05 *ප්‍රජාව සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන් - 03 *ප්‍රජා ජාල - 02	*ගම් මට්ටමින් පිහිටුවන ලද / වැඩි දියුණු කරන ලද ගෘහස්ථ කර්මාන්ත සහ ප්‍රජාව තුළ වැඩි දියුණු කරන ලද තාක්ෂණ දැනුම	*ප්‍රජාව වෙත සේවය සලසමින් සිදු කරන ලද වැඩසටහන් සංඛ්‍යාව

ප්‍රමුඛතා ක්ෂේත්‍රය ‘ජාතික ප්‍රතිපත්ති රාමුව සඳහා යොමුව*	ව්‍යාපෘතිය/වැඩසටහන	ප්‍රතිපාදන 2021 (රු.මි)	නිමැවුම	ප්‍රතිඵලය	ප්‍රධාන කාර්යසාධන දර්ශකය (KPI)
	ජාතික විද්‍යා පදනමට පැවරී ඇති කාර්යය අ) පර්යේෂණ හා සංවර්ධන පුවර්ධනය				
ප්‍රමුඛතා 1 (ලිපිය: 50), ප්‍රමුඛතා 2(ලිපිය: 40), ප්‍රමුඛතා 3(ලිපිය: 40), ප්‍රමුඛතා 5(ලිපිය: 40), ප්‍රමුඛතා 6(ලිපිය: 40, ප්‍රමුඛතා 7(ලිපිය: 20), ප්‍රමුඛතා 8(ලිපිය: 39), ප්‍රමුඛතා 9(ලිපිය: 21), ප්‍රමුඛතා10(ලිපිය: 28)	නවෝත්පාදන පාදක ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ඇරඹීම (පාසල්-තරුණ තරුණියන් ප්‍රජාව මෙතින්)	67.8969	*නවෝත්පාදන/ වාණිජ්කරණය සහ ව්‍යවසායකත්වය පාදක වැඩසටහන් - 10	*නවෝත්පාදන බිහි කිරීම සඳහා පෙලඹුණු ප්‍රජාව පාදක කොටගත් ව්‍යවසායකත්වය	*රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් 10ක් පිහිටුවන ලදී
	ජාතික විශ්ලේෂණ සහ පරීක්ෂණ මධ්‍යස්ථානය /පහසුකම් පිහිටුවීම		*විස්තීර්ණ සෙවුම් කළ හැකි දත්ත පද්ධතිය - 01 *අවසන් සමීක්ෂණ වාර්තාව * ජාතික විශ්ලේෂණ සහ පරීක්ෂණ මධ්‍යස්ථානය /පහසුකම් පිහිටුවීම් සඳහා සකස් කර ඇති යෝජනාවක්	*අඩු වියදමකින් සහ කඩිනමින් පරීක්ෂණ සිදු කිරීමේ පහසුකම ලැබීම	*සකස් කරන ලද දත්ත පද්ධති සංඛ්‍යාව (01) *සමීක්ෂණ වාර්තා සංඛ්‍යාව (01) *සකස් කරන ලද යෝජනා සංඛ්‍යාව (01)
	නවෝත්පාදන, අලුතින් පිහිට වූ ව්‍යාපාර, වාණිජ්කරණය සහ සන්නාමීකරණයට අදාළ ක්‍රියාකාරකම්		* වාණිජ්කරණයට ලක් කළ ව්‍යාපෘති සංඛ්‍යාව සහ අරමුදල් නිදහස් කිරීම් ප්‍රමාණය. *නව ව්‍යාපාර අදහස් ඉදිරිපත් කරන අවස්ථා වෙතින් ප්‍රතිලාභ ලද නව නිපැයුම්කරුවන් සංඛ්‍යාව	* ජාතික ආර්ථිකයට දායකත්වය. * නව නිපැයුම්කරුවන්ට සිය නිෂ්පාදන වැඩි දියුණු කරගැනීම සඳහා අවස්ථා නිර්මාණය කිරීම.	* වාණිජ්කරණය සඳහා අරමුදල් සපයන ලද තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව. *UBLCs සමග සංවිධානය කරන ලද නව ව්‍යාපාර අදහස් ඉදිරිපත් කරන අවස්ථා.
	ව්‍යවසායකයින් පුහුණු කිරීම සහ ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය		* නව නිපැයුම්කරුවන් සඳහා පවත්වන ලද අන්තර්ක්‍රියාකාරී දැනුම හුවමාරු සැසි සංඛ්‍යාව. * පුහුණු කරන ලද නව නිපැයුම්කරුවන් සංඛ්‍යාව.	* නව නිපැයුම්කරුවන් සඳහා නිපුණතා සංවර්ධනය.	* නව නිපැයුම්කරුවන් සඳහා පවත්වන ලද අන්තර්ක්‍රියාකාරී දැනුම හුවමාරු සැසි සංඛ්‍යාව. * පුහුණු කරන ලද නව නිපැයුම්කරුවන් සංඛ්‍යාව.
	ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය (NCE) සමග හවුල්කාරිත්ව ව්‍යාපෘතිය		* දේශීය/විදේශීය විශ්වවිද්‍යාල සමග අපනයන අංශයේ ව්‍යවසායන් පිහිටුවීමේ සබැඳි (02)	* අපනයන වෙළඳපොල සඳහා අගය එකතු කළ හෝ නව නිෂ්පාදන සංවර්ධනය කිරීම	*පිහිටුවන ලද සබැඳි සංඛ්‍යාව (02) * සහාය ලබාදෙන ලද නව නිෂ්පාදන සංවර්ධන සංඛ්‍යාව (02)
	පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම සඳහා ස්වයංක්‍රීය පද්ධතිය (ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සමග)		* පේටන්ට් බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය තුළින් සහාය ලබාදෙන ලද නව නිපැයුම්කරුවන් සංඛ්‍යාව * ධාරිතා සංවර්ධනය කරන ලද අභ්‍යන්තර කාර්ය මණ්ඩල සමාජිකයින් සංඛ්‍යාව	* පේටන්ට් බලපත්‍ර ඉල්ලා සිටින ආකාරය /තොරතුරු සෙවීම පිළිබඳ ඉහළ නංවන ලද දැනුවත්භාවය.	* සිදු කරන ලද පේටන්ට් තොරතුරු සෙවීම් සංඛ්‍යාව * සපයන ලද උපදේශන සේවා සංඛ්‍යාව * සපයන ලද සෙවුම් වාර්තා සංඛ්‍යාව - 03. * පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව.
	ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයනු ලබන සාර්ථක ව්‍යාපෘතියක් සඳහා නව ව්‍යාපාරයක් පිහිටුවීමට පහසුකම් සැලසීම		*ජාතික විද්‍යා පදනමේ ප්‍රදානයක් මගින් බිහි වූ නිමැවුමක් මූල්කොට නව ව්‍යාපාරයක් පිහිටුවීම	* ධනය ඉපැදීම සඳහා විද්‍යා හා තාක්ෂණ අංශයේ දායකත්වය * බිත්ති බැඳීමේ තාක්ෂණයට තිරසර විකල්පයක් සහිත දේශීය වෙළඳපොල * දේශීය ප්‍රජාව පුහුණු කිරීම මගින් දේශීය ව්‍යවසායකයින් නිර්මාණය කිරීමේ අවස්ථා	* පිහිටුවන ලද නව ව්‍යාපාර සංඛ්‍යාව * පුහුණු කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව * නිර්මාණය කරන ලද දේශීය ව්‍යවසායකයින් සංඛ්‍යාව
	ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ව්‍යවසාය සංවර්ධනයේ පර්යේෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා සහභාගීත්ව ප්‍රවේශයන් හඳුනාගැනීම සහ සැපයීම		*සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ පර්යේෂණ අවශ්‍යතා හඳුනාගැනීම	*අදාළ පාර්ශව සම්බන්ධීකරණය කිරීම මගින් හඳුනාගත් ගැටළු සඳහා විසඳුම් සැපයීම	*බහික් නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීම. * පළමු පියවර වශයෙන් බස්නාහිර පළාතේ බහික් නිෂ්පාදකයින් සහ පාරිභෝගිකයින් වෙතින් එක් රැස් කරන ලද තොරතුරු. * බහික් අංශයේ තත්ව සහතිකකරණ යෝජනා ක්‍රමය සඳහා පරාමිතීන් හඳුනාගැනීම
	පුද්ගලික අංශය සමග හවුල්කාරිත්ව ව්‍යාපෘති		* දේශීය වෙළඳපොලට ඇතුළු වන ජාතික විද්‍යා පදනමේ ප්‍රදාන නිමැවුම්	* ධනය ඉපැදීම සඳහා විද්‍යා හා තාක්ෂණ අංශයේ දායකත්වය * අගය එකතු කළ නිෂ්පාදනවලින් සපිරුණු දේශීය වෙළඳපොල	* දේශීය වෙළඳපොලට ඇතුළු වන ජාතික විද්‍යා පදනමේ ප්‍රදාන නිමැවුම් සංඛ්‍යාව * පහසුකම් සලසන ලද තාක්ෂණ හුවමාරු සංඛ්‍යාව
	විද්‍යාත්මක පර්යේෂණ විභවතාව ශක්තිමත් කිරීමේ වැඩසටහන අබණ්ඩව සිදු කිරීම		*සඟරා ප්‍රකාශන සංඛ්‍යාව - 15 *සන්නිවේදන සංඛ්‍යාව - 30	*ශක්තිමත් කරන ලද පර්යේෂණ හා සංවර්ධන විභවතාව, ස්වභාවික සම්පත්වලට අගය එකතු කිරීම සහ අඩු කරන ලද අලාභ හා සාරවත් කරන ලද /නගා සිටුවන ලද පුද්ගල සුහසාධනය	*සංවර්ධනය සඳහා දායක වූ ව්‍යාපෘති සංඛ්‍යාව
	තාක්ෂණ සංවර්ධන ප්‍රදාන සහ කොවිඩ් 19 ප්‍රදාන				
	විද්‍යා හා තාක්ෂණ විශිෂ්ටත්වය සම්භවනාවට පාත්‍ර කිරීම		* නිසි කලට හා සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ ප්‍රදාන සහ පශ්චාත් උපාධි – 10	*අභිප්‍රේරණය කරන ලද තරුණ පර්යේෂකයන් සහ විද්‍යාඥයන්	* සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය වෙනුවෙන් වූ සම්මාන ගණන
	තත්ත්ව ආරක්ෂණය		* යෝජිත තත්ත්ව ආරක්ෂණය ක්‍රියාවට නැංවීම සඳහා සැලසුම්. * තත්ත්ව ආරක්ෂණය ක්‍රියාවට නැංවීම පිළිබඳ වාර්තාව.	* ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතිවල තත්ත්ව ආරක්ෂණය.	*තත්ත්ව සංවේදකය සමග වාණිජ්කරණය සඳහා හඳුනාගන්නා ලද ව්‍යාපෘති සංඛ්‍යාව. *තත්ව ආරක්ෂණය සහතික කරන ව්‍යාපෘති සංඛ්‍යාව.
	ආයුර්වේද ඖෂධ සඳහා අගය එකතු කිරීම		*හඳුනාගනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා සංඛ්‍යාව.	* ඖෂධීය /ආයුර්වේද නිෂ්පාදනවල සඵලතාව අධ්‍යයනය කිරීම සඳහා වන මූලලේඛය	*හඳුනාගන්නා ලද පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා සංඛ්‍යාව

නිමැවුම්/ප්‍රතිඵල මත පදනම් වූ කාර්යසාධනය සමාලෝචනය

පර්යේෂණ හා සංවර්ධන සහ ධාරිතා සංවර්ධනය

2021 වසරේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතනවල පවතින මූල්‍ය, භෞතික සහ මිනිස් බල සම්පත් පරිපූරණය කිරීමට ජාතික විද්‍යා පදනම අඛණ්ඩව සහයෝගය ලබා දුන්නේය. සමාජ විද්‍යාවන් ඇතුළුව විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍ර සියල්ලටම ප්‍රදාන පිරිනැමීම සිදු කෙරේ. රූප සටහන 14 මගින් 2021 වසරේදී පිරිනමන ලද නව ප්‍රදාන පිළිබඳ විස්තර පෙන්නුම් කෙරෙන අතර *ඇමුණුම 02* මගින් ඒ පිළිබඳ විස්තර ඉදිරිපත්කර ඇත. *වගුව 04* මගින් 2021 වසරේදී අධීක්ෂණය කරන ලද සියලුම පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිවල තත්ත්වය සාරාංශ කොට ඉදිරිපත්කර ඇත.



රූප සටහන 14: 2021 වසරේදී ආරම්භ කරන ලද නව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති

වගුව 04: පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිවල තත්වය පිළිබඳ සාරාංශය

ක්ෂේත්‍රය/ක්ෂේත්‍ර	වසර තුළ සිදු කෙරෙමින් පැවති ව්‍යාපෘති සංඛ්‍යාව			වසර තුළදී සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව			2022 වර්ෂයට රැගෙන ආ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව		
	මූලික	ව්‍යවහාරික	නිෂ්පාදන සංවර්ධනය	මූලික	ව්‍යවහාරික	නිෂ්පාදන සංවර්ධනය	මූලික	ව්‍යවහාරික	නිෂ්පාදන සංවර්ධනය
කෘෂි විද්‍යාව	1	12	10	-	2	1	1	10	9
ජෛව තාක්ෂණවේදය	2	3	-	1	1	-	1	2	-
මූලික විද්‍යාල	4	10	-	-	1	-	4	9	-
ඉංජිනේරු,වාස්තු විද්‍යා සහ තොරතුරු හා සන්නිවේදනය	1	10	6	-	-	2	1	10	4
පරිසරය හා ජෛව තාක්ෂණවේදය	5	4	1	3	1	-	2	3	1
සෞඛ්‍ය විද්‍යා	7	21	1	3	2	-	4	19	1
සමාජ විද්‍යාව	1	-	-	-	-	-	1	-	-
විපර්යාස හා ස්වභාවික ආපදා	-	5	-	-	-	-	-	5	-
එකතුව	21	65	18	7	7	3	14	58	15
මුළු එකතුව	104			17			87		

ආයතන දහඅටක (18) ප්‍රධාන අන්වේෂකයින් සහ සම අන්වේෂකයින් (PIs සහ Co-Is) ඇතුළුව 258කට සමාන පර්යේෂකයන් පිරිසක් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ ලබා ඇත.



රූප සටහන 15 : සිදු කෙරීගෙන යන පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ ලද ආයතන

ලබාගත් පේටන්ට් බලපත්‍ර 4ක්, ගොනු කරන ලද පේටන්ට් බලපත්‍ර අයදුම්පත් 2ක්, විදේශීය ප්‍රකාශන 26ක්, දේශීය ප්‍රකාශන 07ක් සහ සන්නිවේදන 95ක් ඇතුළුව ප්‍රකාශන 128ක් 2021 වසරේ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති තුළින් බිහි විය (*රූප සටහන 16*) පේටන්ට් බලපත්‍ර ඉංජිනේරු, වාස්තු විද්‍යා සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ජෛව තාක්ෂණය සහ සෞඛ්‍ය විද්‍යා යන ක්ෂේත්‍රවලට අදාළ ඒවා විය.



රූප සටහන 16 : පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති හරහා සිදු කරන ලද ප්‍රකාශන සහ ලබාගත් පේටන්ට් බලපත්‍ර

ධාරිතා සංවර්ධනය යටතේ, ජාතික විද්‍යා පදනම විසින් සිසුන් 24 දෙනෙකුට පශ්චාත් උපාධි හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානයන් පිරිනමා ඇත. ඔවුන් අතරින් ශිෂ්‍යයින් 16 දෙනෙක් 2021 වසරේදී තම පශ්චාත් උපාධි සම්පූර්ණ කළහ.



රූප සටහන 17 : විවිධ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍ර යටතේ බිහි වූ PhD සහ MPhil උපාධිධාරීන් සංඛ්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ ලද සාර්ථකත්වයන්

වෙළඳපොල අවස්ථා සොයා යෑම

ජාතික විද්‍යා පදනමේ ප්‍රදාන තුළින් බිහි වූ නිෂ්පාදන වෙතින් ආර්ථික වාසි අත්කර ගැනීම සඳහා පවතින වෙළඳපල අවස්ථා ගවේෂණය කිරීම සඳහා ජාතික විද්‍යා පදනම Good Market, Sri Lanka සමඟ සහයෝගීත්වය ඇතිකර ගත්තේය. ඒ අනුව Good Market ආයතනය සහ ජාතික විද්‍යා පදනමේ ප්‍රදානලාභීන් අතර අන්තර් ක්‍රියාකාරී සාකච්ඡා පැවැත්විණි. ආක්‍රමණශීලී ජලජ ශාකයක් වන ජපන් ජබර වෙතින් "Saru Organic" නිෂ්පාදන, අඹ විනාකිරි ඇතුළුව පලතුරු අපද්‍රව්‍යවලින් විවිධ ආහාර නිෂ්පාදන, සහ හිරු එළියෙන් සම සුරකින ඖෂධීය ආලේපන සැකසීම මෙහිදී අවධානයට ලක් වූ ප්‍රදාන තුළින් බිහි වූ නිෂ්පාදන විය.



ප්‍රදානලාභී, එන් ධර්මසිරි මහතා සිය නිෂ්පාදන Good Market කණ්ඩායම වෙත ඉදිරිපත් කරමින්



Good Market කණ්ඩායම "Saru Organic" නිෂ්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කරමින්

Good Market කණ්ඩායම විසින් නාත්තන්ඩිය ප්‍රදේශයේ පිහිටි ව්‍යාපෘති භූමිය වෙත ගොස් පරීක්ෂා කර සත්‍යාපනය කිරීමෙන් පසු ප්‍රථම වරට වෙළඳපොළට ගෙන ආවේ "Saru Organic" නිෂ්පාදනය අදාළ නිෂ්පාදනය Good Market වෙතින් PGS සහතිකය ලබාගෙන ඔවුන්ගේ නිෂ්පාදන කළඹට ඇතුළු විය. ඒ අනුව, ප්‍රදාන නිෂ්පාදනය දැන් Good Market Global වේදිකාවේ ලියාපදිංචි කර ඇත.



ප්‍රදාන නිමැවුම් දෙකක ප්‍රතිඵල වශයෙන් දේශීය හා විදේශීය පේටන්ට් බලපත්‍ර හිමිකරගන්නා ලදී.



TG/2016/Tech-D/01

ප්‍රදානයෙහි ප්‍රතිඵලයක් ලෙස " සනාල පද්ධතියේ සෞඛ්‍යය නිරීක්ෂණය කිරීමේ පද්ධතිය සහ ක්‍රමය" යන නව නිපැයුම සඳහා US 10,912, 464 B2 යන එක්සත් ජනපද පේටන්ට් බලපත්‍රයක් හිමි විය.



TG/2014/Tech-D/01 ප්‍රදානයෙහි ප්‍රතිඵලයක් ලෙස " Brassicaceae කුලයේ බෝගයන්හි ජීව විද්‍යාත්මක කෘමි පලිබෝධ කළමනාකරණය සඳහා වන ක්‍රමය සහ දියමන්ති කළු සලබයා මහා පරිමාණයෙන් ඇති කිරීම සඳහා කෘත්‍රිම ආහාර සංයුති, යන මැයෙන් වූ නවෝත්පාදනය සඳහා 20167 දේශීය පේටන්ට් බලපත්‍රය හිමිවිය.



TG/2017/Tech-D/02 ප්‍රදානය මගින් තාක්ෂණ දැනුම හුවමාරුව සිදුවිය. ඒ අනුව (ISBN 978-624-5464-02-9) නම් ග්‍රන්ථය පළ කරන ලද අතර එමගින් දේශීය බෝට්ටු නිෂ්පාදන කර්මාන්තයේ නිරත ප්‍රජාව වෙත දැනුම හුවමාරුව සිදුවිය. එම ග්‍රන්ථයට ඉංග්‍රීසි භාෂාවෙන් පරිච්ඡේද නවයක් සහ සිංහල භාෂාවෙන් පරිච්ඡේද හතක් ඇතුළත් වේ.

ජාතික විද්‍යා පදනමේ සහාය දේශීය බීම වෙළඳපොළට ශක්තියක් ලබා දෙයි

ක්‍රීඩක ක්‍රීඩිකාවන්, තරුණ ප්‍රජාව, පාසල් සිසුන් සහ වැඩිහිටි පුද්ගලයින්ගේ පිපාසය සන්සිඳුවීමට සුපෝෂිත පෝෂණ සුසංයෝගයක් සමඟින් දේශීයව නිපදවන ලද, 100% ස්වභාවික, ශක්තිජනක පානයක් දැන් වෙලඳපොලේ ඇත. ඉඟුරු, අඹ, කටු අනෝදා, පැෂන් යන විවිධ ස්වභාවික රසයන් හතරක් සමඟ පැණිරස කළ වේ. ප්‍රෝටීන් (Whey protein) බහුල මෙම පානය, වෙනත් ශක්තිජනක පාන අතරින් එහි කැපී පෙනෙන සුවිශේෂී සාධකය වන "ස්වාභාවික වීම" යන්න පෙරදැරිව සුපිරි වෙළඳසැල් රාක්ක මත ඉඩ හිමි කරගෙන සිටී.

මෙම නිෂ්පාදනය සංවර්ධනය කිරීමේ කාර්යයේදී අරමුදල් සපයන හවුල්කරු වශයෙන් ජාතික විද්‍යා පදනම විසින්, චිස් කර්මාන්තයේ අතුරු නිෂ්පාදනයක් වන, වේ ප්‍රෝටීන් නම් ඉහළ ශක්ති ප්‍රභවයක් අඩංගු වන, මෝරු භාවිතා කරමින් නව නිෂ්පාදනයක් සංවර්ධනය කිරීම සඳහා සහාය වීම සම්බන්ධයෙන් විමර්ශනය කරන ලදී. මෙම නව නිෂ්පාදන සංවර්ධන කාර්යය තුළින්, නව නිෂ්පාදන සංවර්ධනය, නව වෙළඳපොළක් හා නව රැකියා සඳහා මංපෙත් විවර කරමින් සහ දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නඟා සිටුවමින් මෙම අතුරු නිෂ්පාදනය අගය එකතු කළ වාණිජ නිෂ්පාදනයක් බවට පරිවර්තනය කිරීමට මග පෑදී ඇත. නිෂ්පාදිතය කල් තබා ගත හැකි කාලය, එහි ඉන්ද්‍රියග්‍රාහ්‍ය ගුණ සහ සංයුතිය සම්බන්ධයෙන් මෙම නිෂ්පාදනය කාර්මික තාක්ෂණ ආයතනයේදී පරීක්ෂාවට ලක් වී ඇත.

කිරි නිෂ්පාදන අංශයේ දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෙකු වන Lili Cheese පුද්ගලික සමාගම විසින් මෙම නිෂ්පාදනය සිදු කර ඇත. මෙය දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෙකු වෙතින් බිහි වන විප්ලවීය නිෂ්පාදනයක් වනු ඇති අතර, වෙළඳපල අවස්ථා ගවේෂණය කිරීම සඳහා එම ක්ෂේත්‍රයේ බොහෝ දෙනෙකුට මග පෙන්වීමක් වනු ඇත.

"Lili' සහ "ARPICO" යන සන්නාම යටතේ වන නිෂ්පාදන, සීමාසහිත Komarika International පුද්ගලික සමාගම විසින් අලෙවි කරනු ලැබේ. මෙම නිෂ්පාදනය සංවර්ධනය සඳහා සහාය TG/2016/Tech-D/06 තාක්ෂණික ප්‍රදානය යටතේ ලබාදුන් අතර "දේශීය සහ ස්වාභාවික" හැඳුනුම් සංකේතය සමඟින් නිෂ්පාදනය වෙළඳපොළට ඇතුළු කරන ලදී.





- ලංකා කුරුඳු සහ වල් කුරුඳු වර්ගවල රසායනික ඇඟිලි සලකුණු ක්‍රමය තහවුරු කිරීම.
- ලෝකය තුළ Cinnamon Zeylanicum -1st හි ජීනෝමය රැස් කිරීම.
- සම්පූර්ණ chloroplast ජීනෝම රැස් කිරීම.



- සංචාරක කර්මාන්තය සඳහා කුරුඳු මාවත හඳුනාගැනීම.



- ගෝලීය වෙළෙඳපොළේ අවකාශය ග්‍රහණය කර ගැනීම සඳහා



- ලංකා කුරුඳු වල දියවැඩියා මර්දන ගුණ ඇගයීම.


BIOCHEMISTRY, BIOPHYSICS AND MOLECULAR BIOLOGY

In vitro anti-diabetic effects and phytochemical profiling of novel varieties of *Cinnamomum zeylanicum* (L.) extracts

Research article | Biochemistry | Food Science and Technology | Plant Science | Pharmacology

W.A. Niroshani M. Wariyapperuma[1], Saganka Kannangara[2], Yasanandana S. Wijayasinghe[3], Sri Subramanium[4], Bimali Jayawardena[1]

Published November 2, 2020

- කුරුඳු කොළවල තෙල් සාරය භාවිතයෙන් ස්වභාවික ප්‍රතිඔක්සිකාරක ඇතුළත් අත්වැසුම් නිෂ්පාදනය කිරීම.


OP 12-03: Method of incorporation of natural antioxidant from cinnamon leaf oil as an antioxidant into surgical and examination gloves

S Abiro[1], RD Gunaratne[2], PA Paranagama[3], KRD de Silva[1]

[1]Interdisciplinary Center for Innovations in Biotechnology & Neurosciences, Faculty of Medical Sciences, University of Sri Jayewardenepura, Sri Lanka

[2]Department of Biosystems Technology, Faculty of Technology, University of Sri Jayewardenepura, Sri Lanka

[3]Department of Chemistry, Faculty of Science, University of Kelaniya, Sri Lanka

පහත නිබන්ධන ඉදිරිපත් කරන ලදී.

- තත්ව සහ ආරක්ෂණ ප්‍රමිතීන්
- ශ්‍රමක්ෂමතා විද්‍යාවේ ආර්ථික විද්‍යාව
- ආහාර සුරක්ෂිතතාව සහ ගුණාත්මකභාවය
- කුරුඳු අගය දාම කාර්යය සඳහා ව්‍යවසායකත්ව මාර්ගෝපදේශය
- අගය දාමය සඳහා අලෙවිකරණ උපාය මාර්ගය
- මූලය අනාවරණය කරගැනීමේ හැකියාව



වෙනත් පර්යේෂණ හා සංවර්ධන නිමැවුම්

ජාතික මූලික අධ්‍යයන ආයතනයේදී (NIFS) සිදු කරන ලද ව්‍යාපෘතිය මගින් ජෛව ප්‍රතික්‍රියාකාරකයක් නිපදවා කාබනික කෘෂිකර්මාන්තයේ දී භාවිතා කිරීම සඳහා ජෛව පොහොර සහ ජෛව පාලන එන්නත් නිෂ්පාදනය කිරීම ආරම්භ කර ඇත.


50L Bioreactor installed at the NIFS laboratory

පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් සිදු කරන ලද ව්‍යාපෘතිය මගින් මුහුණු ආවරණ සහ පෙරහන් ද්‍රව්‍යවල පෙරීමේ ධාරිතාව මැනීම සඳහා අඩු වියදම් අංශු පෙරහන් විශ්ලේෂකයක් නිපදවා ඇත.

ප්‍රදාන අංකය : RG/2016/BT/03
ප්‍රධාන අන්වේෂක : ආචාර්ය ඒ අරුල්කාන්තන්
පශු ව්‍යාධිජීවවිද්‍යා අධ්‍යයනාංශය
පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ව්‍යාපෘති මාතෘකාව : මිරිදිය විසිතුරු මසුන් අතර මයිකොබැක්ටීරියා රෝග පිළිබඳ අධ්‍යයනය



"Preparation for the PCR based assay for diagnosis of a disease in ornamental fish"

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් (gold fish, koi carps, guppy, molly, platy) අතර ඇතිවන මයිකොබැක්ටීරියා විශේෂ හඳුනා ගැනීම සහ අණුක නිර්ණයාත්මක ශිල්පීය ක්‍රමයක් නිර්මාණය කිරීමය. ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් විශේෂ අතර ප්‍රධාන වශයෙන් *M. fortuitum* ඇතුළු මයිකොබැක්ටීරියා විශේෂ බහුලව ව්‍යප්ත බව මෙම අධ්‍යනයෙන් අනාවරණය වන ලදී. මෙම අධ්‍යනයේදී වලංගුභාවයට පත්කරනු ලැබූ Internal Transcribed Spacer (ITS) PCR පරීක්ෂාව මසුන් තුළ මයිකොබැක්ටීරියා රෝග නිර්ණය සඳහා ක්ෂණික රසායනාගාර නිර්ණයාත්මක මෙවලමක් ලෙස භාවිතා කළ හැකිය. ශ්‍රී ලංකාවේ විසිතුරු මත්ස්‍ය අංශය වැඩිදියුණු කිරීම සඳහා විසිතුරු මසුන්ගේ සෞඛ්‍යයමත්භාවය තහවුරු කිරීම පිණිස ජාතික මෙහෙවරක් ලෙස, මෙම අධ්‍යනයේදී වලංගුභාවයට පත්කරනු ලැබූ නිර්ණයාත්මක ශිල්පීය ක්‍රම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජලජ සත්ව රෝග හඳුනාගැනීමේ හා පර්යේෂණ මධ්‍යස්ථානයෙදී රජය, පෞද්ගලික අංශය, ගොවීන්, ජලාලමින්මැදුර අයිතිකරුවන් හා මහජනතාවට භාවිතා කිරීමට ඉඩ සලසා ඇත.

ප්‍රදාන අංකය : RG/2016/BT/04
ප්‍රධාන අන්වේෂක : මහාචාර්ය රනිල් දසනායක
රසායන විද්‍යා අධ්‍යයනාංශය
විද්‍යා පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය

ව්‍යාපෘති මාතෘකාව : *Pichia pastoris* යීස්ට් මාදිලි පද්ධතිය තුළ RNA නිරෝධන මාර්ගයෙහි ජාන සුසංයෝගී ප්‍රතිනිර්මාණය

RNA නිරෝධනයේදී ඉලක්කය විනාශ කිරීමේදී ඉන්-සිලිකෝ ක්‍රමයට නිර්මාණය කරන ලද dsRNA කෙතරම් සඵලදායී දැයි පරීක්ෂා කිරීම පිණිස මෙම අධ්‍යනයේදී නිර්මාණය කරන ලද ජාන සුසංයෝගී *P. pastoris* මාදිලිය භාවිතා කළ හැකි අතර එසේ නොමැති නම් එය ඉහළ වියදමක් හා කාලයක් ගතවීම හේතුවෙන් සෛලීය රෝපිත තුළ පරීක්ෂා කිරීමට අපහසු ය.



P. pastoris GS115 colonies transformed with linearized pPICZ A-Gal1-EGFP

පූර්ණ වශයෙන් ස්ථාපිත වූ පසු EGFP සලකුණ තැබූ යීස්ට් ප්‍රකාශන වාහකය සහ RNAi ප්‍රකාශක ජාන සුසංයෝගී *Pichia pastoris* මාදිලිය ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන අංශය වෙත ලබා ගත හැකි වනු ඇත.

ප්‍රදාන අංකය : RG/2017/EB/01
ප්‍රධාන අන්වේෂක : මහාචාර්ය චන්දිමා දංගල්ල
සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශය
විද්‍යා පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය

ව්‍යාපෘති මාතෘකාව : ශ්‍රී ලංකාවේ රුක්වාසී වග කුරුමිණියාගේ (*Coleoptera" Cicindelidae*) විවිධත්වය, ව්‍යාප්තිය සහ වාසස්ථාන ආකාර



Dorsal view of Neocollyris (Stenocollyris) vedda Male

රුක්වාසී වග කුරුමිණියන් ශ්‍රී ලංකාවේ අඩු වශයෙන් අධ්‍යයනයට ලක්වූ විලෝපික කෘමීන් කාණ්ඩයකි. දිවයින තුළින් විශේෂ 30 ක් හා ඉන් 23ක් ඒකදේශීය බව පසුගිය ප්‍රකාශන මගින් වාර්තා වෙයි. කෙසේ නමුත්, ප්‍රකාශන වසර 100ටත් වඩා ඇතට දිවෙන අතර බෙහෙවින් යල් පැන ගොස් ය. එමනිසා, මෙම ඉහළ ඒකදේශිකත්වයක් සහිත මෙම කුරුමිණි කාණ්ඩය සම්බන්ධ වත්මන් අධ්‍යයන අවශ්‍ය විය. සියළු දේශගුණික කලාප සහ පළාත් ද, දිස්ත්‍රික්ක 20 ක් ද ඇතුළත් වන සේ රට තුළ ස්ථාන අසූ පහක් ගවේෂණය කරන ලද අතර විවිධ වාසස්ථාන ආකාර සමීක්ෂණයට ලක්විය. රුක්වාසී වගකුරුමිණි විශේෂ, ඔවුන්ගේ හටගැනීම් ස්ථාන, ඔවුන්ගේ හටගැනීම් ස්ථානවල පාරිසරික පරාමිතීන්, රූපවිද්‍යාව හා රූපමිතිකවලින් සමන්විත වන දත්ත පදනමක් නිර්මාණය කරන ලද අතර ශ්‍රී ලංකාවේ වගකුරුමිණි විශේෂ සඳහා ස්වයංක්‍රිය හඳුනා ගැනීමේ පද්ධතියක් නිර්මාණය කිරීම පිණිස භාවිතා කරන ලදී.

ප්‍රදාන අංකය : RG/2017/EB/05
ප්‍රධාන අන්වේෂක : ආචාර්ය එන් පී එසී කුඹුරේගම
සත්ව විද්‍යාඅධ්‍යයනාංශය
විද්‍යා පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ව්‍යාපෘති මාතෘකාව : නුවර එළිය (NE) දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික භූමිවල භෞමික ගැස්ට්‍රොපෝඩා පළිබෝධවල ව්‍යාප්තිය, ඔවුන්ගේ සුලභතාවය සහ වගාවන්ට හානි සිදු කරන ප්‍රමාණය

කෘෂිකාර්මික භූමිවලින් භෞමික ගැස්ට්‍රොපෝඩාවන් විශේෂ 14ක් හඳුනා ගන්නා ලදී. 64% ක් විදේශීය පළිබෝධ විශේෂ වූ අතර 36%ක් දේශීය විශේෂ විය. විදේශීය ගැස්ට්‍රොපෝඩාවන් කෘෂිකාර්මික භූමිවල බහුලව ව්‍යාප්තව සිටි අතර ඔවුන් පාරිසරික සාධක කෙරෙහි පුළුල් පරාසයක ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්වන ලදී. උන්නතාංශය, වර්ෂාපතනය සහ වායුගෝලීය පීඩනය විදේශීය විශේෂ සඳහා ප්‍රධාන පාලක සාධක වූ අතර මනින ලද සියළු පාරිසරික සාධක ඒකදේශීය හා දේශීය විශේෂවල ව්‍යාප්තියට බලපාන ලදී. එබැවින් ස්වභාවික වාසස්ථානවලට සිදු කරන ඕනෑම වෙනසක් දේශීය විශේෂවලට හානිකර ලෙස බලපාන අතර විදේශීය විශේෂ එවැනි පරිසර හිතකර වනු ඇත. නුවර එළිය දිස්ත්‍රික්කය තුළ විදේශීය පළිබෝධ හා දේශීය ගැස්ට්‍රොපෝඩා විශේෂවල ව්‍යාප්තිය හා බහුලතාවය පිළිබඳ තොරතුරු, භූමි නිර්මාණ සැලසුම්කරණය සහ වාසස්ථාන පරිණාමණය හා සම්බන්ධ කළමණාකරණ සැලසුම් සකස් කිරීමේදී ආධාරක විය හැකියි



නුවරඑළිය දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ඉඩම්වල භෞමික ගැස්ට්‍රොපෝඩාවන් විශේෂ ව්‍යාප්තිය.

A) Exotic pest snail ගොළුබෙලි විශේෂයේ ව්‍යාප්තිය,
B) Exotic pest slug හම්බෙලි විශේෂයේ ව්‍යාප්තිය සහ
C) දේශීය විශේෂවල ව්‍යාප්තිය

ප්‍රදාන අංකය : RG/2016/BS/01
ප්‍රධාන අන්වේෂක : මහාචාර්ය ආර් එම් ජී රාජපක්ෂ
රසායන විද්‍යා අධ්‍යයනාංශය
විද්‍යා පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ව්‍යාපෘති මාතෘකාව : නැවත ආරෝපණය කළ හැකි කෝෂ සහ සුපිරි ධාරිත්‍රක සඳහා භාවිතා කිරීමට අයනික ද්‍රව පාදක ජෙල් බහුඅවයවික විද්‍යුත් විච්ඡේද සංස්ලේශණය හා ලක්ෂණ හඳුනා ගැනීම

රාත්‍රියේදී පවා වැඩ කිරීමට අවස්ථාව ලබාදෙමින් අධෝරක්ත විකිරණ සමග පමණක් ක්‍රියාකාරී වන වර්ණ සංවේදීකෘත සූර්ය කෝෂ (DSC) නිර්මාණය කිරීම පිණිස ආරෝහණය කරන ලද අධෝරක්ත විකිරණ භාවිතා කිරීමේ මුළුමණින්ම නවමු සංකල්පය මත මෙම ව්‍යාපෘතිය පාදක වෙයි. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මගින් එකිනෙකට වෙනස් ෆෝටෝන ආරෝහක පද්ධති තුනක් නිර්මාණය කරන ලදී.

පද්ධතිය 1: අන්තරික ලෝහ අයන මාත්‍රණය කළ TiO_2 - මේ ආකාරයේ ආරෝහණය DSC යෙදවුම් සඳහා සුදුසු නැත. කෙසේ නමුත්, මෙම ආරෝහණ උත්ප්‍රේරක හයිඩ්‍රජන් වායුව ජනනය කිරීම පිණිස ජල ෆෝටෝන විභේදනයේදී ඉහළින් සිටිය. එමනිසා, මෙම උත්ප්‍රේරක ප්‍රමාණකරණය සහ ඉහළ මට්ටමකට නැංවීම පිළිබඳ වැඩිදුර පර්යේෂණ හරිත ශක්ති ජනනය කිරීම පිණිස හයිඩ්‍රජන් වායුව නිෂ්පාදනය කිරීම වෙත යොමු කළ යුතුය.



System 1



System 3

පද්ධතිය 2: ලැන්තනයිඩ අයන මාත්‍රණය කළ TiO_2 - මෙය, පළමු වතාවට අධෝරක්ත ප්‍රදීපනය යටතේ පමණක් ක්‍රියාකාරීවීමට සූර්ය කෝෂයක් නිර්මාණය කළ නවමු සොයා ගැනීමකි. එනම් රාත්‍රියේදී පවා ක්‍රියාකාරී වන සූර්ය කෝෂයක් නිර්මාණය කිරීම පිණිස වූ අපගේ යෝජනාව මිථ්‍යාවක් නොව යථාර්ථයකි. ආරෝහණය කළ අධෝරක්ත විකිරණ සමග ක්‍රියාකාරීවීමට සූර්ය කෝෂ නිර්මාණය කළ හැකිය යන සංකල්පය මෙම අධ්‍යනයෙන් ඔප්පු විය.

පද්ධතිය 3: ස්වාභාවික වර්ණක පදනම් කරගත් වර්ණ සංවේදීකෘත සූර්ය කෝෂ (DSCs) - ස්වභාවික වර්ණක භාවිතා කරමින් නිපදවන ලද වර්ණ සංවේදීකෘත සූර්ය කෝෂ (DSCs) සතුව ඉතා වැඩිදියුණු වූ රාක්ක-ආයු කාලයක් සහ මෙම වර්ණකය සඳහා වාර්තාගත ඉහළම කාර්යක්ෂමතාව පවතින බව මෙම අධ්‍යනය මගින් පෙන්වා දෙයි. මෙම පර්යේෂණය ඉහළ මට්ටමකට දියුණු කිරීම වැදගත් වේ.



System 2

ප්‍රධාන අංකය : RG/2017/AG/04

ප්‍රධාන අන්වේෂක : ආචාර්ය ඩබ් එම් පී බී වීරසිංහ
පශු වෛද්‍ය පර්යේෂණ ආයතනය
පේරාදෙණිය

ව්‍යාපෘති මාතෘකාව : දේශගුණික විපර්යාස හමුවේ කිරි නිෂ්පාදනය තිරසාර ලෙස වැඩිදියුණු කිරීම පිණිස අලුතින් හඳුන්වා දුන් සත්වාහාර නාලස්ථව (In-vitro) හා ජීවස්ථව (in-vivo) තෝරා ගැනීම

ශ්‍රී ලංකාව දැනට කිරි අවශ්‍යතාවයෙන් 60%ක් පමණ ආනයනය කරනු ලැබේ. රටෙහි කිරි නිෂ්පාදන සංවර්ධනය කෙරෙහි වන ප්‍රධාන බාධාවක් ලෙස කිරි එළදෙනුන්ගේ පෝෂණය මඳවීම හඳුනා ගෙන ඇත. පවතින දළ ආහාර වර්ග පෝෂ්‍ය ගුණයෙන් අඩු ය. අමතරව, ඒවායේ පෝෂ්‍ය ගුණය, විශේෂයෙන්ම ජීර්ණයවීමේ හැකියාව පිළිබඳ පරාමිතීන් ප්‍රමාණවත් නොමැති හෝ ඇත්තේම නැත. මේ නිසා, කිරි එළදෙනුන්ගේ ආහාර පංගුව නිසිලෙස සමබල කිරීම අපහසු වී ඇති අතර එබැවින් රටෙහි කිරි ගව පට්ටියෙන් බහුතරයකට කිරි නිෂ්පාදනය සඳහා වන ජානමය විභවතාවය ළඟා කර ගත නොහැකි වී ඇත. රටෙහි කිරි එළදෙනුන්ගේ කිරි නිෂ්පාදනය වැඩි කිරීම පිණිස, අලුතෙන් හඳුන්වා දුන් සත්වාහාර වර්ගඵලදායී ලෙස භාවිතා කළ හැකි බව මෙම ව්‍යාපෘතිය මගින් පෙන්වා දෙන ලදී. තෘණ වර්ග තුනකින් (තෘණ බඩ ඉරිඟු උක් ගස්, නේපියර් දෙමුහුම් CO-3 සහ CO-4) සාදන ලද සයිලේජ ආහාරවල මෙන්ම ඒවායේ සංයෝජනවලද පෝෂණ හා භෞතික ගුණ ඇගයීමට ලක් කරන ලදී. ගොවිපළ භාවිතය වෙනුවෙන් මෙන්ම වාණිජමය සයිලේජ ආහාර නිෂ්පාදනය වෙනුවෙන් ද මෙම සොයා ගැනීම් ප්‍රයෝජනයට ගත හැකිය. බඩ ඉරිඟු වැනි අඩු තන්තු, වැඩි ශක්ති ආහාර නේපියර් ප්‍රභේදවලට වඩා අඩුවෙන් මීතේන් නිපදවයි. මෙම අතිශය වැදගත් තොරතුර වඩා හොඳ ආහාර සැපයීම පිණිස භාවිතා කළ හැකි අතර එමගින් රෝමන්ථකයන්ගෙන් සිදුවන මීතේන් නිෂ්පාදනය අඩු කරමින් කිරි ගවයින්ගේ නිෂ්පාදන හැකියාව වැඩිදියුණු කළ හැකිය. ජාතික කිරිගව පට්ටිය මගින් සිදුවන මීතේන් විමෝචනය අඩු කිරීම ප්‍රතිපත්ති සැලසුම් කිරීමෙදී මෙම තොරතුර ප්‍රයෝජනවත් වේ.

ප්‍රදාන අංකය : TG/2017/Tech-D/03
ප්‍රධාන අන්වේෂක : මහාචාර්ය එන් එම් එම් ජී එස් බී නවරත්න
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

ව්‍යාපෘති මාතෘකාව : සංයුක්ත පිටිවලින් සකස් කරන ලද සහල් ආශ්‍රිත මුහුන් කළ ආහාර නිෂ්පාදනවල සිදුරු -කැටිති ව්‍යුහය වැඩිදියුණු කිරීම පිණිස පැසවීමේ කුටීරයක් නිර්මාණය කිරීම

සාමාන්‍යයෙන් මුහුන්කරණ ක්‍රියාවලිය අතරතුර දී සකස් කෙරෙනු ලබන පිළිස්සූ (baked) ආහාර නිෂ්පාදනවල කැටිති ව්‍යුහයට ඉතා වැදගත් කාර්යභාරයක් ඇත. තිරිඟු පිටිවල, ග්ලූටන් ප්‍රෝටීනවලට පිටි මෝලිය තුළම වායූන් සිරකිරීමේ හැකියාවක් ඇත. සහල් පිටිවල ග්ලූටන් නොමැති බැවින්, එයට මුහුන් වූ වායු සිරකර ගැනීමට ඇති හැකියාව අඩු ය. එමනිසා, පැසවීමට ලක්වූ සහල් ආශ්‍රිත ආහාර නිෂ්පාදනවල මනාව විකසනය වූ සිදුරු-කැටිති ව්‍යුහය නිර්මාණය කිරීම අතිශය අපහසුය. මෙම අධ්‍යනයේ අරමුණ වන්නේ සහල් ආශ්‍රිත සංයුක්ත පිටිවලින් මනා සිදුරු-කැටිති ව්‍යුහය සහ වඩාත් හොඳ වයන ලක්ෂණ සහිත පෝෂදායී මුහුන්කළ පිළිස්සූ (baked) ආහාර නිෂ්පාදන සකස්කිරීම සහ වඩාත් හොඳ කැටිති ලක්ෂණ ලබාගැනීම පිණිස භාවිතා කළ හැකි තාක්ෂණය හා යාන්ත්‍රණ ආහාර කර්මාන්තයට හඳුන්වාදීමයි. මෙම නිෂ්පාදන සකස් කිරීම පරිභෝජකයන්ට පුළුල් පරාසයක සහල් ආශ්‍රිත සෞඛ්‍ය සම්පන්න නිෂ්පාදන ලබාගැනීමට හැකිවන පරිදි සහල් පරිභෝජනය විවිධාංගිකරණය කිරීම, සහල් සඳහා ඉල්ලුම වැඩි කිරීම, ගොවීන්ගේ ආදායම වැඩිකිරීම සහ විදේශ විනිමය ඉතිරිකරමින් තිරිඟු පිටි අපනයනය අඩුකිරීමෙහි ලා වැදගත් වේ.


ගෘහස්ථ පැසවීමේ කුටීරය


වාණිජ මට්ටමේ පැසවීමේ කුටීරය


විස්කෝතු

ප්‍රදාන අංකය : TD/2016/Tech-D/02
ප්‍රධාන අන්වේෂක : මහාචාර්ය ඩී ජී ජී පී කරුණාරත්න
රසායන හා සැකසුම් ඉංජිනේරුවිද්‍යා අධ්‍යනාංශය
ඉංජිනේරු පීඨය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

ව්‍යාපෘති මාතෘකාව : ශ්‍රී ලාංකීය ඩොලමයිට් හුණුවලින් අගය එකතු කළ නිෂ්පාදන සංස්ලේශණය සහ වාණිජ්‍යකරණය



(a). Behavior of water in a non-treated fabric and (b). behavior of water in a hydrophobic polyester fabric developed using Super Hydrophobic PCC (a',b') inner structures of the fabric

මෙම ව්‍යාපෘතිය මගින් කැල්සියම් හා මැග්නීසියම් පාදක අගය එකතු කළ නිෂ්පාදන සංස්ලේශණය කිරීමට නව්‍ය, පිරිමැසුම්දායක, සහ කර්මාන්තමය වශයෙන් ශක්‍යතාවය සහිත ශිල්පීය ක්‍රම හඳුනා ගෙන ඇත. නැනෝ-සහභාගීත්ව කැල්සියම් කාබනේට් (NPCC), නැනෝ-මැග්නීසියම් හයිඩ්‍රොක්සයිඩ් (NMH), නැනෝ-MgO" සුපිර්හයිඩ්‍රොෆෝබික් සහභාගීත්ව කැල්සියම් කාබනේට් (SHPCC), SHPCC ආලේපිත රෙදිපිළි වැනි නිෂ්පාදන සහ ඉතා ඉහළ කර්මාන්තමය යෙදවීමක් සහිත NPCC/ ස්වභාවික රබර් (NR) සංයුක්ත සංස්ලේශණ ක්‍රියාවලි නිර්මාණය කර ඇත. PCC පාදක නැනෝ අංශු පුළුල් වශයෙන් කඩදාසි, රෙදිපිළි, රබර්, ප්ලාස්ටික්, රූපලාවන්ය, කාන්දු වළක්වන ද්‍රව්‍ය, දන්තාලේප, තීන්ත සහ ආහාර කර්මාන්වල දී භාවිතා වන අතර NMH පොලිමර් (බහුඅවයවික), ප්ලාස්ටික් නිෂ්පාදනවල ගිනි ඇවිළීම පාලනය කරන පිරවුමක් ලෙස ප්‍රධාන වශයෙන් භාවිතා වේ. මෙහිදී, ඉලක්ක අයන නිස්සාරණය කිරීමෙන් ආරම්භ ව අවසාන නැනෝ අංශු සංස්ලේශණය දක්වා ක්‍රියාවලි ද වැඩිදුරටත් ඒවා නැනෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම පිණිස අනුබද්ධ කර ගැනීම ද අධ්‍යනය කොට ප්‍රශස්තකරණය කොට ඇත. තවදුරටත්, නැනෝ අංශු සංස්ලේශණ ක්‍රියාවලිය පහසු කරවීමට හා ක්‍රියාවලිය කෙරෙහි ඉහළ මට්ටමක පාලනයක් යටතර ගැනීමට භ්‍රමණය වන තැටි ප්‍රතික්‍රියකයක් (spinning disk reactor) පිරිසැකසුම් කොට ඇත. ක්‍රමයෙන්, සංස්ලේශණ ක්‍රියාවලිය සිදුකරගෙන යාම පිණිස නියමු පිරියතක් සූදානම් කර ඇත.

විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ දැක්වූ විශිෂ්ටතා හඳුනාගැනීම

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සාමාජීය සමෘද්ධිය උදෙසා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කරන ජාතියේ ප්‍රමුඛතම ගාමක බලවේගය වන ජාතික විද්‍යා පදනම විසින්, තම අදාළ ක්ෂේත්‍ර තුළින් විද්‍යාව හා තාක්ෂණය උදෙසා විශිෂ්ට දායකත්වයක් ලබා දුන් ශ්‍රී ලාංකීය විද්‍යාඥයින්/ඉංජිනේරුවන් හඳුනාගැනීම, ඔවුන්ට උපහාර කිරීම සහ දිරිගැන්වීම සඳහා වාර්ෂිකව ජාතික විද්‍යා පදනම් සම්මාන උළෙල සංවිධානය කරනු ලබයි. ඒ අනුව, ජාතික විද්‍යා පදනම් සම්මාන 2021 උළෙල ලෝක විද්‍යා දින සැමරුම් උත්සවයේ අංගයක් ලෙස නොවැම්බර් 16 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) පැවැත්විණි. එහිදී පහත සඳහන් කාණ්ඩ යටතේ සම්මාන 20ක් පිරිනමන ලදී.

» ජාතික විද්‍යා පදනම් තාක්ෂණ සම්මාන
» පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන සහය යෝජනා ක්‍රමය (SUSRED)

පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන සහය යෝජනා ක්‍රමය මගින් ජීවයෙන් පිරි ගතික පර්යේෂණ සංස්කෘතියක් තුළ පුහුණු/සුදුසුකම් ලත් පර්යේෂණ පිරිස් වර්ධනය කරමින් ජාතික පර්යේෂණ පද්ධතිය ශක්තිමත් කෙරේ. මෙම වසරේදී පර්යේෂකයන් 37 දෙනෙකුගෙන් සමන්විත අධීක්ෂණ කණ්ඩායම් 19ක් ආචාර්ය උපාධි 14ක් සහ දර්ශනපති උපාධි 5ක් බිහි කිරීම වෙනුවෙන් සම්මාන ලබා ගැනීමට සමත් විය. තාක්ෂණ සම්මාන යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ආර් ජී එන් මීගම මහතා වෙත ප්‍රශංසා සහතිකයක් පිරිනමන ලදී.





රූප සටහන 18 : පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන සහය යෝජනා ක්‍රමය යටතේ විවිධ ආයතන නියෝජනය කරමින් සම්මාන හිමි කරගත් පිරිස්

ඉහළ මට්ටමේ විශ්ලේෂණ සහ පර්යේෂණ උපකරණ දත්ත පද්ධතිය

ජාතික විද්‍යා පදනම විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනවල දැනට පවතින ඉහළ මට්ටමේ විශ්ලේෂණ සහ පර්යේෂණ උපකරණ පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමේ අරමුණින් දීප ව්‍යාප්ත සමීක්ෂණයක් දියත් කරන ලදී. පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ උන්නතිය සහ සම්පත් සංරක්ෂණය සඳහා මූලික වනුයේ පවතින උපකරණ ඵලදායී ලෙස බෙදාගැනීම සහ භාවිතා කිරීම වන බැවින්, දැනට රටෙහි පවතින උපකරණ පිළිබඳ සවිස්තරාත්මක දත්ත පද්ධතියක් ලබා දීම මෙම මුලපිරීම තුළින් පරිපූර්ණ ලෙස අපේක්ෂා කරන ලදී.

මෙම දීප ව්‍යාප්ත සමීක්ෂණය 2020 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර දත්ත පද්ධතිය 2021 පෙබරවාරි මාසයේදී සකස් කරන ලදී. 2021 සැප්තැම්බර් මාසය වන විට විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන යන කාණ්ඩ ද්විත්වයම වෙතින් තොරතුරු ඇතුළත් කිරීම් 650 ක් පමණ දත්ත ගබඩාවට ඇතුළත් කර ඇත.

උසස් තාක්ෂණික උපකරණ/සේවා හඳුනාගැනීම මගින් ජාතික/ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව විශ්වවිද්‍යාල/ආයතනයන්හි රසායනාගාර ප්‍රතිතනය ලබා ගැනීම සඳහා මෙම ක්‍රියාකාරකම නව යොමුවක් සහිතව නැවත මෙහෙයවා පුළුල් කරන ලදී.

යෝජිත ජාතික උපකරණ දත්ත පද්ධතිය CodeIgniter රාමුව භාවිතා කරමින් මාර්ගගත වේදිකාවක් ලෙස සකස් කෙරෙමින් පවතින අතර මෙමගින් දත්ත ලබා ගැනීම සඳහා පෙර-ලියාපදිංචිය අවශ්‍ය නොවේ. දත්ත පද්ධතිය වෙතින් රැස් කරගන්නා තොරතුරු පරිශීලකයින්ට මෙන්ම තීරණ ගන්නා පුද්ගලයින්ටද ප්‍රයෝජනවත් වනු ඇත.

ඩිජිටල් වේදිකාව හරහා සම්පත් භාවිතයට ගැනීම

ධාරිතා සංවර්ධනය සහ දැනුම හුවමාරුව සඳහා අවස්ථාව සලසා දෙමින් විදේශගත සම්පත් දායකයින්ගේ සහභාගීත්වයෙන් දැනුම හුවමාරු කිරීමේ වෙබිනා වැඩසටහන් මාලාවක් සංවිධානය කරන ලදී (*වගුව 5 සහ 6*) ජාතික මට්ටමේ ඉහළ ප්‍රමුඛතා ගැටළු කිහිපයක් වෙත විසඳුම් සාකච්ඡා කරමින් උසස්ම දැනුම හුවමාරු කර ගැනීමට මෙය උපකාරී වූ අතර එමඟින් පර්යේෂකයන්ට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට හොඳම භාවිතයන් උපයෝජනය කරගැනීමට හැකියාව ලැබුණි.

වගුව 05: ඩිජිටල් වේදිකාව හරහා දැනුම හුවමාරු කරගැනීමේ වෙබිනා වැඩසටහන්

වැඩසටහන සහ අරමුණ	අරමුණ	සහභාගී වූ සංඛ්‍යාව
ශ්‍රී ලංකාවට බලපෑම් ඇති කරන ලවණතාවයේ විවිධ පැතිකඩ සහ විසඳුම් යන මැයෙන් වෙබිනා වැඩසටහන	ලවණතා ගැටළුව අවම කිරීම සඳහා භාවිතා කරන නවතම තාක්ෂණයන් සහ හොඳම භාවිතයන් සම්බන්ධයෙන් ශ්‍රී ලාංකීය පර්යේෂකයන් සහ අදාළ අනෙකුත් පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම.	120
ඉහළ බලපෑමක් ඇති සඟරා සඳහා ලිපි ලිවීම: පර්යේෂකයින් සඳහා මාර්ගෝපදේශයකී යන මැයෙන් වෙබිනා වැඩසටහන	ඉහළ බලපෑමක් ඇති සඟරා ඉලක්ක කර සඟරා ලිපි ලිවීමෙහිලා පර්යේෂකයන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම හා එමඟින් ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් කෙරෙන විද්වත් ප්‍රකාශන සංඛ්‍යාව ඉහළ නැංවීම.	765
ඩිජිටල් වේදිකාව මගින් සැපයෙන සේවාවන් පිළිබඳ වැඩි දියුණු කරන ලද දැනුවත්භාවය මැයෙන් වෙබිනා වැඩසටහන	පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම් වෙතින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා ශ්‍රී ලාංකික පර්යේෂකයන් සහ විදේශයන්හි වෙසෙන්නන් අතර සම්බන්ධතා ගොඩනැංවීම	65
එක්ස්ප්‍රස් පර්ල් කාගෝ නැව මුහුදුබත් වීම: එහි ප්‍රතිවිපාක ඉන් ගම්‍ය වන දෑ සහ ඒ සඳහා පිළියම් යන මැයෙන් මාර්ගගත සාකච්ඡාව	සමුද්‍රීය පරිසර දූෂණය අවම කිරීම සඳහා භාවිතා කරන නවතම තාක්ෂණයන් සහ හොඳම භාවිතයන් සම්බන්ධයෙන් ශ්‍රී ලාංකීය පර්යේෂකයන් සහ අදාළ අනෙකුත් පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම.	15
ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අධ්‍යාපන තොරතුරු පද්ධතියේ ශාස්ත්‍රීය හා පර්යේෂණ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට දායක විය හැක්කේ කෙසේදැ යන මැයෙන් වෙබිනා වැඩසටහන	පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම් වෙතින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා ශ්‍රී ලාංකික පර්යේෂකයන් සහ විදේශයන්හි වෙසෙන්නන් අතර සම්බන්ධතා ගොඩනැංවීම	365
පර්යේෂණ සඳහා ආචාර ධර්ම, යන මැයෙන් වෙබිනා වැඩසටහන	නව දැනුම හුවමාරුව	237
අන්තර්ක්ෂේත්‍ර අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘතියක් වශයෙන් ආචාර්ය උපාධි පර්යේෂණ යෝජනාවක් පිළියෙල කරන්නේ කෙසේද, මැයෙන් මහාචාර්ය දන්තුරේ වික්‍රමසිංහ විසින් පවත්වන ලද වෙබිනා වැඩසටහන	ප්‍රදාන දිනාගැනීමට තරඟකාරී යෝජනා ඉදිරිපත් කිරීම සඳහා තරුණ පර්යේෂකයින්ගේ ධාරිතාව ඉහළ නැංවීම	422
පොසිල ඉන්ධන වෙතින් පුනර්ජනනීය බලශක්තීන් වෙත: ප්‍රායෝගික සහ සාකල්‍ය ප්‍රවේශයක්, යන මැයෙන් වෙබිනා වැඩසටහන	පුනර්ජනනීය බලශක්ති සම්පත් භාවිතයට ගැනීම සම්බන්ධයෙන් පවතින නවතම පර්යේෂණ ප්‍රවණතා හා උපායමාර්ග පිළිබඳ ශ්‍රී ලාංකීය පර්යේෂකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීම	180
ඉංජිනේරු නිපුනි කරුණාරත්න, Rolls Royce PLC, UK විසින් පවත්වන ලද වෙබිනා වැඩසටහන	විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන අංශයේ පවතින ගෝලීය අවස්ථා පිළිබඳ පාසල් සිසුන් සහ උපාධි අපේක්ෂකයින් අභිප්‍රේරණය කිරීම	265

වගුව 06: ධාරිතා සංවර්ධනය ඉලක්ක කොට පවත්වන ලද වෙබිනා වැඩසටහන් බලපෑම් පරාමිතීන් කිහිපයක්

මාතෘකාව	බලපෑම් පරාමිතිය	සංඛ්‍යාව
ඉහළ බලපෑමක් ඇති සඟරා සඳහා ලිපි ලිවීම: පර්යේෂකයින් සඳහා මාර්ගෝපදේශයක්	පිළියෙල කරන ලද අත්පිටපත් සංඛ්‍යාව	12
	සඟරා සඳහා ඉදිරිපත් කරන ලද ලිපි සංඛ්‍යාව	10
	සම්සුරු සමාලෝචිත සඟරාවන්හි පළ කරන ලද ලිපි සංඛ්‍යාව	5
	සුචිගත සඟරාවන්හි පළ කරන ලද ලිපි සංඛ්‍යාව	1
ජාත්‍යන්තර ප්‍රදාන අත්කරගැනීම සඳහා ජයග්‍රාහී යෝජනා ලිවීම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා කාර්යාලය සහ ශ්‍රී ලංකා තරුණ විද්‍යාඥයින්ගේ විද්‍යායතනය සමග සහයෝගීත්වයෙන් සහ 425 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.	ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතන ඉලක්ක කොට පිළියෙල කළ/	2
	පිළියෙල කෙරෙමින් පවතින යෝජනා සංඛ්‍යාව	1
	ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතන වෙත ඉදිරිපත් කරන ලද යෝජනා සංඛ්‍යාව	1
අන්තර්ක්ෂේත්‍ර අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘතියක් වශයෙන් ආචාර්ය උපාධි පර්යේෂණ යෝජනාවක් පිළියෙල කරන්නේ කෙසේද,	වැඩිදුර මාර්ගෝපදේශ ලබාගැනීම සඳහා සම්පත් දායකයා සම්බන්ධ කරගත් සිසුන් සංඛ්‍යාව	07
	යෝජනාවක් සකස් කිරීම සඳහා දැනට පසුබිම් අධ්‍යනයක් සිදු කරමින් සිටින සිසුන් සංඛ්‍යාව	05
	යෝජනාව සකස් කිරීමේ විවිධ අදියරයන්හි සිටින සිසුන් සංඛ්‍යාව	26
	යෝජනාව සකස් කොට අවසන් කර සිටින /එය උසස් අධ්‍යාපන ආයතනයක් වෙත ඉදිරිපත් කර ඇති සිසුන් සංඛ්‍යාව	05



"අන්තර්ක්ෂේත්‍ර අධ්‍යයන පර්යේෂණ ව්‍යාපෘතියක් වශයෙන් ආචාර්ය උපාධි පර්යේෂණ යෝජනාවක් පිළියෙල කරන්නේ කෙසේද" මැයෙන් මහාචාර්ය දන්තුරේ වික්‍රමසිංහ විසින් පවත්වන ලද වෙබිනා වැඩසටහන



ලංකාවේ බනිජ සම්පත්වලට අගය එකතු කිරීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා එක්සත් රාජධානියේ StorTera සහ ශ්‍රී ලංකාවේ StorLion සමඟ සාකච්ඡා සිදු වෙමින් පැවතියේය.



අධි තාක්ෂණික පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්ට අදාළව මතුවෙමින් පවතින ගෝලීය අවස්ථා ග්‍රහණය කරගැනීම සඳහා ශ්‍රී ලංකාවට හැකියාව ලබාදෙමින් එක්සත් රාජධානියේ Ivy Tech Ltd සමාගමේ ශාඛාවක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීමේ හැකියාව සොයා බැලීම සඳහා එම සමාගම සමග සාකච්ඡා පැවැත්වෙමින් තිබුණි. එමෙන්ම මෙමගින් Ivy Tech Ltd හි නිර්මාතෘ සහ Rolls Royce, UK හි කළමණාකාර/ඩිජිටල් තාක්ෂණ, ඉංජිනේරු නිපුනි කරුණාරත්නගේ නායකත්වයෙන් ශ්‍රී ලංකාවට 2වන කාර්මික විප්ලවයේ සිට 4වන කාර්මික විප්ලවය දක්වා වේගයෙන් ඉහළට පැමිණීමටද හැකිවනු ඇත.

බ්‍රසීලයේ ABC ආයතනය සමඟ ඇති කරගත හැකි සහයෝගිතා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා උක් වගාව හා සම්බන්ධ පාර්ශවකරුවන් සමඟ හමුවක් ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ එක්ව සංවිධානය කරන ලද අතර එම හමුව අමාත්‍යාංශයේදී පැවති අවස්ථාව



නවෝත්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී හවුල්කාරිත්වයන් ගොඩනැගීම

විශ්ව විද්‍යාල හා කර්මාන්ත අතර සහයෝගිතාවන් ප්‍රවර්ධනය කොට නවෝත්පාදන හැකියාවන් ඉහළ නැංවීම සඳහා ජාතික විද්‍යා පදනම ශ්‍රී ලංකා ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය (NCE) සමඟ අත්වැල් බැඳ ගත්තේය. ජාතික විද්‍යා පදනම සහ ශ්‍රී ලංකා ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය එක්ව සිදු කරන මෙම පහසුකම් සැලසීම, නව නිෂ්පාදන සංවර්ධන කාර්යයේදී කර්මාන්ත ආශ්‍රිතව පවතින ගැටළු සහ තාක්ෂණික අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා ඉවහල් විය. Textrip Lanka (Pvt) Ltd, E-Silk Route iy D Samson Industries යන ආයතන විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ ඕස්ට්‍රේලියාවේ Deakin විශ්වවිද්‍යාලයේ පර්යේෂකයින් සමග අන්තර් ක්‍රියාකාරී සාකච්ඡා පවත්වන ලදී. Deakin විශ්ව විද්‍යාලයේ සේවය කරන ශ්‍රී ලාංකික විද්‍යාඥයා සහ Textrip Lanka (Pvt) Ltd. අතර ඇති කරගනු ලැබූ සහයෝගිතාවල ගෝලීය වෙළඳපොල තුළ සැලකිය යුතු වෙළඳපල ඉල්ලුමක් ඇති පැළඳිය හැකි/ඇදෙන සුළු සුහුරු බෑන්ඩ් (smart wearable / stretching bands) වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා උපකාරී විය.



Deakin විශ්වවිද්‍යාලයේ මහාචාර්ය පතිරණ සහ Textrip Lanka (Pvt) Ltd අතර පැවති මාර්ගගත හමුව

'Computational tactics for ODE model යන මැයෙන් පැවති වෙබිනා වැඩසටහන සහ ඉන් අනතුරුව 'බෝවන රෝග පිළිබඳ දත්ත සැකසීමේදී පවතින අභියෝග සහ අපේක්ෂාවන් විමර්ශනය කිරීම - ශ්‍රී ලාංකීය සන්දර්භය සඳහා තීරණ ආධාරක පද්ධතියක් ඇති කිරීමේ සාර්ථකම ක්‍රමය යන මැයෙන් ඉදිරිපත් කෙරුණු සංකල්ප සටහන මගින් වසංගත රෝග විද්‍යා ඒකකයේ, සෞඛ්‍ය තොරතුරු ඒකකයේ, වෛද්‍ය සංඛ්‍යාලේඛන ඒකකයේ, සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පර්යේෂකයන් සමඟ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ පර්යේෂකයන් සමග සහයෝගීතා හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමට උපකාරී විය. මෙම සම්බන්ධතා නිසා ඉහළ බලපෑමක් ඇති ප්‍රකාශන සහ තවදුරටත් පුළුල් කළ හැකි පර්යේෂණ සඳහා ඉඩ ප්‍රස්ථාව සැලසිණි.

- "An age-dependent model for Dengue transmission: Analysis and comparison to field data - ඩෙංගු සම්ප්‍රේෂණය සඳහා වයස මත පාදක වූ ආකෘතියක්: ක්ෂේත්‍ර දත්ත විශ්ලේෂණය සහ සැසඳීම" Applied Mathematics and Computations (2020) - Springer (SCI, Web of Science, SCOPUS indexed - Impact Factor 4.091) සඟරාවේ පළ විය. *https://www.sciencedirect.com/science/article/abs/pii/S009630032030494X?fbclid=IwAR17WaqB_Hmu4-mh-iZtKqbDS30IkonQsXN4IucC9_ hs_Dms2jIr1X7hOwE*
- "Reassessment of contact restrictions and testing campaigns against COVID-19 via spatio-temporal modeling –කොවිඩ් -19 ට එරෙහිව සම්බන්ධතා සීමා කිරීම් සහ පරීක්ෂණ පැවැත්වීමේ මෙහෙයුම් කාල අවකාශීය ආකෘතිකරණය හරහා නැවත තක්සේරු කිරීම" Nonlinear Dynamics (2021) - Springer (SCI, SCOPUS indexed - Impact Factor 5.022) සඟරාවේ පළ විය. *https://doi.org/10.1007/s11071-021-07111-w*

- 'IVY TECH' යනු එක්සත් රාජධානියේ ක්‍රියාත්මක වන, බහුවිධ ක්ෂේත්‍ර පර්යේෂණ සහ නවෝත්පාදන සමාගමක් වන අතර එය සිව්වන කාර්මික විප්ලවය (4IR) යථාර්ථයක් බවට පත් කිරීම සඳහා තාක්ෂණයන්ට හැකියාව ලබා දෙමින් සීමාවන් පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. IVY TECH' සමාගම සිය ශාඛාවක් ශ්‍රී ලංකාවේ පිහිටුවීම සඳහා උනන්දුවෙන් පසුවන අතර එහිදී අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිය වැඩි කරගැනීම සහ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ජාතික විද්‍යා පදනම සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයක් ගොඩනංවාගනු ඇත. මෙම හවුල්කාරිත්වය ආයතනික මට්ටමින් සහ ක්‍රියාකාරිත්වයක් ඇති කරනවා පමණක් නොව, ජාතියක් ලෙස 4 වන කාර්මික විප්ලවය වෙත යොමු වන පර්යේෂණ සහ නවෝත්පාදන උත්ප්‍රේරණය කිරීම සහ බලමුලු ගැන්වීම ද සිදු කරන බැවින් මෙම හවුල්කාරිත්වය හැරවුම් ලක්ෂ්‍යයක් වනු ඇත. එක්සත් රාජධානියේ Rolls Royce PLC හි ඩිජිටල් තාක්ෂණ කළමනාකරු ලෙස ද කටයුතු කරන විදේශගත ශ්‍රී ලාංකික වෘත්තිකයෙකු වන ඉංජිනේරු නිපුනි කරුණාරත්න, එක්සත් රාජධානියේ 'IVY TECH' ආයතනය ආරම්භ කිරීමට පුරෝගාමී වී ඇත. හවුල්කාරිත්වය ශක්තිමත් කිරීමට සහ ශ්‍රී ලංකාවේ විද්‍යා තාක්ෂණ නවෝත්පාදන අංශයේ ප්‍රගතිය සඳහා ඇති හැකියාව ප්‍රයෝජනයට ගැනීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් ඉංජිනේරු නිපුනි කරුණාරත්න සහ එක්සත් රාජධානියේ න්‍යෂ්ටික පර්යේෂණ මධ්‍යස්ථානයේ ආචාර්ය ෂෙහාන් ලෝව් සමග මාර්ගගත හමුවක් ජූනි 22 වැනි දින සංවිධානය කරන ලදී.



ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සමඟ අවබෝධතා ගිවිසුම හුවමාරු කරගනිමින්

අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබා ගන්නා සහ ශක්තිය ඉහළ නංවාගනු ලබන ආකාරයෙන් තාක්ෂණික සහයෝගය සහ පර්යේෂණ සහයෝගීතාව ඇතිකරගැනීම සඳහා ඉඩ ප්‍රස්ථා විවර කරමින් ජාතික විද්‍යා පදනම ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සමඟ උපායමාර්ගික හවුල්කාරිත්වයක් ගොඩනඟා ගත්තේය.

මේ සම්බන්ධයෙන් එම ආයතන දෙක අතර අවබෝධතා ගිවිසුමක් නොවැම්බර් 24 වන දින ජාතික විද්‍යා පදනමේදී අත්සන් කරන ලදී.

දේශීය පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා ජාත්‍යන්තර වශයෙන් අරමුදල් සැපයෙන අවස්ථා ගවේෂණය කිරීම

ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB)

- Arturo Falaschi ICGEB අධිශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පර්යේෂකයන් දෙදෙනෙකුට කෙටි කාලීන (මාස 3-8) පශ්චාත් ආචාර්ය උපාධි අධිශිෂ්‍යත්ව පිරිනමන ලදී. එම අධිශිෂ්‍යත්වවල වටිනාකම ආසන්න වශයෙන් අමෙරිකානු ඩොලර් 10,000 ක් විය.
- ICGEB වැඩසටහන යටතේ ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වෙත රටේ ඉහළ ප්‍රමුඛතාවක් සහිත පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා පහෙන් එක් අයදුම්පතක් ඇගයීමේ පළමු අදියරේදී එම මධ්‍යස්ථානය විසින් තෝරාගෙන ඇති අතර, දෙවන අදියරේ ඇගයීම් කටයුතු සිදු වෙමින් පැවතියේය. ජාතික විද්‍යා පදනම ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය හා ඒකාබද්ධව දේශීය පර්යේෂකයන් 190 දෙනෙක් සම්බන්ධ කරගනිමින් ICGEB-CRP යෝජනා ක්‍රමය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමේ වෙබිනා වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙය පර්යේෂකයන්ගේ උනන්දුව වැඩි කළ අතර පෙර වසරවලට සාපේක්ෂව 2021 වසරේ අයදුම්පත් කැඳවන අවස්ථාවේදී පෙරට වඩා තුන් ගුණයකට ආසන්න අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇත.



රූපසටහන 19: ජාන ඉංජිනේරු සහ ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථාන විසින් සිදු කරනු ලබන ප්‍රදාන කෙරෙහි දේශීය පර්යේෂකයින්ගේ උනන්දුව ඉහළ ගොස් ඇති ආකාරය

- ළමුන් අතර විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා එක්සත් ජනපද තානාපති කාර්යාලයෙන් රුපියල් 200,000ක් වටිනා ප්‍රදානයක් හිමි විය.

ශ්‍රී ලංකාවේ විද්‍යාල තාක්ෂණ හා නවෝත්පාදන භූ දර්ශනයේ ගෝලීය දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම

- ISC සම්මාන වැඩසටහන 2021 සඳහා ශ්‍රී ලාංකික පර්යේෂකයන්ගේ නාමයෝජනා 10 ක් පහත කාණ්ඩ යටතේ ඉදිරිපත් කරන ලදී.
    - පසුගිය වසර හත ඇතුළත තම ඉහළම අධ්‍යාපන සහතිකය හිමි කරගත් උපාධි අපේක්ෂකයා, පශ්චාත් උපාධි අපේක්ෂකයා හෝ විද්‍යාඥයා සඳහා හිමිවන Early career scientist සම්මාන
    - තිරසාරභාවය සඳහා විද්‍යාව සම්මාන
    - ප්‍රතිපත්ති සඳහා විද්‍යාව සම්මාන
- 2022 දී එළි දැක්වීමට නියමිත සිද්ධි අධ්‍යයන එකතුව සඳහා "විද්‍යා හා තාක්ෂණ ශ්‍රම බලකාය සංවර්ධනය" යන ගෝලීය පර්යේෂණ සභාවේ තේමාව යටතේ ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණයේ සාර්ථක සිද්ධි ලිවීමක් සකස් කරන ලදී.
- ජාතික විද්‍යා පදනම පහත දැක්වෙන පරිදි විදේශයන්හි පැවති විද්‍යාල තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයේ අවස්ථා නියෝජනය කළේය.
    - ගෝලීය පර්යේෂණ සභාවේ ආසියා පැසිෆික් කලාපීය වෙබිනා වැඩසටහන
    - ජපාන විද්‍යා හා තාක්ෂණ නියෝජිතායතනය විසින් "JST Connect" මැයෙන් පැවැත්වූ වෙබිනා වැඩසටහන් දෙක

- "සෞඛ්‍ය හදිසි අවස්ථා සඳහා ප්‍රජා කේන්ද්‍රීය ප්‍රවේශයන්: ප්‍රගතිය, පරතරයන් සහ පර්යේෂණ ප්‍රමුඛතා" පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ අවස්ථානුගත විචාරණයේදී "ප්‍රජා පාදක ප්‍රතිසාධනය" පිළිබඳ මණ්ඩල සාකච්ඡාව

- සකුරා විද්‍යා වැඩසටහන යටතේ ශ්‍රී ලාංකීය තරුණ පර්යේෂකයන් සඳහා පවතින ධාරිතා සංවර්ධන අවස්ථා ශක්තිමත් කිරීමේ අරමුණින් ජපාන විද්‍යා හා තාක්ෂණ නියෝජිතායතනය සමග ඒකාබද්ධව පවත්වන ලද ශ්‍රී ලංකා සකුරා විද්‍යා සමාජයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ 2වන හමුව



සකුරා විද්‍යා වැඩසටහනේ ආදි විද්‍යාර්ථීන්ගේ හමුව

- ගෝලීය පර්යේෂණ සභාවේ (GRC) වාර්ෂික මාර්ගගත රැස්වීම සහ ගෝලීය පර්යේෂණ සභාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමෙහි මාසික මාර්ගගත රැස්වීම් ගෝලීය ප්‍රවණතා සහ ජාලකරණය සමඟ සමව යමින් පවත්වන ලදී.

- ආසියානු සමාජ විද්‍යා පර්යේෂණ සභා සංගමය (AASSREC) විසින් සංවිධානය කරන ලද කොවිඩ්-19 අතරතුර සහ ඉන් පසුව අනාගතය සැලසුම් කිරීම: ආසියාව තුළ සමාජ විද්‍යාවන්හි කාර්යභාරය යන්න තේමා කොට ඔක්තෝම්බර් 26 සිට 28 දක්වා පැවති 24 වන ද්විවාර්ෂික මහා සමුළුවේදී කථිකාචාර්ය (නිදහස්) නයනා පී අමරවික්‍රම මෙය ඩිජිටල් තාක්ෂණය සහ ශ්‍රී ලංකාවේ අඩු නිපුණතා සහිත ශ්‍රම බලකාය කෙරෙහි කොවිඩ් 19 හි බලපෑම් යන මැයෙන් පත්‍රිකාවක් (country paper) ඉදිරිපත් කළාය.

විද්‍යා හා තාක්ෂණ තොරතුරු ව්‍යාප්ත කිරීම

21 වැනි සියවසේ ප්‍රධාන ගාමක බලවේගය වන "දැනුම" විසින් ලොව පුරා ගෝලීය ආර්ථිකය මෙහෙයවනු ලබයි. පනත මගින් නියම කර ඇති පරිදි, ජාතික විද්‍යා පදනම, විද්‍යාත්මක තොරතුරු සහ සමාජ විද්‍යාව ඇතුළු සියලුම විද්‍යාත්මක විෂයයන් ඇතුළත් නව පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිඵල ව්‍යාප්ත කිරීම සඳහා පිහිටාධාර වීමේ කාර්යයෙහි නිරත විය.

ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් සඟරාව (JNSF)

ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ සඟරාව (JNSF) මාර්තු, ජූනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් මාසවල සඟරාවේ කලාප හතරක් ප්‍රකාශයට පත් කරයි. දැනට, Clarivate Analytics Science Citation Index Expanded (SCIE) හි සුචිගත කර ඇති එකම ශ්‍රී ලාංකික සඟරාව වන්නේ එයයි. ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ සඟරාව 2021 වසරේදී SCIE හි සුචිගත කිරීමේ තත්ත්වය පවත්වා ගෙන ගියේය. SCIE ට අමතරවල ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ සඟරාව Chemical & Biological Abstracts, BIOSIS Previews, Zoological Records, SCOPUS, TEEAL, Ulrich's, AGRICOLA, iy EBSCOhost හිද සුචිගත කර ඇත.

2021 වසරේදී, 2020 වසරට සාපේක්ෂව 20% ක වැඩිවීමක් පෙන්නුම් කරමින් සම්සුරු සමාලෝචිත ලිපි 52 ක් සමඟ 49 වෙළුමේ කලාප හතරක් ප්‍රකාශයට පත් කරන ලදී. දේශීය හා ගෝලීය වශයෙන් සිදු කරන ලද විද්‍යාවේ සහ තාක්ෂණයේ සියලුම අංශවල පර්යේෂණවල සොයාගැනීම් පිළිබඳ තොරතුරු සමස්ත වෙළුම මගින් බෙදා හරින ලදී. පළ කරන ලද සියලුම ලිපි විවෘත ප්‍රවේශයෙන් ලබා ගත හැකිය.

ජාතික විද්‍යා පදනමේ සඟරාවෙහි බලපෑම් සාධකය (IF) පෙර වසරේ තිබූ අගය වන 0.378 සිට 0.515 දක්වා ඉහළ ගොස් තිබුණි (විශ්ලේෂණ තොරතුරු ලද්දේ 2021 වසර මැද භාගයේදීය.) මෙය ජාතික විද්‍යා පදනමේ සඟරාවෙහි පළ කරන ලද ලිපිවල දෘශ්‍යතාව සහ ගුණාත්මක බව වැඩි වීම පිළිබඳ පැහැදිලි හැඟවීමකි.



රූප සටහන 20 : 2010 වසරේ සිට 2020 වසර දක්වා ජාතික විද්‍යා පදනමේ සඟරාවේ බලපෑම් සාධකයේ වර්ධනය

2021 වසරේදී අත්පිටපත් 514ක් ලැබී ඇත. *(රූපසටහන 21)*. අත්පිටපත්වල සමාලෝචන ක්‍රියාවලිය *රූප සටහන 22* හි දැක්වේ.



රූප සටහන 21 : ජාතික විද්‍යා පදනම් සඟරාවේ පළ කිරීමේ ක්‍රියාවලියට භාජනය කරන ලද අත්පිටපත



රූප සටහන 22 : ජාතික විද්‍යා පදනමේ සඟරාවේ සංස්කරණ ක්‍රියාවලියේ ගැලීම් සටහන සහ ප්‍රගතිය

විදේශීය සමාලෝචකයින් 7 දෙනෙකු සහ දේශීය සමාලෝචකයින් 65 දෙනෙකු සමාලෝචන ක්‍රියාවලියට දායක වූහ. දේශීය ඉදිරිපත් කිරීම් ප්‍රතිශතය පෙර වසරේ 42%ට සාපේක්ෂව 48% දක්වා ඉහළ ගොස් ඇත. ශ්‍රී ලාංකික පර්යේෂකයන් තම පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීම සඳහා වේදිකාවක් ලෙස ජාතික විද්‍යා පදනමේ සඟරාව යොදා ගනිමින් විදේශීය පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ද එම සඟරාව අත්කරගත් කැපී පෙනෙන ජයග්‍රහණයක් විය.



රූප සටහන 23 : කතුවරුන්ගේ සම්භවය මත පදනම්ව ඉදිරිපත් කිරීම් **(2017 – 2021)**



රූප සටහන 24: සඟරාවෙහි පළ කිරීම සඳහා වන ක්‍රියාවලියට ලක් කරන ලද අත්පිටපත් ඒවාට අදාළ විෂයය ක්ෂේත්‍ර අනුව



රූප සටහන 25: 2021 වසරේදී ජාතික විද්‍යා පදනම් සඟරාවේ පළ වන ලද ලිපි මගින් ආවරණය වූ විෂයය ක්ෂේත්‍ර

2021 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද ලිපිවලින් බහුතරයක් භෞතික විද්‍යාව ආශ්‍රිත විෂයයන් ආවරණය කළ අතර ජීව විද්‍යාව වෙතින් නියෝජනය අඩු මට්ටමක පැවතියේය. *(රූප සටහන 25).*

2021 වසරේදී ජාතික විද්‍යා පදනමේ සඟරාවෙහි ලිපි පළ කිරීම මගින් දේශීය කතුවරුන් 149 දෙනෙකුට (72%) සහ විදේශීය කතුවරුන් 57 දෙනෙකුට (28%) ඔවුන්ගේ පර්යේෂණවල සොයාගැනීම් ජාත්‍යන්තර විද්‍යාත්මක ප්‍රජාව වෙත බෙදා හැරීමට හැකි විය. විදේශීය කතුවරුන්ගේ ප්‍රතිශතය 2020 දී 34% සිට 2021 දී 28% දක්වා අඩු වීමක් මෙන්ම, 2020 දී ලිපි 13 සිට 2021 දී ලිපි 11 දක්වා ප්‍රකාශයට පත් කරන ලද විදේශීය ලිපි සංඛ්‍යාවේ අඩුවීමක්ද ඇත.

විදේශීය කතුවරුන් රටවල් 12 ක් නියෝජනය කළ අතර ඉන් බහුතරයක් ආසියානු කලාපය (මුළු සංඛ්‍යාවෙන් 15%) නියෝජනය කළහ. කතුවරුන් සම්බන්ධ වී සිටින ආයතනයන් සලකා බැලීමේදී, විවිධ විදේශීය විශ්වවිද්‍යාල/ආයතන 48කින් කතුවරුන් ආකර්ෂණය කර ගැනීමට ජාතික විද්‍යා පදනමේ සඟරාව සමත් විය.



රූප සටහන 26 : ජාතික විද්‍යා පදනමේ සඟරාවේ 49 වන වෙළුමේ කතුවරුන්ගේ සම්භවය සහ නියෝජනය කරන ලද රටවල්



රූප සටහන 27 : ජාතික විද්‍යා පදනමේ සඟරාවේ 49 වන වෙළුමට දායකත්වය සැපයූ විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතන

ප්‍රකාශයට පත් කරන ලද විවිධ විෂය ක්ෂේත්‍රවල පර්යේෂණ ලිපි පනස් දෙකෙන් 56%ක් දේශීය පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරන ලද ලිපි වූ අතර 21%ක් විදේශීය පර්යේෂකයන් වෙතින් ලද ඒවා විය. 2021 ප්‍රකාශයට පත් කරන ලද සහයෝගීත්ව පත්‍රිකා සංඛ්‍යාව 2020 දී 5% සිට 2021 දී 23% දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.



රූප සටහන 28 : ජාතික විද්‍යා පදනමේ සඟරාවේ 49 වන වෙළුමේ පළ කරන ලද ලිපිවල සම්භවය

ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව (SLJSS)

ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ (SLJSS) 44 වන වෙළුම පර්යේෂණ ලිපි 15ක්, සමාලෝචන ලිපි 02ක්, කෙටි පර්යේෂණ වාර්තා 01ක් සහ ආරාධිත ග්‍රන්ථ සමාලෝචන 01ක් සමඟ කලාප දෙකකින් 2021 ජූනි සහ දෙසැම්බර් මාසවලදී ප්‍රකාශයට පත් කරන ලදී. පළ වන ලද ලිපිවලින් 28% ක් සමාජ විද්‍යා ක්ෂේත්‍රයට අදාළ ලිපි විය.



රූප සටහන 29 : ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව සඳහා ලිපි ඉදිරිපත් කිරීම් (2012-2021)



රූප සටහන 30 : ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව සඳහා ලිපි ඉදිරිපත් කිරීම් කතුවරුන්ගේ සම්භවය අනුව



රූප සටහන 31 : ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ සංස්කරණ ක්‍රියාවලියේ ගැලීම් සටහන



රූප සටහන 32 : ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ 44 වන වෙළුමේ පළ වන ලද ලිපිවල සම්භවය



රූප සටහන 33 : ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ 44වන වෙළුමට විදෙස් ආයතන විසින් දක්වන ලද දායකත්වය

ප්‍රකාශනවලින් 67%ක් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ අධ්‍යයන ආයතනවලට අනුයුක්ත විද්වතුන් විසින් කරන ලද පර්යේෂණ තුළින් බිහිවූ ඒවා විය. *(රූප සටහන 34)*



රූප සටහන 34 : ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ 44වන වෙළුමට විදෙස් ආයතන විසින් දක්වන ලද දායකත්වය



රූප සටහන 35 : ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ 44 වන වෙළුමේ පළ කරන ලද ලිපි විෂයයන් අනුව

ඉහළ බලපෑමක් ඇති සඟරාවල ලිපි පළ කිරීම සඳහා පර්යේෂකයන්ට සහාය වන ප්‍රදාන යෝජනා ක්‍රම දෙක වන, ප්‍රකාශන ගාස්තු සඳහා සහය යෝජනා ක්‍රමය (SSPF) සහ විද්‍යාත්මක රැස්වීම් සහ සිදුවීම් සඳහා සහය යෝජනා ක්‍රමය (SSSME) ද මෙම වසරේදී ක්‍රියාත්මක විය. අධික ප්‍රකාශන ගාස්තු හේතුවෙන් පර්යේෂකයන් ඉහළ බලපෑමක් ඇති විද්වත් සඟරාවල සිය පර්යේෂණ ලිපි පළ කිරීම සීමා වේ. Science Citation Index Expanded සහ සමාජ විද්‍යා උපුටා දැක්වීම් දර්ශකයේ (Social Science Citation Index) සුචිගත කරන ලද හා 1.3, 2.54 සහ 4.01 යන බලපෑම් සාධක සහිත ප්‍රකට සඟරා විසින් පත්‍රිකා පිළිගන්නා ලද ශ්‍රී ලාංකික විද්‍යාඥයින් තිදෙනෙකු වෙත ප්‍රකාශන ගාස්තු සඳහා සහය යෝජනා ක්‍රමය යටතේ ප්‍රකාශන ගාස්තු ලබාදීම මගින් ජාතික විද්‍යා පදනම සහාය දැක්වීය (*ඇමුණුම 06*).

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 77 වැනි වාර්ෂික සැසිවාර සඳහා (තේමාව - "වඩාත් යහපත් හෙටක් සඳහා විද්‍යාව සහ තාක්ෂණය") විද්‍යාත්මක රැස්වීම් සහ සිදුවීම් සඳහා සහය යෝජනා ක්‍රමය යටතේ සහය දක්වන ලද අතර එහිදී පර්යේෂණ කටයුතු 135කට අදාළ දැනුම වාචික සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් ලෙස බෙදා හදා ගැනීම/ ප්‍රසිද්ධ කිරීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මාර්ගගත සඟරා (SLJOL)

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සඟරා එක් තැනකට ගෙන ඒමේ වේදිකාව වන ශ්‍රී ලංකා මාර්ගගත සඟරා (SLJOL) *(https://www.sljol.info/)* යනු එක්සත් රාජධානියේ ක්‍රියාත්මක වනල විද්‍යාත්මක ප්‍රකාශන ලබාගැනීමේ හැකියාව තහවුරු කිරීම සඳහා වන ජාත්‍යන්තර ජාලය (INASP) විසින් පිහිටුවන ලද Journals Online (JOL) ව්‍යාපෘතියේ සාමාජිකයෙකි. එක්සත් රාජධානියේ Ubiquity Press සමඟ සහයෝගීතාවයෙන් ජාතික විද්‍යා පදනම විසින් 2008 වසරේ සිට ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකා මාර්ගගත සඟරා (SLJOL) ශ්‍රී ලංකාවේ සිට පර්යේෂණ කටයුතු සිදු කරන විද්වතුන් විසින් ප්‍රකාශයට පත් කරන ලද විද්වත් පර්යේෂණ නිමැවුම් වෙත ලොව පුරා ජනතාවගේ අවධානය යොමු වන මට්ටම සහ ඒවා වෙත ප්‍රවේශ වීමේ හැකියාව වැඩිදියුණු කිරීමට කැපවී සිටී. මෙම වෙබ් අඩවිය දැනට සම්පූර්ණ පරාසයක විහිදෙන අධ්‍යයන විෂයය ක්ෂේත්‍රයන් ආවරණය කරමින් දේශීය වශයෙන් පළ කරන ලද, සමීක්ෂුරු-සමාලෝචිත ශාස්ත්‍රීය සඟරා 111ක් සඳහා සත්කාරකත්වය දරයි.





රූප සටහන 36 : ශ්‍රී ලංකා මාර්ගගත සඟරා මගින් ආවරණය කෙරෙන විෂයයන්

කොවිඩ් -19 වසංගතය හමුවේ, විවෘත ප්‍රවේශය සහිත සඟරා ප්‍රකාශන වේදිකාවක් තිබීමේ වටිනාකම සහ අවශ්‍යතාව දේශීය ප්‍රකාශකයන්, සංස්කාරකවරුන් සහ කතුවරුන් (පර්යේෂකයන්) විසින් පුළුල් ලෙස අවබෝධ කර ගන්නා ලදී. එබැවින්, ශ්‍රී ලංකා මාර්ගගත සඟරා හා සම්බන්ධ වීමට විවෘත ප්‍රවේශය සහිත දේශීය සඟරා 26 කින් ඉහළ ඉල්ලුමක් පැවතුනි. ශ්‍රී ලංකා මාර්ගගත සඟරා වෙත එක්වීමේදී සපුරාලිය යුතු ප්‍රමිතීන් සහ දැඩි ඇගයීම් නිර්ණායක සපුරාලීම මත, 2021 වර්ෂය තුළ සඟරා 17ක් ශ්‍රී ලංකා මාර්ගගත සඟරා වෙත අලුතින් එක් කරන ලදී.

2021 දෙසැම්බර් 31 වන දින වන විට, ශ්‍රී ලාංකික විද්වත් සඟරා 111ක් විසින් ආවරණය කරන ලද කලාප 1776ක පර්යේෂණ ලිපි 15,653ක් ශ්‍රී ලංකා මාර්ගගත සඟරාවේ අන්තර්ගත විය. එහි සියලුම ලිපි නියම සහ කොන්දේසි වලට යටත්ව සමාලෝචනය සහ භාවිතය සඳහා නොමිලේ ලබා ගත හැකිය. 2021 වසරේදී, සඟරා කලාප 245 ක පර්යේෂණ ලිපි 2167 ක් ශ්‍රී ලංකා මාර්ගගත සඟරාවේ පළ කරන ලදී. රූප සටහන 37 (අ) සහ 37 (ආ) මගින් ශ්‍රී ලංකා මාර්ගගත සඟරාවේ වර්ධනය නිරූපණය වේ.





රූප සටහන 37 : 37 අ සහ 37 ආ : ශ්‍රී ලංකා මාර්ගගත සඟරාවේ වර්ධනය

2021 වසරේ Google analytics හි දී ඇති සංඛ්‍යාලේඛනවලට අනුව, රටවල් 210 ක 303,596 ක පිරිසක් මෙම මාර්ගගත සඟරාව වෙත පිවිස ඇති අතර බාගත කර ඇති සම්පූර්ණ පෙළ සහිත ලිපි සංඛ්‍යාව 147,467 කි. *(වගුව 07)*

වගුව 07: ශ්‍රී ලංකා මාර්ගගත සඟරාවේ පරිශීලකයින් (වැඩිම පරිශීලකයින් සංඛ්‍යාවක් සහිත රටවල් තිස් හය)

රට	පරිශීලකයින්	රට	පරිශීලකයින්	රට	පරිශීලකයින්
ශ්‍රී ලංකාව	111542	බංග්ලාදේශය	2130	සෞදි අරාබිය	1124
ඉන්දියාව	31637	ප්‍රංශය	2043	ඊජිප්තුව	1119
එක්සත් ජනපදය	21131	ජර්මනිය	1970	දකුණු කොරියාව	1117
චීනය	15016	සිංගප්පූරුව	1785	දකුණු අප්‍රිකාව	1033
පිලිපීනය	10152	තුර්කිය	1783	මෙක්සිකෝව	975
එක්සත් රාජධානිය	6289	ජපානය	1737	වියට්නාමය	955
ඉන්දුනීසියාව	5305	බ්‍රසීලය	1641	ඉතාලිය	941
ඕස්ට්‍රේලියාව	4355	තායිලන්තය	1585	හොංකොං	863
නයිජීරියාව	4207	නේපාලය	1541	තායිවානය	803
පකිස්තානය	3797	අයර්ලන්තය	1157	කෙන්යාව	736
මැලේසියාව	3628	ඉතියෝපියාව	1154	ස්පාඤ්ඤය	725
කැනඩාව	2717	නෙදර්ලන්තය	1145	එක්සත් අරාබි එමීර් රාජ්‍යය	654

රූප සටහන 38 සහ *39* හි පෙන්වා ඇති පරිදි ශ්‍රී ලංකා මාර්ගගත සඟරාවේ භාවිතය සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇති අතර සම්පූර්ණ පෙළ සහිත ලිපි බාගත කිරීම් වසංගත කාලය තුළ කැපී පෙනෙන අන්දමින් වර්ධනය වී ඇත.



රූප සටහන 38 : google analytics හි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මාර්ගගත සඟරා වෙත පිවිසි පිරිස (2015-2021)



රූප සටහන 39 : google analytics හි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මාර්ගගත සඟරාවෙන් සම්පූර්ණ පෙළ සහිත ලිපි භාගත කිරීම්

ශ්‍රී ලංකා මාර්ගගත සඟරාවේ එක් වැදගත් වගකීමක් වන්නේ එහි සඟරා කෙතරම් සාර්ථකද යන්න සහ සඟරා ආරක්ෂා කිරීමට හෝ ශක්තිමත් කිරීමට යම් යම් වැළැක්වීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය වේද යන්න කලින් කලට ඇගයීමය *08 වගුවේ* සඳහන් කර ඇති ක්‍රියාකාරකම් සිදු කිරීම මගින් මෙම කාර්යය ඉටු කරන ලදී.

වගුව 08: 2021 වසරේදී සිදු කරන ලද සඟරා සඳහා සහය වීමේ ක්‍රියාකාරකම්

01	මාර්ගගත සංස්කරණ ක්‍රියාවලිය සහ ලිපි පළ කිරීම හරහා සඟරා 21කට පහසුකම් සලසා ඇත
02	සඟරාවලින් 77% ක් 'රන්' -'Gold' කාණ්ඩය යටතට ඇතුළත් කරන ලදී. : රන් කාණ්ඩය යටතේ වන විවෘත ප්‍රවේශය සහිත සඟරාවට Creative Commons (CC) Attribution 4.0 බලපත්‍රය හිමිය*
03	අදාළ ආවරණ රූප (cover images) සහ ට්විටර් සටහන් සහිත වෙබ් නිවේදන 260ක්
04	දෝෂාවේක්ෂණ සැසි 270ක්
05	සංස්කාරකවරුන් සඳහා ආදර්ශන දැක්වීම් සහ දැනුවත් කිරීම් සැසි 99ක්
06	සංස්කාරකවරුන්, කොටස් සංස්කාරකවරුන්, කතුවරුන්, සමාලෝචකයින් සහ පිටපත් සංස්කාරකවරුන් ලෙස පරිශීලකයින් 329ක් බඳවාගෙන ඇත
07	සංස්කාරකවරුන්ගෙන් 62% ක් සඳහා ORCID ID තත්වය ලබාදී ඇත
08	සඟරාවල වෙබ් යාවත්කාලීන කිරීම් 189ක්
09	උපුටා දැක්වීම් දත්ත පද්ධතිවල සුචිගත වීම සඳහා අවශ්‍ය නිර්ණායකය සම්පූර්ණ කරමින් සඟරා මුල් පිටු 04කට 'Research Integrity' කාණ්ඩය එක් කරන ලදී
10	සඟරා කලාප 232ක් වෙත crossre ගෙදරට වෙතින් Digital Object Identifiers (DOIs) පිරිනමන ලදී
11	සඟරා ප්‍රකාශන රීති සහ ප්‍රමිති (JPPS) රාමුව පිළිබඳව සඟරා සංස්කාරකවරුන් 07 දෙනෙකු දැනුවත් කරන ලදී
12	INASP, UK විසින් මෙහෙයවන ලද "සංස්කරණ ක්‍රියාවලි" පිළිබඳ පුහුණු වැඩසටහන් මාර්ගගත පාඨමාලාව - 1 කොටස පැවැත්වීමට පහසුකම් සලසා ඇත, (5 ඔක්තෝබර් - 8 නොවැම්බර්)
13	අප්‍රේල් 29 සහ ජුනි 24 යන දිනවල Ubiquity Press, UK විසින් පවත්වන ලද "සඟරා කළමනාකරණ පද්ධති" පිළිබඳ සඟරා සංස්කාරකවරුන් සඳහා වූ මාර්ගගත පුහුණු වැඩසටහන් 02 ක් සඳහා පහසුකම් සපයන ලදී
14	අක්‍රියව පැවති සඟරා හතක් නැවත සම්බන්ධ වන ලදී

ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය

ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය 2021 වසර තුළ එහි තුන්වන අදියරේ සාර්ථක ප්‍රගතියක් අත්කරගනිමින් තිබුණි. තෝරාගත් පුස්තකාලවල දේශීය ශාස්ත්‍රීය ලේඛන එකතුන් ඩිජිටල්කරණය කිරීම, එක් එක් පුස්තකාලය සඳහා DSpace මෘදුකාංගය මගින් ආයතනික කෝෂ්ඨාගාර (IRs) පිහිටුවීම සහ ආයතනික කෝෂ්ඨාගාර තුළට ඩිජිටල්කරණය කළ ලේඛන අප්ලෝඩ් කිරීම යන දෑ එක් එක් අදියරෙහි සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් විය. ආසන්න වශයෙන්, ලේඛන 80,000ක් වෙත 2021 වසර අවසන් වන විට මාර්ගගත ප්‍රවේශය ලබා දී ඇති ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ආරම්භයේ සිට (2011) එහි ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ගැලීම් සටහනක් මගින් දළ *රූප සටහන 02* හි දක්වා ඇත.



දළ රූප සටහන 02: ගැලීම් සටහන (2011 වසරේ සිදු වූ ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතියේ ආරම්භයේ සිට එහි ප්‍රගතිය)

රූප සටහන 40 මඟින් ඉ-කෝෂ්ඨාගාර අටක් හරහා මාර්ගගත ප්‍රවේශය ලබා දී ඇති මුළු ලිපි සංඛ්‍යාව නිරූපණය වේ.



NSF – ජාතික විද්‍යා පදනම
IESL - ඉංජිනේරුවරුන්ගේ ආයතනය
DA - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
SUSL - සබරගමුව විශ්වවිද්‍යාලය
PGIM - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
WUSL – වයඹ විශ්වවිද්‍යාලය
NIFS - ජාතික මූලික අධ්‍යයන ආයතනය
ID - වාරිමාර්ග දෙපාර්තමේන්තුව

රූප සටහන 40 : 2021 වසරේදී මාර්ගගත ප්‍රවේශය ලබාදුන් සම්පූර්ණ පෙළ සහිත ලිපි /ලේඛන.

ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතියෙහි එක් ප්‍රධාන අරමුණක් වන්නේ අදාළ ලේඛන වෙත ජනතාවගේ අවධානය යොමු වන මට්ටම සහ පරිශීලකයින්හට ඒවා වෙත මාර්ගගත අන්දමින් ප්‍රවේශ වීමේ හැකියාව ඉහළ නැංවීමයි. එය මනිනු ලබන්නේ නැරඹුම් වාර සංඛ්‍යාව සහ බාගත කළ ලේඛන සංඛ්‍යාව අනුව ය. 2019 සහ 2020 වසරවලට සාපේක්ෂව 2021 වසරේදී කෝෂ්ඨාගාර භාවිතයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ නැරඹුම් වාර මිලියන 224කට වඩා වැඩි ප්‍රමාණයක් සහ සම්පූර්ණ පෙළ සහිත ලේඛන බාගතකිරීම් 430,000කට වැඩි ප්‍රමාණයක් වාර්තා වී ඇත.



රූප සටහන 41 : ජාතික විද්‍යා පදනමේ සර්වරය මගින් මෙහෙයවනු ලබන කෝෂ්ඨාගාරවල භාවිතය සෙවුම් මත පදනම්ව



රූප සටහන 42: ජාතික විද්‍යා පදනමේ සර්වරය මගින් මෙහෙයවනු ලබන කෝෂ්ඨාගාරවල භාවිතය බාගත කිරීම් මත පදනම්ව

ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ආයතන දෙකකට එනම්, පරිසර අමාත්‍යාංශයට සහ ජනාධිපති ලේකම් කාර්යාලයට 2021 වසරේදී ව්‍යාප්ත කරන ලදී. අමාත්‍යාංශයේ ප්‍රකාශන ඩිජිටල්කරණය සඳහා ආසන්න වශයෙන් පිටු 15,000ක් ආවරණය කිරීමට අවශ්‍ය වේ. මෙම ව්‍යාපෘති දෙක 2022 වසර පුරා ක්‍රියාත්මක වනු ඇත.

ජාතික විද්‍යාත්මක තොරතුරු දත්ත පද්ධති සංවර්ධනය සහ නඩත්තු කිරීම

2021 වසර තුළදී, ශ්‍රී ලංකා විද්‍යා දර්ශකය (SLSI)" SLSTICAT සහ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය යන සංක්ෂේප දත්ත පද්ධති වෙත වාර්තා 8,534 ක් එක් කරමින් සිය විද්‍යාත්මක තොරතුරු දත්ත පද්ධතීන් තවදුරටත් ශක්තිමත් කරගැනීමට ජාතික විද්‍යා පදනම සමත් විය.



රූප සටහන 43: විද්‍යාත්මක තොරතුරු දත්ත පද්ධතිවල වර්ධනය (2017- 2021)

ශ්‍රී ලාංකේය පර්යේෂකයන් තම සොයාගැනීම් ලොව පුරා ප්‍රචලිත කිරීමේ දී මුහුණ දෙන විශාල අභියෝගය ජය ගැනීම සඳහා ලොව පුරා පූර්ණ පරාසයක විහිදුණු ශාස්ත්‍රීය විෂයයන් පිළිබඳ ලිපි ලේඛන 208,586 ක් බෙදා හදා ගැනීමට හැකිවීම ජාතික විද්‍යා පදනම ලැබූ විශිෂ්ට ජයග්‍රහණයකි. මෙම වසරේ දී, නව ලේඛන සහ වාර්තා 21,526 ක් එකතු කරන ලද අතර ඩිජිටල් කෝෂ්ඨාගාර සහ දත්ත පද්ධතීන් තුළ වාර්තා 41,592 යාවත්කාලීන කරන ලදී. Google analytics සහ වෙනත් මූලාශ්‍රයන්හි ඉදිරිපත් කර ඇති සංඛ්‍යාලේඛනවලට අනුව, 2021 වසරේදී, සියලුම දත්ත පද්ධතීන් වෙතින් නරඹන්නන් 2,503,596 ක් වාර්තා වී ඇති අතර ගෝලීය වශයෙන් සම්පූර්ණ පෙළ සහිත ලිපි 577,467 ක් බාගත කර ඇත.

විද්‍යාල තාක්ෂණ හා නවෝත්පාදන දර්ශක සහ දත්ත සඳහා මූලාශ්‍රයක් සැපයීම

ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය

2019 මාර්තු සිට 2020 මාර්තු දක්වා සිදු කරන ලද සමීක්ෂණය මත පදනම්ව පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය 2018 පිළිබඳ සංඛ්‍යානමය අත්පොත ප්‍රකාශයට පත් කරන ලදී. එම සංඛ්‍යාලේඛන අත්පොත මගින් 2018 මුදල් වර්ෂය තුළ රටේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්වල කාර්ය සාධනය පිළිබිඹු කරයි. ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD) විසින් සකස් කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතීන් මත පදනම්ව මෙම සමීක්ෂණය පවත්වනු ලැබේ. සමීක්ෂණයේ විෂයය පථය පහත අංශ හතරෙන් සමන්විත වේ:

- උසස් අධ්‍යාපන අංශය
- රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන
- වෙළඳ ව්‍යාපාර අංශය
- ලාභ නොලබන පුද්ගලික සංවිධාන අංශය

පෙර වසරවල් හා සසඳන විට, 2018 වසරේ සමීක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉහළ නියෝජනය සහ දත්තවල ගුණාත්මක භාවය වැඩිදියුණු කරමින් වෙළඳ ව්‍යාපාර අංශය සඳහා ප්‍රතිචාර අනුපාතය සැලකිය යුතු ලෙස වැඩි විය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ ගොඩනගා ගත් හවුල්කාරිත්වය මෙහිදී සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළේය.

2018 වර්ෂයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන සංඛ්‍යාලේඛන UNESCO සංඛ්‍යාලේඛන (UIS) ආයතනය වෙත ඉදිරිපත් කරන ලද අතර එම කාර්යයේදී ජාතික කේන්ද්‍රස්ථානය වූයේ ජාතික විද්‍යා පදනමය පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය 2018 මගින් ඉදිරිපත් වන ලද සුවිශේෂී කාරණා පහත දැක්වේ.

- 2018 වසරේ ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සඳහා වූ දළ දේශීය වියදම (GERD) රු. මිලියන 18,343.92 ක් වූ අතර එය රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.13% ක් විය. 2017 වසරේදී එම අගය රුපියල් මිලියන 17,003.34 ක් විය.

- පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සඳහා වැඩිම වියදමක් දරනු ලැබුවේ වෙළඳ ව්‍යාපාර අංශය (39.77%) විසින් වන අතර, දෙවනුව වැඩිම වියදමක් දරන ලද්දේ රජයේ පර්යේෂණ ආයතන (35.42%) විසිනි. උසස් අධ්‍යාපන අංශයේ සහ ලාභ නොලබන පුද්ගලික සංවිධාන අංශයේ මේ සම්බන්ධ අනුපාතය පිළිවෙලින් 23.46% සහ 1.35% විය.



විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (STMIS)

විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (STMIS) යනු 2004 වසරේ සිට ජාතික විද්‍යා පදනම විසින් සංවර්ධනය කර පවත්වාගෙන යනු ලබන පරිගණකගත තොරතුරු පද්ධතියකි. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන, එම ක්ෂේත්‍රයේ කටයුතු කරන පුද්ගලයින්, ආයතනවල පවතින උසස් විද්‍යාත්මක උපකරණ, සිදු කෙරෙමින් පවතින පර්යේෂණ ක්‍රියාකාරකම්, ආයතන විසින් සංවර්ධනය කර බාහිරට ලබාදෙන තාක්ෂණයන, විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන විසින් මහජනතාව සඳහා පිරිනමනු ලබන සේවා හා පුහුණු වැඩසටහන් සහ විද්‍යාඥයන් විසින් පුද්ගලිකව එළිදක්වනු ලබන ලබන පර්යේෂණ ප්‍රකාශන යනාදිය පිළිබඳ තොරතුරු මෙම STMIS දත්ත පද්ධතියේ අඩංගු වේ.

විශේෂඥභාවය, සුදුසුකම්, වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ ආයතන අනුව සාමාජිකයින් සංඛ්‍යාව නිරූපණය කිරීම සඳහා ග්‍රැෆික්ස් මගින් තොරතුරු ඉදිරිපත් කිරීම වැනි අමතර විශේෂාංග වලින් දත්ත පද්ධතිය පොහොසත් කර ඇත' STMI දත්ත පද්ධතිය තුළ දැනට ලියාපදිංචි වී සිටින පිරිස 6981ක් වන අතර ඉන් 263ක් 2021 වර්ෂය තුළදී අලුතින් ලියාපදිංචි වූවන් වේ.



රූප සටහන 44: විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ලියාපදිංචි වූ පුද්ගලයින්



රූප සටහන 45: විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ලියාපදිංචි වූ පුද්ගලයින් ස්ත්‍රී පුරුෂ භාවය අනුව



රූප සටහන 46: විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ලියාපදිංචි වූ පුද්ගලයින් වයස් කාණ්ඩය අනුව



රූප සටහන 47: ලියාපදිංචි වූවන්ගේ මුළු සංඛ්‍යාවෙන් අදාළ විශ්වවිද්‍යාලය අනුව ලියාපදිංචි වූවන්ගේ ප්‍රතිශතය

විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය, සියලු තොරතුරු එකම තැනකින් ලබාගත හැකි තොරතුරු මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින, අදාළ ආයතනයේ මූලික තොරතුරු, එම ආයතනය සම්බන්ධ කරගත හැකි ආකාර, ආයතන විසින් පිරිනමනු ලබන සේවා සහ පුහුණු වැඩසටහන්, එම ආයතන විසින් සංවර්ධනය කරන ලද තාක්ෂණයන් සහ ඔවුන්ට අයත් විශේෂිත උපකරණ යනාදී වශයෙන් පර්යේෂණ සහ සංවර්ධන ආයතන 105 ක් සම්බන්ධයෙන් වූ තොරතුරු එකතු කොට මෙම විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙත ඇතුළු කරන ලදී.

විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙත වැඩි වශයෙන් අවධානය යොමු කරගැනීම සඳහා, එම පද්ධතිය නිපුණතා සංවර්ධන, ව්‍යාත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදනයන් පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියට 2021 වසරේදී සම්බන්ධ කරන ලද අතර ඉදිරියේදී අනෙකුත් ආයතනයන්හි වෙබ් අඩවි වෙතද සම්බන්ධ කෙරෙනු ඇත.

භාවිතය

විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය මගින් එහි ලියාපදිංචි වන්නන්ගේ ප්‍රයෝජනය සඳහා විද්‍යාත්මක පාඨමාලා සහ සිදුවීම්, ප්‍රදාන පිරිනැමීම සඳහා අයදුම්පත් කැඳවීම් වැනි වැදගත් යාවත්කාලීන තොරතුරු මෙන්ම ව්‍යාත්තීය අවස්ථා වැනි වෙනත් තොරතුරුද බෙදා හැරීම පිණිස භාවිතා කෙරේ. මෙම පහසුකම විධිමත් ලෙස හඳුන්වා දීමෙන් විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ලියාපදිංචි වන්නන්හට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පවතින අවස්ථා පිළිබඳ වඩාත්ම යාවත්කාලීන තොරතුරු ලැබීමේ ප්‍රතිලාභය හිමි වී ඇත.



රූප සටහන 48: විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා තොරතුරු සංසරණයවීම්

සැලකිය යුතු වර්ධනයක් සනිටුහන් කරමින්, 2021 වර්ෂය තුළ මුළු සංසරණ 112 ක් සිදු වන ලද්දේ ජාතික විද්‍යා පදනම වෙත ආදායමක් ලෙස රුපියල් 75,000 ක් උත්පාදනය කරමිනි. පුළුල් නමුත් අදාළ තොරතුරු/ප්‍රේක්ෂකයින් ලබා ගැනීම සඳහා විශ්වාසනීය මාර්ගයක් ලෙස මෙම සේවාව රටේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රජාව අතර ජනප්‍රිය වෙමින් පවතී.

විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය තුළ පවත්වාගෙන යනු ලබන දත්ත භාවිතා කරමින් විවිධ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම් මත පදනම්ව 2021 වසරේ දී රිසිකරණය කරන ලද විස්තීරණ වාර්තා එකොළහක් ජනනය කරන ලදී. අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයින් 1000කට අධික සංඛ්‍යාවකගේ සත්‍යාපනය කරන ලද තොරතුරු එම වාර්තාවලට ඇතුළත් විය.

විද්‍යාව ප්‍රචලිත කිරීම

ජනතාවගේ විද්‍යා සාක්ෂරතාව වර්ධනය කිරීම සඳහා ජාල ශක්තිමත් කිරීම

විද්‍යා සංගම් ජාල

- පාසල් විද්‍යා සංගම් ජාලය (SSSN) 2005 වසරේදී ආරම්භ කරන ලද්දේ විද්‍යාව හා තාක්ෂණයට අදාළ විවිධ ක්ෂේත්‍රවල නවතම වර්ධනයන් පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා පාසල් දරුවන් වෙත උපකාර කිරීම සහ එදිනෙදා කටයුතුවලදී විද්‍යාත්මක දැනුම භාවිතා කිරීම පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම අරමුණු කර ගෙන ය. මෙම ජාලයට සියලුම පාසල් කාණ්ඩ ඇතුළත් විය. 1AB, 1C, 2 වර්ගය, 3 වර්ගය සහ පුද්ගලික, 2021 වර්ෂය අවසානය වන විට, වාර්ෂික පදනමින් අඛණ්ඩ වර්ධනයක් සනිටුහන් කරමින්, ලියාපදිංචි වූ මුළු පාසල් විද්‍යා සංගම් සංඛ්‍යාව 1056 දක්වා වැඩි වී ඇත. ඒ අනුව, 1ඊ පාසල් 575ක් සහ අනෙකුත් පාසල් වර්ග 481ක් වෙත ජාතික විද්‍යා පදනමේ සේවාවන් දැන් ලැබී ඇත.



රූප සටහන 49: 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ලියාපදිංචි වූ පාසල් විද්‍යා සංගම් සංඛ්‍යාව

- විශ්ව විද්‍යාල විද්‍යා සංගම් ජාලය (USSN) වැඩසටහන 2014 වසරේදී ආරම්භ කරන ලද්දේ විද්‍යා උපාධි අපේක්ෂකයින් සඳහා වේදිකාවක් නිර්මාණය කිරීම හා ජාතික ක්‍රියාකාරකම්වලදී ඔවුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම යන අරමුණු ඇතිවය. විද්‍යාත්මක සන්නිවේදනය වැඩිදියුණු කිරීම හා උපාධි අපේක්ෂකයින්ගේ ලිවීමේ කුසලතා වැඩි දියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ යහපැවැත්ම උදෙසා විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ඔවුන්ගේ දැනුම භාවිතා කිරීම ද මෙමගින් අරමුණු කෙරී ඇතග 2021 වර්ෂය අවසන් වන විට ජාතික විද්‍යා පදනමේ ලියාපදිංචි වී ඇති මුළු විශ්ව විද්‍යාල විද්‍යා සංගම් ගණන 85කි.

- යොවුන් විද්‍යා සංගම් ජාලය (YSSN) පිහිටුවීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

සමාලෝචිත වර්ෂය තුළ විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් පාසල් තුනකට මූල්‍ය ආධාර සහ සම්පත් දායකයින් ලබා දෙන ලදී.

1. කොත්මලේ, ඩෙල්ටා ගැමුණුපුර මධ්‍ය විද්‍යාලය විසින් සංවිධානය කරන ලද “Sci-Eye” අධ්‍යාපන පර්යේෂණ සම්මන්ත්‍රණය 2021.
2. වත්තල ලයිසියම් ජාත්‍යන්තර පාසලේ පර්යේෂණ සම්මන්ත්‍රණය සහ විද්‍යා දිනය.
3. රාජකීය විද්‍යාලයේ විද්‍යා සංගමය මගින් පවත්වන ලද “ExperiMentals 21” අන්තර් පාසල් විද්‍යාත්මක අදහස් හා පර්යේෂණ තරඟය සඳහා පර්යේෂණ අදහස් හා ව්‍යාපෘති යෝජනා ඇගයීම මගින් සහාය විය.

ද්විතීය හා තෘතීය මට්ටමේ සිසුන් සඳහා තරග

9 - 13 ශ්‍රේණිවල සිසුන් සඳහා වන විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟය (SRPC) යටතේ සලකා බැලීම සඳහා ජාතික විද්‍යා පදනම වෙත පර්යේෂණ ව්‍යාපෘති යෝජනා 215ක් ලැබිණි. විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරඟයේ අවසන් ඇගයුම් පියවර දෙකකින් සිදු කරන ලදී: පියවර I: බහුමාධ්‍ය ඉදිරිපත් කිරීම් මත පදනම්ව විද්‍යා ව්‍යාපෘති 20ක් තෝරා ගැනීම, පියවර II: I පියවරේදී තෝරාගත් ව්‍යාපෘති 20 අතරින් පෝස්ටර් ඉදිරිපත් කිරීම් මත පදනම්ව හොඳම ව්‍යාපෘති දහය තෝරා ගැනීම. ජයග්‍රාහකයින්ගේ නම් වගුව 09 හි දී ඇත.

වගුව 09: විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගයේ ජයග්‍රාහකයින්

අංකය	නම	පාසල	ව්‍යාපෘති මාතෘකාව
1	ඒ වයි බී වීරකෝන්	ධර්මරාජ විද්‍යාලය, මහනුවර	වතුපාලු ශාකයේ (*Mikania micrantha*) කොළ ජල සාරයේ පළිබෝධ පාලන බලපෑම විමර්ශනය කිරීම
2	යූ ජී හාෂිණී ලක්ෂිකා අබේකෝන්	ඩෙල්ටා ගැමුණුපුර මහා විද්‍යාලය, පුස්සැල්ලෑව	විවිධ තත්ව යටතේ කැබලි භාවිතා කරමින් Dracaena sanderiana ප්‍රචාරණය
3	ජේ ඒ ලිනුරි හිමංසා ඩබ්ලිව් නදුනි නවෝද්‍යා රොනෙත්මි සඳෙව්මා අලවත්ත	සිරිමාවෝ බණ්ඩාරණායක විද්‍යාලය, කොළඹ 7	නැවුම් *Cocos nucifera f.dnfli* (පැලපී) භාවිතයෙන් බීමට සූදානම් පානයක් නිර්මාණය කිරීම
4	ඩබ්ලිව් ආර් එම් යූ ඒ කේ වික්‍රමසිංහ ජී ඩී කනාතෙගෙදර ටී එම් පී ආර් වී තෙන්නකෝන්	මහාමායා කාන්තා විද්‍යාලය, මහනුවර	පොලිතීන් හායනය කරන ක්ෂුද්‍රජීවීන් විසංගමනය
5	තරුෂි ඒකනායක ශ්වේතා අබේවර්ණ	හිල්වුඩ් විද්‍යාලය, මහනුවර	ශ්‍රී ලංකාවේ කල්පිටිය අර්ධද්වීපයේ වෙරළාසන්නයේ සහ අක්වෙරළ ආශ්‍රිතව සිදු කෙරෙන ධීවර කර්මාන්තයේදී අහඹු ලෙස මුහුදු කැස්බෑවුන් හසුවීම පිළිබඳ අධ්‍යයනය
6	ආර් කේ සඳුනි නෙත්මිණි රාමනායක එම් පාරමිතා විජයවර්ධන	රත්නාවලී බාලිකා විද්‍යාලය, ගම්පහ	*Aedes aegypti L. (Diptera: Culicidae)* මදුරු කීටයින්ට එරෙහිව යොදා ගත හැකි කීටනාශක කාරකයින් වර්ධනය කිරීම සඳහා දේශීය ශාක විශේෂ ඇගයීම
7	සංදීප රාජකරුණා ගවිරු ද සිල්වා නිලුමින්ද ධර්මවර්ධන	ත්‍රිත්ව විද්‍යාලයල, මහනුවර	ශ්‍රී ලංකාවේ මහනුවර උඩවත්තකැලේ රක්ෂිත වනාන්තරයේ ඕළු මුවන්ගේ *(Muntiacus muntjak malabaricus)* ගහන ගතිකතාව
8	රිවිරු දිල්වන් ගුණසේන	චේල්ස් කුමර විද්‍යාලය, මොරටුව	තෝරාගත් ගෘහස්ථ කාබනික අපද්‍රව්‍ය කුඩා පරිමාණයේ වගා කටයුතු සඳහා උපස්තරයක් ලෙස භාවිතා කිරීම සඳහා ඇති යෝග්‍යතාව සහ ඒවා වාණිජ පරිමාණයෙන් සැකසීම සඳහා ඇති හැකියාව
9	පී කොවර්තනන් එම් රතුකේෂ් ටී මනෝජ්කරන්	පද්දිරිප්පු මධ්‍ය විද්‍යාලය, කලවන්චිකුඩි	ඇලුමිනියම් ඔක්සයිඩ් විකරණය කරන ලද මැටි මඟින් ඵලදායී ලෙස ෆ්ලෝරයිඩ් අවශෝෂණය වීම පිළිබඳ මූලික අධ්‍යයනය
10	සාෆා රිසාන් සාදිකා ශෂීමා සීමා ෆයිසාල්	මුස්ලිම් කාන්තා විද්‍යාලය, කෙන්සිංටන් ගාඩන්, කොළඹ 4	කොළඹ තෝරාගත් පාසලක සාමාන්‍ය පෙළ සිසුන්ගේ දෙමවුපියන් අතර ඩිමෙන්ෂියාව සම්බන්ධයෙන් පවතින අවබෝධය ආශ්‍රිත දැනුම, ආකල්ප හා භාවිතයන් සහ සාධක

ව්‍යාපෘති 2020/2021 තරඟයේ ජයග්‍රාහකයින් වන, ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලයේ සදුනි රාමනායක සහ පාරමිතා විජේවර්ධන පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය විසින් සංවිධානය කරන ලද " iPURSE 2021, සඳහා වාචික ඉදිරිපත් කිරීම් සමගින් සහභාගී වීමට පිළිගනු ලැබීය. උත්සවය පැවැත්වුණේ 2021 නොවැම්බර් 11 වැනිදාය.

විද්‍යා තරඟ පැවැත්වීමේ වාර්ෂික වැඩසටහන යටතේ "දේශය යළි ගොඩනැගීමට විද්‍යාව යොදා ගනිමු" යන තේමාව යටතේ විද්‍යා තරඟ අටක් පවත්වන ලදී. සියලුම ජයග්‍රාහකයින් සඳහා මුදල් ත්‍යාග සහ සහතිකපත් ප්‍රදානය කෙරිණි. විද්‍යාව ප්‍රවර්ධනය කරන ගුරුවරුන් සහ හොඳම ක්‍රියාකාරී පාසල් විද්‍යා සංගම් ද මෙහිදී ඇගයීමට ලක් විය.



රූප සටහන 50: 2021 වසරේ විවිධ තරග සඳහා පාසල් සිසුන්ගේ සහභාගීත්වය

"ඩිජිටල් වෘත්තාන්ත" - "Digital Story Telling" තරඟයේ හොඳම තරඟකරුවන් 20 දෙනා විද්‍යා සාක්ෂරතාවය සඳහා වන ලෝක සංවිධානය විසින් සංවිධානය කරන ලද "නිර්මාණාත්මක ජනප්‍රිය විද්‍යා වීඩියෝ කෘති සඳහා වන ජාත්‍යන්තර තරඟයට" සහභාගී වීමට යොමු කරන ලදී. තරඟය පැවැත්වූයේ "සමාජයේ තිරසාර සංවර්ධනය, යන තේමාව කේන්ද්‍ර කොටගෙනය. මෙම තරගයේදී පළමු ත්‍යාගය දිනාගත් 05 දෙනෙකු, දෙවන ත්‍යාගය දිනාගත් 10 දෙනෙකු සහ තෙවන ත්‍යාගය දිනාගත් 50 දෙනෙකු තෝරාගෙන තිබුණි.

වගුව 08: නිර්මාණාත්මක ජනප්‍රිය විද්‍යා විඩියෝ කෘති සඳහා වන ජාත්‍යන්තර තරගයේ ජයග්‍රාහකයින්

ජයග්‍රාහකයාගේ නම	විඩියෝවේ මාතෘකාව	ස්ථානය
කිසර ගෙත්මින් පෙරමුණුගමගේ පහන්දි උදානා පෙරමුණුගමගේ	තිරසර බලශක්ති ප්‍රභවයන් තුළින් පෘථිවිය සුරැකීම	පළමු ස්ථානය
එම් හසිනිදු ජයශාන් ද සිල්වා	ජීවිතය හා සෞඛ්‍යය සඳහා ජනතාවගේ විද්‍යා සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම	පළමු ස්ථානය
පී ඒ තෙව්මාලි පියදාස	දේශගුණික විපර්යාස හා කාබන් විමෝචනය	දෙවන ස්ථානය
දෙනගමගේ සනුග දුල්වන්	නිර්මාණශීලී චින්තකයෝ වඩාත් යහපත් ලොවක් තනති	දෙවන ස්ථානය
දිදුලි දියනදිනි	අකුණු බලශක්ති ප්‍රභවයක් වශයෙන් භාවිතා කළ හැකිද	තෙවන ස්ථානය
දිනිති විජේගුණවර්ධන	ගැඹුරු මුහුදල ගැඹුරු අභ්‍යවකාශය සහ ගැඹුරු පොළොව	තෙවන ස්ථානය
ගුම්සර වීරසිංහ	පාලම්වල අන්තර්ගත විද්‍යාව	තෙවන ස්ථානය
තෙව්නිත පියදාස	සෞඛ්‍යය හා ජීවිතය	තෙවන ස්ථානය
එම් ජයන්ත ද සිල්වා	කෘෂිකර්මාන්තය හා ආහාර සුරක්ෂිතතාව	තෙවන ස්ථානය

'Kid Naturalist' යනු පරිසරය ගවේෂණය කිරීම සඳහා පෙලඹීමෙන් කටයුතු කිරීමට ප්‍රාථමික සිසුන් (1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා) දිරි ගන්වන නව තරගයක් වන අතර එය හඳුන්වාදෙනු ලැබුවේ 2020 වසරේය. එමගින් සැලසුම් කරන ලද්දේ පාසල් වසා තැබීමට සිදුවූ කාල සීමාව තුළ සිසුන් තම කාලය ඵලදායී අන්දමින් භාවිතා කරන බවට වග බලා ගැනීමයි. එහි ජයග්‍රාහකයින් ඇගයීම ලෝක විද්‍යා දින සැමරුම් උළෙලේදී සිදු විය.

ලෝක විද්‍යා දින සැමරුම

සෑම වසරකම නොවැම්බර් 10 වනදා සාමය සහ සංවර්ධනය සඳහා වූ ලෝක විද්‍යා දිනය වශයෙන් යුනෙස්කෝ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කර ඇත. මෙම සැමරුම මගින් සමාජය තුළ විද්‍යාවට හිමි වැදගත් කාර්යභාරය සහ මතුවෙමින් පවතින විද්‍යාත්මක ගැටලු පිළිබඳ වාද විවාද සඳහා මහජනතාව පුළුල් ලෙස සම්බන්ධ කර ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරේ. තවද එය අපගේ එදිනෙදා ජීවිතයේදී විද්‍යාවේ වැදගත්කම සහ අදාළත්වය ද අවධාරණය කරයි.

ජාතික විද්‍යා පදනම විසින් ලෝක විද්‍යා දිනය නොවැම්බර් 16 වන දින දෙමුහුන් ආකෘතියේ උත්සවයක් ලෙස බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී සමරන ලද අතර නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ සංවර්ධන රාජ්‍ය අමාත්‍ය, ආචාර්ය සීතා අරඹේපොල මහත්මිය එයට ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගී වූවාය. "දේශය යළි ගොඩනැගීමට විද්‍යාව යොදා ගනිමු" යන්න මෙම වර්ෂයේ තේමාව වියග කීර්තිමත් විද්‍යාඥයින් දෙදෙනෙකු විසින් උත්සවයේ ප්‍රධාන දේශන පවත්වන ලදී. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශයේ, ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂිකා සහ ක්ෂුද්‍රජීව විද්‍යා අංශයේ මහාචාර්යවරියක වන නීලිකා මලවිගේ මහත්මිය විසින් "ජාතික සංවර්ධනය සඳහා විද්‍යාත්මක පර්යේෂණ වැදගත් වන්නේ මන්ද" යන මැයෙන්ද, නව නිපැයුම්කරු, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ විද්‍යාඥ සහ Hybrid Technologie හි ප්‍රධාන විධායක නිලධාරී සහ SLINTEC ආයතනයේ උපදේශක/නැනෝ තාක්ෂණ යෙදවුම්, මංජු ගුණවර්ධන මහතා විසින් "දේශය යළි ගොඩනැගීම සඳහා නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම" මැයෙන්ද දේශන පැවැත්වූහ.



විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ප්‍රකාශන

ජෛව ආරක්ෂාව, කොවිඩ් 19, නිහඬ දූෂණය සහ සාම්ප්‍රදායික නොවන පාරිසරික උපද්‍රව යන තේමාව යටතේ "විදුරාව" විද්‍යා සඟරාව පළ කරන ලදී.



විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා වන ප්‍රධාන යෝජනා ක්‍රමය යටතේ මහජනතාව ඉලක්ක කොට පොත් අටක් මුද්‍රණය කරන ලදී.

1) සලින්ද වීරසිංහ මහතා සහ එච් එච් හර්ෂණී දේදුණු මෙය විසින් රචිත "SPSS සරලව"
2) මහාචාර්ය උපාලි සමරජීව විසින් රචිත "ආරක්ෂිත ආහාර සැකසීම"
3) මහාචාර්ය සුනේත්‍රා කරුණාරත්න විසින් රචිත "ෆින්ලන්තය අපේ ඇසින්"
4) ආචාර්ය නන්ද සේනානායක විසින් රචිත "Rice production principles, practices and constrains in Sri Lanka"
5) මහාචාර්ය ඕ ඒ ඉලේපෙරුම විසින් රචිත "Chemistry in everyday life"
6) අසෝක ද සිල්වා මහතා විසින් රචිත "A historical review of Science planning and research in Sri Lanka 1812-2000"
7) ආචාර්ය අයේෂා වික්‍රමසිංහ විසින් රචිත "Dress of women in Sri Lanka"
8) ආචාර්ය කණපති ගජපති විසින් රචිත "Sandfly taxonomy, pictorial illustrations of Sri Lankan sand flies"
9) අසෝක ද සිල්වා මහතා විසින් රචිත "Indigenous knowledge, traditions, culture and lifestyle practices in ancient Sri Lanka"









උප කාර්යයන් සහ තිරසාරත්වය

පෙර වසරවලදී මෙන්ම, කාර්ය මණ්ඩලයේ කළමනාකාරිත්වය සහ තාක්ෂණික නිපුණතාව සමඟින් ප්‍රතිපත්ති, ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහා ජාතික විද්‍යා පදනම විසින් අඛණ්ඩ උත්සාහයක් දරන ලදී. සේවා පරිසරය වැඩිදියුණු කොට ප්‍රීතිමත් සහ තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් බිහි කිරීම ජාතික විද්‍යා පදනම විසින් සැලකිල්ලට ගෙන ඇති තවත් වැදගත් කරුණක් විය.

පරිපාලන සහාය

පොදු පරිපාලන කටයුතු, මානව සම්පත් සංවර්ධනය, වත්කම් කළමනාකරණය සහ කාර්ය සම්පාදන අවශ්‍යතා සපුරාලීම යන කාර්යයන් ජාතික විද්‍යා පදනමේ පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යයන් වේ. සමාලෝචිත වර්ෂය තුළ, ජාතික විද්‍යා පදනමේ මූලික කාර්යයන් ඉටු කිරීම සඳහා ජාතික විද්‍යා පදනමේ අනෙකුත් අංශ වෙත පරිපාලන අංශය අඛණ්ඩව සහයෝගය ලබා දුන්නේය.



රූප සටහන 51: උපයෝගිතා පහසුකම් සඳහා වියදම (2017-2021)

මූල්‍ය සහාය

රජයේ භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද පවත්නා මූල්‍ය රෙගුලාසි ඇතුළත, ක්‍රියාකාරී සැලැස්ම තුළ සැලසුම් කර ඇති සහ අනුමත කර ඇති සියලුම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය අංශය සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කරයි. යාවත්කාලීන යාන්ත්‍රණ සහ මෙවලම් භාවිතයෙන් සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.



රූප සටහන 52: ප්‍රමුඛතා ක්ෂේත්‍ර යටතේ මූල්‍ය කාර්යසාධනය



රූප සටහන 53: වෙන් කළ මුළු මුදල වූ රුපියල් මිලියන 67.897 න් ප්‍රමුඛතා ක්ෂේත්‍ර යටතේ වැය කළ මුදල ප්‍රතිශතයක් වශයෙන්

තොරතුරු තාක්ෂණ සහාය

ආයතනික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් නඩත්තු කිරීම සහ ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩලයට අවසාන පරිශීලක තොරතුරු තාක්ෂණ සහාය සැපයීම තොරතුරු තාක්ෂණ ඒකකයේ වගකීම වේ. 2021 වසර තුළ, මාර්ගගත වෙබිනා වැඩසටහන් හා රැස්වීම් පැවැත්වීමට කටයුතු සම්පාදනය කිරීම සහ තාක්ෂණික සහාය සැපයීම යනාදිය මගින් "නිවසේ සිට රාජකාරි" ඉටු කිරීමේ ආයතනික සංස්කෘතිය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ඒකකය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ඇත.

ක්‍රියාවලි සහ ක්‍රියා පරිපාටි වැඩි දියුණු කිරීම

වර්ෂය තුළ සියලුම වැඩ කටයුතු පෙර වසරේ දෙසැම්බර් මස සකස් කර අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව සිදු කරන ලදී. විවිධ අනිවාර්ය ක්‍රියාකාරකම් යටතේ ලබා ඇති ප්‍රගතිය මත පදනම්ව අනුමත ප්‍රතිපාදන තුළ ප්‍රාග්ධන අයවැය නැවත වෙන් කිරීමට වසර මැද සංශෝධන සිදු කරන ලදී. ජාතික විද්‍යා පදනමෙහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය ජාතික විද්‍යා පදනමේ කළමනාකාරිත්වය සහ අනෙකුත් අදාළ බලධාරීන් වෙත මාසිකව, කාර්තුමය වශයෙන් සහ මැද වාර්ෂිකව වාර්තා කරන ලදී.

යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව විෂය පථයට අනුකූලව කටයුතු කරමින්, අංශ ප්‍රධානීන්ගේ රැස්වීම් මඟින් විධිමත් වේදිකාවක් තනා දුන්නේ පරිපාලන කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමට පහසුකම් සලසමින් හා එමඟින් කළමනාකරණ මණ්ඩලය වෙත කාලීන නිර්දේශ ඉදිරිපත් කිරීමට මග පාදමිනි.

වර්ෂය තුළදී නිත්‍ය මණ්ඩල රැස්වීම් 12ක් පවත්වන ලදී.

කාර්ය මණ්ඩලයේ තාක්ෂණික නිපුණතාව වැඩි දියුණු කිරීම

පුහුණුව ලබාදීමේ පරමාර්ථය වන්නේ ආයතනයක අරමුණුවලට අදාළව ආයතනයේ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය කුසලතා, දැනුම සහ ආකල්පවලින් පුද්ගලයින් සන්නද්ධ කිරීමයි. සේවකයින්ගේ යථාර්ථවාදී අභිලාෂයන් සැලකිල්ලට ගන්නා අතරම ආයතනයේ අරමුණුවලට අදාළව ආයතනයේ/අංශයන්හි පවතින අවශ්‍යතා පිළිබඳ විචාරාත්මක තක්සේරුවකින් පසුව පුහුණු කිරීම් සිදු කරනු ලැබේ. ජාතික විද්‍යා පදනම තුළ පුහුණුව සහ සංවර්ධනය යනු කාණ්ඩය කුමක් වුවත්, සෑම සේවකයෙකු සඳහාම වන අඛණ්ඩ ක්‍රියාවලියකි.

ජාතික විද්‍යා පදනම විසින් සියළුම මාණ්ඩලික, කළමනාකරණ, විධායක සහ අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය වෙත ඔවුන්ගේ රැකියාවට අදාළ දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථා ලබා දීමේ වටිනාකම සහ වැදගත්කම හඳුනාගෙන ඇත. සංවර්ධනය සහ පුහුණුව සමඟ පුද්ගල ඵලදායිතාව ඉහළ යනු ඇතැයිද කාර්ය මණ්ඩලය ජාතික විද්‍යා පදනමේ බැඳීම්වලට සහය දැක්වීම සඳහා ඔවුන්ගේ අංශවල කටයුතු වෙත විශිෂ්ට දායකත්වයක් ලබා දෙනු ඇතැයිද ජාතික විද්‍යා පදනම අපේක්ෂා කරයි. සීමිත සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ පුද්ගලයින්ගේ පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම මගින්, පුද්ගලික සංවර්ධනය සහ රැකියා තෘප්තිය සඳහා කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා සපුරාලන අතරම කාර්ය මණ්ඩලයේ පූර්ණ හැකියාවන් උපයෝගී කර ගැනීමට ජාතික විද්‍යා පදනම අපේක්ෂා කරයි.

ඒ අනුව, ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩල සංවර්ධන කමිටුව විසින්, අංශ සහ ඒකක ප්‍රධානීන් විසින් හඳුනාගත් පුහුණු අවශ්‍යතා මත පදනම්ව ආයතනය සඳහා වන වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කරන ලදී. කාර්ය මණ්ඩල පුහුණු ප්‍රතිපත්තියේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව, කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා වෙන් කළ වාර්ෂික ප්‍රතිපාදන තුළ, වර්ෂය තුළ කාර්ය මණ්ඩලය වෙත අවශ්‍යතා මත පදනම් වූ පුහුණු අවස්ථා ලබා දීමට කාර්ය මණ්ඩල සංවර්ධන කමිටුව විසින් සෑම උත්සාහයක්ම දරන ලදී. කොවිඩ් වසංගතය නිසා බොහෝ පුහුණු අවස්ථා සඳහා බාධා ඇති වුවද, අවශ්‍යතා සපුරාලන මාර්ගගත වැඩසටහන්වලට කාර්ය මණ්ඩලය සහභාගි වූහ.

ලබා දෙන ලද පුහුණු පිළිබඳ විස්තර *ඇමුණුම 07* හි දැක්වේ.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

PED/55 චක්‍රලේඛය මගින් ලබා දී ඇති විධානයන්ට අනුව, ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩලය විසින් 2020 පෙබරවාරි 27 වන දින පැවති එහි රැස්වීමේදී විගණන හා කළමනාකරණ කමිටුවේ සේවය කිරීම සඳහා භාණ්ඩාගාර නියෝජිත ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු පත් කරන ලදී. මෙම කමිටු සාමාජිකයෝ 2021 වසරේද අඛණ්ඩව සේවය කළහ. කෙසේවුවද, ජාතික විද්‍යා පදනමේ භාණ්ඩාගාර නියෝජිත ආර් එම් ඩී කේ ජී එන් රණතුංග මහතා වෙනුවට රුස්නියා ආබ්දීන් මහත්මිය නම් කරන ලදී. ඉංජිනේරු (මහාචාර්ය) එස් බී එස් අබයකෝන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඔහු වෙනුවට මහාචාර්ය නිමල් නවරත්න 2021 ඔක්තෝම්බර් මස සිට පත් කරන ලදී. ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකුට සහ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාට විගණන හා කළමනාකරණ කමිටුවේ කටයුතු සම්බන්ධයෙන් නිරීක්ෂකයින් ලෙස කටයුතු කිරීම සඳහා ආරාධනා කරන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුවේ සැලැස්ම වූයේ කාර්තුමය පදනමින් හමුවීමයි. කෙසේවුවද, රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන්, 2021 වර්ෂය සඳහා පැවැත්වූයේ රැස්වීම් දෙකක් පමණක් වූ අතර ඒ ඔක්තෝබර් 29 සහ 2022 ජනවාරි 12 යන දිනවලයි. එම රැස්වීම් දෙකෙහිදීම විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කළේ රුස්නියා ආබ්දීන් මහත්මියයි. විගණන හා කළමනාකරණ කමිටුව විසින් එහි නිර්දේශ එහි රැස්වීම් වාර්තා සමඟ කළමනාකරණ මණ්ඩලය වෙත යොමු කරන ලද අතර ජාතික විද්‍යා පදනමේ අභ්‍යන්තර විගණක විසින් විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ ජාතික විද්‍යා පදනමේ අංශ ප්‍රධානීන් වෙත යොමු කරන ලද්දේ බාධාවකින් තොරව කටයුතු සිදු කරගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටයි. ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රගති වාර්තාද පසුව පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී වාර්තා කරන ලදී.

විගණන හා කළමනාකරණ කමිටුව විසින් ප්‍රගතිය සමාලෝචනය කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරවන ලදී.

- ජාතික විගණන කාර්යාලයේ විමසුම් අවසන් වන තෙක් පසු විපරම් කිරීම සහ නැවත නැවත සිදුවන විමසීම් වලක්වා ගැනීම.
- වසර පුරා ජාතික විද්‍යා පදනමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතා පිළිබඳ පසු විපරම් සිදු කිරීම.
- ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සහ නිවැරදි කිරීම් හා වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන නිරීක්ෂණ සහ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සහ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලයට උපකාර වන නිර්දේශ සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් සමාලෝචනය කර මගපෙන්වීම් සිදු කිරීම.



රූප සටහන 53: ලද විගණන විමසුම් සංඛ්‍යාව (2017-2021)

මුද්‍රණ සහාය

රටතුළ පැවති වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද මුද්‍රණ අංශය පවතින සම්පත් සමඟ විද්‍යාත්මක අංශවල මුද්‍රණ අවශ්‍යතා සපුරාලන මුද්‍රණ කටයුතු සිදු කරමින් අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඒ අනුව, මුද්‍රිත විද්‍යාත්මක තොරතුරු එළි දක්වමින් පාර්ශ්වකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා ගුණාත්මක නිමැවුම් සහිතව පහත කාර්යයන් සම්පූර්ණ කරන ලදී. මෙම වසර තුළ විවිධ වර්ගයේ ප්‍රකාශන පහළොවක් (15) මුද්‍රණය කරන ලදී. ඒ පිළිබඳ විස්තර *වගුව 11* හි දී ඇත.

වගුව 11: මුද්‍රණය කරන ලද විවිධ දෑ

ප්‍රකාශනය	ප්‍රමාණය
ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව	
2020 ජුනි සහ ප්‍රධාන ප්‍රකාශනයේ පළවූ ලිපිවල මුද්‍රිත පිටපත්	75+20
2020 ජුනි සහ ප්‍රධාන ප්‍රකාශනයේ පළවූ ලිපිවල මුද්‍රිත පිටපත්	75+20
ජාතික විද්‍යා පදනම් සඟරාව	
2020 ජුනි සහ ප්‍රධාන ප්‍රකාශනයේ පළවූ ලිපිවල මුද්‍රිත පිටපත්	180 +20
2020 සැප්තැම්බර් සහ ප්‍රධාන ප්‍රකාශනයේ පළවූ ලිපිවල මුද්‍රිත පිටපත්	180 +20
විදුරාව	
2019 අප්‍රේල් - ජුනි (දෙමළ)	750
2019 ඔක්තෝම්බර් - දෙසැම්බර් (දෙමළ)	750
2020 අප්‍රේල් - ජුනි (ඉංග්‍රීසි)	1600
2020 අප්‍රේල් - ජුනි (සිංහල)	2000
වෙනත්	
සංඛ්‍යානමය අත්පොත 2018	250
පර්යේෂණ සම්මාන පොත් පිංච 2021	85
වාර්ෂික වාර්තාව - 2019 (භාෂා 3)	02
වාර්ෂික වාර්තාව - 2020 (භාෂා 3)	02

මීට අමතරව, මුද්‍රණ ඒකකය 2021 වර්ෂය තුළ වෙන් වෙන් වශයෙන් වූ මුද්‍රණ කාර්යයන් සඳහා ඉල්ලීම් දාහතරක් (14) ඉටු කර දීමෙන් ජාතික විද්‍යා පදනමේ අනෙකුත් සියලුම මුද්‍රණ අවශ්‍යතා ආවරණය කළේය.

ජාතික විද්‍යා පදනම කාබන් උදාසීන ආදර්ශ ආයතනයක් බවට පත් කිරීම සඳහා මූලාරම්භය

තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයට අනුකූලව, අදාළ විෂයය පථයන්හි ජාතික මට්ටමේ ක්‍රියාවන් තීරණාත්මක වශයෙන් හඳුනාගෙන ඇත්තේ, ඒවායේ ප්‍රතිඵල අන්තර්ක්‍රියාකාරී අන්දමින් නියමිත ඉලක්ක සපුරා ගැනීම සඳහා හැකියාව ලබාදෙන බැවිනි. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ සහ සංවර්ධනයේ අවධිය අනුව ශ්‍රී ලංකාවේ අපේක්ෂිත දායකත්වය සැලකිය යුතු පමණක් නොව, තීරණාත්මකද වේ. දකුණු ආසියාවේ ශීඝ්‍රයෙන් වර්ධනය වන ආර්ථිකයක් ලෙස, ශ්‍රී ලංකාවට නියමිත පාරිසරික ඉලක්කවලට අනුකූල වීම සඳහා පමණක් නොව, දිගු කාලීනව ආර්ථික තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ද පොසිල සම්පත්වලින් තම ආර්ථිකය මුදවාලීමට සිදුවේ. එබැවින්, පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීම [RENi], තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය [SCP] වැනි පසුකාලීනව ශූන්‍ය විමෝචන පද්ධති සාක්ෂාත් කර ගැනීමට තුඩු දෙන ස්ථිරසාර ක්‍රියාමාර්ග සඳහා ජාතික වශයෙන් ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එහෙත්, සංවර්ධිත ආර්ථිකයන්හි රාජ්‍ය අංශයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ ඒ සම්බන්ධයෙන් ගැනෙන ප්‍රායෝගික ක්‍රියාමාර්ග සහ සාර්ථක උදාහරණ බොහෝ දුරට දක්නට නොලැබේ. ඒ අනුව, රාජ්‍ය අංශයට, පුද්ගලික අංශයට සහ මහ ජනතාවට පුද්ගල සහ ජාතික අවශ්‍යතා සපුරාලන විෂය පථයන් තිබෙන්නේ කා හටද යන්න පිළිබඳ සාර්ථක විනිශ්චයක් ඇති කරගත හැකි වන පරිදි ශූන්‍ය විමෝචන තාක්ෂණයන් සහ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම මගින් ජාතික ප්‍රදීපාගාර ව්‍යාපෘතියක් ලෙස ශූන්‍ය විමෝචන රජයේ කාර්යාලයක් පිහිටුවීමේ දැක්ම ඇතිව ජාතික විද්‍යා පදනම විසින් යම් මූලපිරීම් සිදු කරන ලදී.

මෙම මූලපිරීමේ පොදු අරමුණු වූයේ ජාතික විද්‍යා පදනම ශ්‍රී ලංකාවේ වඩාත්ම ආදර්ශමත් පරිසර හිතකාමී ආයතනයක් බවට පත් කිරීම හා තිරසාර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය, විශේෂයෙන්ම එහි ඉලක්ක 7, 8, 9, 12 සහ 13 සාක්ෂාත් කර ගැනීමයි. මෙහි විශේෂිත අරමුණු වනුයේ කාබන් පියසටහන අඩු කිරීම හා අවම කිරීම සහ කාබන් උදාසීනතාව සාක්ෂාත් කර ගැනීම, ජල පියසටහන අඩු කිරීම හා අවම කිරීම, පාරිසරික පියසටහන අඩු කිරීම හා අවම කිරීම සහ අභ්‍යන්තර වාතයේ ගුණාත්මකභාවය හා වැඩ කරන පරිසරය වැඩිදියුණු කිරීම ය.

යෝජිත මැදිහත්වීම්/උපාය මාර්ග/ක්‍රියාකාරකම් ත්‍රිවිධ ආකාරයක් ගනී:

කෙටි කාලීන ව්‍යාපෘති: ජාතික විද්‍යා පදනම කඩදාසි භාවිතයෙන් තොර ආයතනයක් බවට පත් කිරීම, කොට්ඨාශ තුළ ප්‍රතිව්‍යුහගත කිරීම - මුද්‍රණ යන්ත්‍ර සඳහා වෙනම ප්‍රදේශ, එක් එක් මේසයට ගෘහස්ථ ශාක, කොරිඩෝ හා එක් එක් අංශය සඳහා ශාක, වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට හා අක්‍රිය කිරීමට පද්ධතියක්, කාර්යක්ෂම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ උපාය මාර්ග හා තාක්ෂණයන් යොදා ගැනීම, කොම්පෝස්ට් ඒකකයක් ස්ථාපිත කිරීම, ගෙවත්තක් පවත්වාගෙන යාම, LED මත පදනම් වූ ගෘහස්ථ හා එළිමහන් ආලෝකකරණය.

මධ්‍ය කාලීන ව්‍යාපෘති: වැසි ජලය රැස්කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම, සංවාතන පද්ධතිය තුළට නැවුම් වාතය ඇතුළු වීමේ මග, ජලය ඉතිරිකිරීමේ ස්ථාපනයන්, (අර්ධ වශයෙන් පෙර-පිරියම් කළ) කිලිටි ජලය භාවිතා කිරීම.

දිගු කාලීන ව්‍යාපෘති: වහල මත ප්‍රකාශ වෝල්ටීය [PV] සවි කිරීම, බලශක්ති කළමනාකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම, හිරුට (නැගෙනහිර/බටහිර) සෘජුවම නිරාවරණය වන කවුළු මත තුනී ලෝහ පත්‍ර [window films] ආස්තරණය, කාබන් උදාසීන බලශක්තිය මත පදනම්ව අභ්‍යන්තර සහ බාහිර සංචලතා අවශ්‍යතා කළමනාකරණය කිරීමට විද්‍යුත් සංචලතා විකල්පය යොදාගැනීම, ජලය රහිත කැසිකිළි යෙදීම සහ රික්තක වැසිකිලි ස්ථාපනය කිරීම, කිලිටි සහ අපවහන ජල ප්‍රවාහයන් වෙනම එකතු කිරීම, පිරියම් කිරීම සහ භාවිතය.

අපේක්ෂිත නිමැවුම් යනු යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමත් සමඟ උපයෝගිතා භාවිතය කොපමණ ප්‍රමාණයකින් අඩු කළ හැකිද යන්න පිළිබඳ ගණනය කිරීම් වේ. අපේක්ෂිත ප්‍රතිඵල වනුයේ, මහජන උපයෝගිතා, ගමන් හා ප්‍රවාහන කටයුතු සහ කාර්යාලීය පාරිභෝගික භාණ්ඩ/ ලිපි ද්‍රව්‍ය සඳහා වන වියදම් සැලකිය යුතු ලෙස අඩු කිරීම අරමුණු කරගත් මැදිහත්වීම්, හරිත ගොඩනැගිලි/හරිත සහතිකය සඳහා වන ජාතික/ ජාත්‍යන්තර ප්‍රමිතීන් සඳහා ඉල්ලුම් කළ හැකි තත්ත්වයක සිටීම යනාදියයි.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ එස් 5 තත්ව කව ව්‍යාපෘතිය

"ජාතික විද්‍යා පදනම කාබන් උදාසීන තත්වයට පත්කිරීම" යටතේ සඳහන් කර ඇති එක් කෙටි කාලීන ව්‍යාපෘතියකට ඌනපූරණයක් වශයෙන් සහ එස් 5 තත්ත්ව කව ව්‍යාපෘතිය යටතේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වෙනම උප ව්‍යාපෘතියක් සැලසුම් කරන ලදී. මෙම උප ව්‍යාපෘතිය යටතේ සැලසුම් කළ ක්‍රියාකාරකම් වන්නේ: අපද්‍රව්‍ය වෙන් කිරීම පිළිබඳ පූර්ව දැනුවත්භාවය ඇතිකිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම, ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය හා වර්ග පිළිබඳ

සමීක්ෂණය, විවිධ වර්ගයේ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කාර්යසටහන් සහ මාර්ගෝපදේශ සකස් කිරීම, අනුමැතිය ලබා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම, උපදේශකයෙකු පත් කිරීම, කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ස්ථානයක් තෝරා ගැනීම, අවශ්‍ය උපකරණ මිලදී ගැනීම, සේවා සපයන්නන් තෝරා ගැනීම, කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ස්ථානයක් ඉදිකිරීම, සැලසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම, දිරාපත් නොවන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම, දිරාපත් වන අපද්‍රව්‍ය පිළිබඳ ව්‍යාපෘතිය - කොම්පෝස්ට් කිරීම, ක්‍රියාත්මක කිරීම.

අනාගත ප්‍රක්ෂේපණ වාර්තාව

වැඩසටහන	ක්‍රියාමාර්ග	
	කෙටි කාලීන	මධ්‍ය කාලීන
1. පර්යේෂණ හා සංවර්ධන විභවතාව ශක්තිමත් කිරීමට පහසුකම් සැලසීම සහ මූලික හා ව්‍යවහාරික පර්යේෂණ සඳහා සහාය වීම	• අපේක්ෂිත නිමැවුම් සහතික කිරීම සඳහා සියලු ප්‍රදාන කලින් කලට ඇගයීමට ලක් කිරීම • පශ්චාත් උපාධි අධීක්ෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් හඳුනාගෙන දිරිමත් කිරීම සහ පර්යේෂණ විශිෂ්ටත්වය හඳුනාගෙන ඇගයීම. • වාණිජකරණය සහතික කරමින් රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය තුළින් කර්මාන්ත වෙත නැඹුරු වූ තාක්ෂණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම. • ජාතික ප්‍රමුඛතා ක්ෂේත්‍ර, ඉතා බරපතල ජාතික අර්බුද පිළිබඳ තේමාත්මක /දැනටමත් අරමුදල් සපයා ඇති පර්යේෂණ සහ නිෂ්පාදන/ හා වාණිජ වටිනාකම සහිත • නිමැවුම් බිහි කිරීමේ හැකියාව ඇති සම්පූර්ණ කරන ලද පර්යේෂණ සඳහා පරතරයන් සම්පූර්ණ කිරීමේ පර්යේෂණ හඳුනාගැනීම • පර්යේෂණ සහ තාක්ෂණ අවශ්‍යතා හඳුනා ගැනීමට සහ එම අවශ්‍යතා සපුරාලීම සඳහා උපාය මාර්ග යෙදීමට කර්මාන්ත/ ආයතන සමඟ හවුල්කාරිත්ව වැඩසටහන් ආරම්භ කිරීම	• පර්යේෂණ සොයාගැනීම් ඵලදායී අන්දමින් ව්‍යාප්ත කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම • මානව සම්පත් විභවතාව ඇතුළුව පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා පහසුකම් වැඩි දියුණු කිරීමට සම්පත් ප්‍රශස්ත අන්දමින් භාවිතා කිරීම • තාක්ෂණ සංවර්ධනය/දියත් කිරීම /වාණිජකරණය සඳහා පහසුකම් සැලසීම
2. විද්‍යා හා තාක්ෂණ දර්ශක/සම්පත් සඳහා වේදිකාවක් සැපයීම සහ ප්‍රතිපත්ති පර්යේෂණ සිදු කිරීම	• ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය සිදු කිරීම • විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (STMIS) පවත්වාගෙන යාම • ප්‍රතිපත්ති පර්යේෂණ සිදු කිරීම, ප්‍රතිපත්ති පිළිබඳ සංක්ෂිප්ත • සටහන් ප්‍රකාශයට පත් කිරීම හා අපේක්ෂිත නිමැවුම් /ප්‍රතිඵල පිළිබඳ පසු විපරම් කිරීම	• ශ්‍රී ලංකාවේ තාක්ෂණ ක්ෂේත්‍රයේ තත්වය මැනීම සඳහා දර්ශක ඇති කිරීම/ යාවත්කාලීන කිරීම • විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා නවීන තාක්ෂණයන් යොදා ගනිමින් එම පද්ධතිය උත්ශ්‍රේණිගත කිරීම • ජාතික වශයෙන් ඉතා බරපතල /වැදගත් /ප්‍රමුඛ ගැටළුවලට විසඳුම් සෙවීම සඳහා ප්‍රතිපත්ති අධ්‍යයනයන් /සාකච්ඡාවන් මත පදනම්ව ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරිපත් කිරීම
3. ශ්‍රී ලංකාවේ හා පිටරට විද්‍යාඥයන් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරුව සඳහා පිහිටාධාර වීම සහ ජාතික මට්ටමෙන් සඟරා එකක් හෝ ඊට ඉහළ ගණනක් පළ කිරීම ප්‍රවර්ධනය කිරීම	• ජාත්‍යන්තර සම්පත් දත්ත පද්ධති වෙත පවතින සම්පත් සමගින් බ්‍රවුස් කිරීම/ සබ්ස්ක්‍රයිබ් කිරීම • විවෘත ප්‍රවේශය සහිත මාර්ගගත සඟරා භාවිතය ප්‍රවර්ධනය කිරීම • විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ පත්‍රිකා /ලිපි වෙත ප්‍රවේශය • සහතික කරමින් ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම • ශ්‍රී ලංකා මාර්ගගත සඟරා ව්‍යාපෘතිය (SLJOL) කළමනාකරණය • සම්සුරු සමාලෝචන ක්‍රියාවලිය වේගවත් කිරීම සහ ජාතික විද්‍යා පදනම් සඟරාව සහ ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව යන විද්‍යාත්මක සඟරා දෙක පළ කිරීම සඳහා ගතවන කාලය අඩු කිරීම • සඟරා ප්‍රකාශන අංශයේ මානව සම්පත් පදනම ශක්තිමත් කිරීම • ඩිජිටල් වේදිකාව හරහා විදේශයන්හි වෙසෙන කීර්තිමත් ශ්‍රී ලාංකිකයන්ගේ සේවය • ලබාගැනීම සහ උපායමාර්ගික වශයෙන් වාසි සහගත ක්ෂේත්‍රයන්හි නවතම දැනුම හුවමාරුව සඳහා පහසුකම් සැලසීම	• e-consortium පිහිටුවීම සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය විද්‍යා හා තාක්ෂණ ශාස්ත්‍රීය ලේඛන සඳහා ප්‍රවේශය ලබාදීම • විශේෂයෙන්ම දේශීය කතුවරුන් වෙතින් සඟරාව සඳහා ලිපි වැඩි ප්‍රමාණයක් ආකර්ශනය කරගැනීම • ජාතික විද්‍යා පදනම් සඟරාවේ සහ ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවේ බලපෑම් සාධකය ඉහළ දැමීම • නවෝත්පාදන දැනුම හුවමාරුව සඳහා ආධාර කිරීමට ඩිජිටල් වේදිකාව හරහා ගෝලීය කුසලතා සංචිතය සමග දිගු කාලීන හවුල්කාරිත්වයන් ගොඩනගාගැනීමට පහසුකම් සැලසීම • ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාවල සමාජ විද්‍යා උපුටා දැක්වීම් දර්ශකයේ සුචිගත කිරීම

4. පාසල් සහ මහජනතාව අතර විද්‍යාව ප්‍රචලිත කිරීම	• මහජනතාව දැනුවත් කිරීම සහ විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා ජන මාධ්‍ය භාවිත කිරීම • විද්‍යා තරග පැවැත්වීම • දේශීය හා ජාත්‍යන්තර විද්‍යා තරගවලට • සහභාගි වීමට සියලු සිසුන්ට (පාසල් හා විශ්වවිද්‍යාල සිසුන්) සහාය දැක්වීම සහ ඔවුන් ඒ සඳහා දිරිමත් කිරීම • විද්‍යා සාක්ෂරතාව සහ විද්‍යාත්මක පර්යේෂණ නිමැවුම් භාවිතය වැඩි දියුණු කිරීම සඳහා තරුණ තරුණියන්, • කාන්තාවන්, ගොවීන් ඇතුළුව ප්‍රජාවේ විවිධ අංශ සඳහා සේවා සපයන වැඩසටහන් පැවැත්වීම • විද්‍යා සන්නිවේදනය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් විද්‍යාඥයන් හා මාධ්‍ය ක්ෂේත්‍රයේ පිරිස් සඳහා සම්මාන පිරිනැමීම මගින් ඔවුන් පිළිගැනීමට බඳුන් කිරීම • සිසුන් විද්‍යාව හා විද්‍යාව ප්‍රචලිත කිරීමේ • කාර්යයන් තුළ නිරත වීම වර්ධනය කිරීම වෙනුවෙන් ගුරුවරුන් හා කලාප අධ්‍යක්ෂකවරුන් සඳහා සම්මාන පිරිනැමීම මගින් ඔවුන් පිළිගැනීමට බඳුන් කිරීම	• සම්බන්ධ වී සිටින අදාළ පාර්ශවකරුවන් වෙත විද්‍යා සන්නිවේදනය සඳහා පුහුණුව ලබාදීම • විද්‍යා තාක්ෂණ ඉංජිනේරු හා ගණිත අධ්‍යාපනය සඳහා පහසුකම් සැලසීම සහතික කිරීම සහ පාසල්වල විද්‍යාගාර වැඩි දියුණු කිරීම මගින් විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීම සඳහා හැකියාව සහිත පරිසරයක් නිර්මාණය කිරීම • පර්යේෂණ හා සංවර්ධන නිමැවුම් / පර්යේෂණ සොයාගැනීම් ඵලදායී අන්දමින් ව්‍යාප්ත කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම සඳහා පහසුකම් සැලසීම
5. දේශීය හා අන්තර්ජාතික වශයෙන් පුද්ගලයින්, සංගම් හෝ ආයතන සමග සම්බන්ධතා ගොඩ නගා ගැනීම තුළින් ධාරිතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම හා වැඩි දියුණු කිරීම සහ විදේශයන්හි වෙසෙන විශේෂඥ දැනුම සහිත ශ්‍රී ලාංකීය විද්‍යාඥයන් හා තාක්ෂණවේදීන් අප රටේ විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා සම්බන්ධ කරගැනීමට පහසුකම් සැලසීම	• අන්තර්ජාතික බහු පාර්ශවීය /ද්විපාර්ශවීය විද්‍යා හා තාක්ෂණ • සහයෝගිතාව සඳහා වඩාත් පුළුල් ප්‍රේක්ෂක පිරිසක් /නිරාවරණයක් සැපයීම සඳහා ගෝලීය ඩිජිටල් වේදිකාව සමග දේශීය විද්‍යාඥයන්ගේ බැඳීම ශක්තිමත් කිරීම • විවිධ පර්යේෂණ සංවිධාන සමග සහයෝගිත්වයෙන් • සිදු කරනු ලබන පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම • පශ්චාත් උපාධි සහ පශ්චාත් ආචාර්ය උපාධි මට්ටම්වල ධාරිතා සංවර්ධනය • ගෝලීය ඩිජිටල් වේදිකාව හරහා විදේශයන්හි වෙසෙන කීර්තිමත් ශ්‍රී ලාංකිකයන්ගේ සේවය ලබාගැනීම සහ දුරස්ථ අධීක්ෂණය මගින් තරුණ පර්යේෂකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම • ගෝලීය ඩිජිටල් වේදිකාව හරහා විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ගේ සේවය ලබාගැනීම පිණිස මාර්ගගත පුහුණු වැඩසටහන් 'ධාරිතා සංවර්ධන වැඩමුළු හා වෙබිනා වැඩසටහන්' පැවැත්වීම • අපේක්ෂිත නිමැවුම් සහතික කිරීම සඳහා සියලු ශිෂ්‍යත්ව කලින් කලට ඇගයීම	• ශ්‍රී ලාංකීය උපාධිධාරීන් රට තුළ රඳවාගැනීම සඳහා පහසුකම් සැලසීම සහ නවක ආචාර්ය උපාධිධාරීන් රටේ සමාජ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් සිය පර්යේෂණ හා සංවර්ධන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා දිරිගැන්වීම • ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයන්හි ශාඛා ශ්‍රී ලංකාවේ පිහිටුවීමට පහසුකම් සැලසීම සඳහා විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින් සහ විදෙස් රටවල විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන ආයතන සමග සම්බන්ධතාව ඇතිකරගැනීම • ශ්‍රී ලාංකීය පර්යේෂකයින්/පශ්චාත් උපාධි ශිෂ්‍යයින් සඳහා ධාරිතා සංවර්ධන අවස්ථා වැඩි දියුණු කිරීම පිණිස විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින් සහ විදෙස් රටවල ක්‍රියාත්මක විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සංවිධාන සමග ජාල හා හවුල්කාරිත්වයන් පුළුල් කිරීම සහ ඒවායින් උපරිම ප්‍රයෝජන ලබාගැනීම
6. ජාතික විද්‍යා පදනමේ සියලු ක්‍රියාකාරකම්වල විශිෂ්ටත්වය අත්කරගැනීම සඳහා එහි බුද්ධිමය හා භෞතික පරිසරය වැඩි දියුණු කිරීම	• අරමුදල් සපයාගනිමින් සහ ප්‍රතිපාදන 100%ක් භාවිතයට ගනිමින් මානව සම්පත් හා භෞතික යටිතල පහසුකම් /තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය	• තුන් වසරක යාවත්කාලීන සැලැස්මක් මත පදනම්ව නවීනතම කාර්යාල කළමනාකරණ හා සේවා පහසුකම් සහතික කිරීම



විගණනය කරන ලද මූල්‍ය වාර්තාව

2021 වර්ෂයේ කාර්යසාධනය පිළිබඳ ගිණුම්කරණ නිලධාරියාගේ නිරීක්ෂණ

ජාතික විද්‍යා පදනම යනු රජයේ අරමුදල් මතම රඳා පවතින්නා වූ අරමුදල් සපයන සංවිධානයකි. ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය සඳහා ජාතික විද්‍යා පදනම වෙනුවෙන් "පුනරාවර්තන" හා "ප්‍රාග්ධන" ශීර්ෂ යටතේ නිර්දේශ කරන ලද අරමුදල් ප්‍රමාණය පිළිවෙලින් රු. මිලියන 153 ක් සහ රු. මිලියන 68 ක් විය. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 132.1ක් "පුනරාවර්තන" වියදම් වෙනුවෙන්ද, රුපියල් මිලියන 61.7 ක් "ප්‍රාග්ධන" වියදම් වෙනුවෙන්ද වාරික වශයෙන් නිදහස් කළ අතර වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද ප්‍රදානවල ඉතිරිව ඇති ශේෂයන් වශයෙන් රුපියල් මිලියන 10.2ක් ජාතික විද්‍යා පදනම සතුව පවතී. මෙම වියදම් පිළිබඳ විස්තර *වගුව 12 සහ 13* හි දක්වා ඇත.

වගුව 12: 2021 වසරේදී පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්

විස්තරය	රු.'000	
පුනරාවර්තන වියදම්	**ඇස්තමේන්තුව**	**වියදම**
පෞද්ගලික පඩිනඩි	118,520	108,711
වෙනත් පුනරාවර්තන	34,480	25,706
මුළු පුනරාවර්තන වියදම්	**153,000**	**134,417**
ප්‍රාග්ධන වියදම	**67,897**	**67,848**

2021 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර *වගුව 13* හි දැක්වේ.

වගුව 13: 2021 වසරේ ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

ප්‍රමුඛතාව	විස්තරය	වියදම – 2021 (රු.'000)
ප්‍රමුඛතාව – **01**	Internet of Things, කෘත්‍රිම බුද්ධිය, ජෛව තාක්ෂණය, රොබෝ විද්‍යාවල Augmented Reality, Cloud Computing, නැනෝ තාක්ෂණය සහ 3D මුද්‍රණය යනාදියේ භාවිතය උපරිම කරමින් ශ්‍රී ලංකාව නවෝත්පාදන කේන්ද්‍රස්ථානයක් වශයෙන් ස්ථාපිත කිරීම.	611
ප්‍රමුඛතාව– **02**	පර්යේෂකයින්හට නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර නිකුත් කිරීමේ හා බුද්ධිමය දේපළ හිමිකම ලබාදීමේ පද්ධතිය කාර්යක්ෂම කිරීම.	-
ප්‍රමුඛතාව – **03**	ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමග සහයෝගීත්වය ඇතිකර ගැනීම සඳහා දේශීය පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම.	1,190
ප්‍රමුඛතාව – **04**	පර්යේෂණ සඳහා දායකත්වය දක්වන පුද්ගලික ව්‍යවසායන් සඳහා සපයන බදු සහන පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම.	-
ප්‍රමුඛතාව – **05**	දේශීය හෝ විදේශීය ආයෝජකයින් හඳුන්වාදීම.	-
ප්‍රමුඛතාව – **06**	නව නිපැයුම් හා පර්යේෂණ ප්‍රතිඵල ආයෝජකයින් සහ අදාළ පරිශීලකයින් වෙත යොමු කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සැකසීම.	6,577
ප්‍රමුඛතාව– **07**	ප්‍රජාව වෙත විද්‍යාව.	11,432
ප්‍රමුඛතාව – **08**	නවීන කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මික නවෝත්පාදන, ජෛවතාක්ෂණය/ නැනෝ තාක්ෂණය, කෘත්‍රිම බුද්ධිය, අගය එකතු කිරීම සහ තාක්ෂණික නවෝත්පාදන,දේශීය ඖෂධ, පරිසරය හා ජෛව විවිධත්වය සංරක්ෂණය හා සුරැකීම යනාදිය පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම /දිරිගැන්වීම තුළින් විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන සහ පුද්ගලික අංශයේ ශක්තීන් හා ධාරිතාවන් එක් කෙරෙනු ඇත.	42,044
ප්‍රමුඛතාව – **09**	නව පාඨමාලා හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල සිසුන්ට ප්‍රමාණවත් අරමුදල් සැපයීම මගින් සුදුසුකම් සහිත සියලු සිසුන්හට සිය උසස් අධ්‍යාපන කටයුතු අබාධිත සිදු කිරීමට හැකියාව ලබාදීම.	3,420
ප්‍රමුඛතාව – **10**	කාර්ය මණ්ඩලයේ ඵලදායිතාව හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා දිගු කාලීන මානව සම්පත් සැලැස්මක් කාර්යක්ෂම සේවයක් සැපයීමට අවශ්‍ය සංඛ්‍යාවල කාර්ය මණ්ඩලයේ විූහය හා ව්‍යාප්තිය සහ කාර්ය මණ්ඩලයට කාර්යයන් වෙන් කෙරෙන ආකාරය මෙම සැලැස්මට ඇතුළත් කෙරෙනු ඇත.	2,574
මුළු ප්‍රාග්ධන වියදම		**67,848**

ජාතික විද්‍යා පදනම

2021 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය.

31.12.2020 දිනට		සටහන්	රු.	රු.
	වත්කම්			
	ජංගම වත්කම්			
18,267,547.64	මුදල් හා මුදල් සමානයන්	**21**	28,475,552.01	
6,204,345.42	ලැබිය යුතු	**22**	6,028,668.52	
2,451,155.57	ස්කන්ධ	**23**	2,524,786.09	
1,444,387.94	පෙර ගෙවීම් - **(උපලේඛනය - 07)**		1,529,325.94	
108,650.00	වෙනත් ජංගම වත්කම්	**24**	93,650.00	
28,476,086.57	මුළු ජංගම වත්කම්			38,651,982.56
	ජංගම නොවන වත්කම්			
11,770,580.00	ලැබිය යුතු	**22**	8,743,598.00	
1,285,495,959.80	දේපළ, පිරියත හා උපකරණ	**25**	1,268,447,090.38	
4,506,617.43	අස්පෘශ්‍ය වත්කම්	**26**	3,379,826.46	
883,002,124.00	ආයෝජන	**27**	883,002,124.00	
2,184,775,281.23	මුළු ජංගම නොවන වත්කම්			2,163,572,638.84
2,213,251,367.80	**මුළු වත්කම්**			2,202,224,621.40
	වගකීම්			
	ජංගම වගකීම්			
4,862,544.46	උපචිත වියදම්	**28**	7,545,192.31	
7,207,871.86	ණය හිමියන්	**29**	4,206,054.22	
12,070,416.32				11,751,246.53
	ජංගම නොවන වගකීම්			
41,831,260.29	විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	**30**	41,389,595.00	
63,976,664.83	කල් තැබූ ආදායම්	**31**	55,385,154.44	
105,807,925.12				96,774,749.44
117,878,341.44	**මුළු වගකීම්**			108,525,995.97
2,095,373,026.36	**ශුද්ධ වත්කම**			**2,093,698,625.43**
	සම කොටස් හා සංචිත			
	උපචිත අරමුදල			
(13,876,605.15)	ජාතික විද්‍යා පදනම අරමුදල		(26,296,276.41)	
(23,467,308.51)	එකතු කරන්න: ආදායමට වැඩි වියදමේ අතිරික්තය		(12,722,038.18)	
(37,343,913.66)	**මුළු උපචිත අරමුදල්**			(39,018,314.59)
1,249,216,114.91	නැවත ඇගයීමේ සංචිතය			1,249,216,114.91
883,002,124.00	රජයේ ප්‍රදාන			883,002,124.00
498,701.11	ජාතික විද්‍යා පදනම සංවර්ධන අරමුදල	**32**		498,701.11
2,095,373,026.36	**මුළු සම කොටස්**			**2,093,698,625.43**

.....

ප්‍රධානී, පරිපාලන හා මූල්‍ය

පිටු අංක 06 සිට 37 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල වැදගත් කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර, ඉදිරිපත්කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වග කිවයුතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහ ඒ වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද්දේ,

.....	.....	.....
සභාපති	**අධ්‍යක්ෂ ජනරාල්**	**මණ්ඩල සාමාජික**

දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය .

31.12.2020 දිනට		රු.	රු.	රු.
	භාණ්ඩාගාරය වෙතින්			
	ප්‍රදාන			
59,000,000.00	ප්‍රාග්ධන			61,672,900.00
150,690,000.00	පුනරාවර්තන			132,100,000.00
209,690,000.00				193,772,900.00
	වර්ෂය සඳහා ආදායම			
636,367.44	ලද පොලී	715,082.71		
184,023.46	සුළු ආදායම්	15,150.00		
(818,229.49)	ප්‍රකාශන අලෙවිය - **(සටහන 19.1)**	(2,034,148.93)		
2,994.00	ඡායාස්ථ පිටපත් ලද්දපත්	3,417.00		
178,561.79	ලද ප්‍රකාශන ගාස්තු -ජාතික විද්‍යා පදනමේ සඟරාව	172,791.54		
101,125.00	NSLRC ආදායම	456,091.15		
-	වැඩමුළුවලින් ලද ආදායම	75,000.00		
4,368. 75	ලාභ/(පාඩු) ස්ථාවර වත්කම් බැහැර කිරීම	-		
289,210. 95			(596,616.53)	
	වෙනත්			
1,809,091.15	ආපසු ගෙවිය යුතු	-		
15,352,181.35	විලම්බිත ආදායම (වත්කම්)	9,069,451.13		
1,602,200.70	විලම්බිත ආදායම (ප්‍රකාශන)	3,368,581.93		
625,449.60	ව්‍යාපෘති වෙතින් ලද ආදායම	-		
19,388,922.80			12,438,033.06	
19,678,133.75				11,841,416.53
229,368,133.75				205,614,316.53
	අඩු; වර්ෂය සඳහා වියදම්			
	පුනරාවර්තන වියදම්			
	කාර්යාලීය වියදම්			
457,700.00	මණ්ඩල සාමාජිකයින් සඳහා ගමන් වියදම් හා දීමනා	708,600.00		
116,335.12	රැස්වීම් සඳහා සංග්‍රහ කටයුතු	34,266.00		
-	මුද්‍රණ සහ ප්‍රකාශන	-		
574,035.12			742,866.00	
	කාර්ය මණ්ඩල පඩිනඩි			
87,416,451.46	වැටුප් සහ දීමනා	82,503,671.80		
12,267,452.76	සේවක අර්ථසාධක අරමුදල	11,598,577.14		
2,453,462.67	සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල	2,319,715.43		
6,356,807.74	ප්‍රවාහන සහ ඉන්ධන දීමනා	6,135,735.60		
7,843,554.61	විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,743,687.21		
2,303,836.04	අතිකාල දීමනා	1,956,670.60		
34,343.62	නිවාඩු සඳහා ගෙවීම්	11,547.06		
304,457.30	නිල ඇඳුම්	310,255.20		
118,980,366.20			108,579,860.04	
	කාර්යාල පරිපාලනය			
861,571.06	ගමන් බිමන් – කාර්යාලය	512,379.84		
1,029,271.50	ලිපිද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය	901,927.19		
2,616,526.94	විදුලිය	2,081,443.30		
2,948,729.31	දුරකතන/ ෆැක්ස්	1,798,716.24		
6,964.80	තැපැල් ගාස්තු	38,500.00		
535,000.00	විගණන ගාස්තු - විගණකාධිපති දෙපාර්තමේන්තුව	372,600.00		
55,060.00	බැංකු ගාස්තු	49,385.00		
169,457.58	වෛද්‍ය වියදම්	215,932.00		
106,704.00	දැන්වීම් ප්‍රචාරණ ගාස්තු	221,724.00		
2,068,560.06	ඉන්ධන වියදම්	2,121,023.24		
1,839,506.21	මෝටර් රථ වාහන නඩත්තුව	1,331,733.54		
2,063,098.47	කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ නඩත්තුව	956,434.56		
672,049.40	ගොඩනැගිලි නඩත්තුව	437,600.00		

		රු.	රු.	රු.
-	භූමිය නඩත්තුව	-		
951,047.55	රක්ෂණය	649,535.75		
399,153.52	ජල පරිභෝජන ගාස්තු	266,234.68		
1,628,675.00	ආරක්ෂක සේවාවන්	1,597,705.00		
19,210,020.84	ක්ෂයකිරීම්	17,329,438.17		
1,678,416.48	අස්පාශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	1,324,162.96		
-	නෛතික ගාස්තු	57,500.00		
497,222.00	සුළු වියදම්	379,447.62		
1,484,460.00	සනීපාරක්ෂක සේවාවන්	1,711,647.63		
345,015.00	භාෂා පරිවර්තන ගාස්තු	200,727.50		
825.00	මුද්දර ගාස්තු	775.00		
4,047,894.03	කපා හරින ලද අස්පාශ්‍ය වත්කම්	-		
-	ආපසු ගෙවිය හැකි තැන්පතු අහිමි වීම	15,000.00		
-	කපාහරින ලද ලිපි ද්‍රව්‍ය සහ පාරිභෝගික ද්‍රව්‍ය තොග	-		
406,850.00	කපා හරින ලද සඟරා තොග	1,162,124.60		
45,622,078.75			35,733,697.82	
	වෙනත්			
80,892.00	ජාතික විද්‍ය ාපුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය – **සටහන 19.2**	1,295.00		
429,580.79	මුද්‍රණ අංශය - **සටහන 19.3**	322,813.14		
5,077,605.20	අන්තර්ජාල සේවාවන් සඳහා ගෙවීම්	5,107,668.69		
5,588,077.99			5,431,776.83	
	ප්‍රාග්ධන වියදම්			
4,012,079.38	ප්‍රමුඛතාව 01 - **සටහන 20.1**	610,816.81		
-	ප්‍රමුඛතාව 02 - **සටහන 20.2**	-		
1,651,052.45	ප්‍රමුඛතාව 03 - **සටහන 20.3**	1,189,532.53		
-	ප්‍රමුඛතාව 04 - **සටහන 20.4**	-		
-	ප්‍රමුඛතාව 05 - **සටහන 20.5**	-		
870,711.03	ප්‍රමුඛතාව 06 - **සටහන 20.6**	6,577,329.12		
4,222,475.94	ප්‍රමුඛතාව 07 - **සටහන 20.7**	11,432,344.55		
24,324,556.73	ප්‍රමුඛතාව 08 - **සටහන 20.8**	42,044,309.15		
6,795,000.00	ප්‍රමුඛතාව 09 - **සටහන 20.9**	3,420,200.00		
40,195,008.67	ප්‍රමුඛතාව 10 - **සටහන 20.10**	2,573,621.86		
82,070,884.20			67,848,154.02	
252,835,442.26				218,336,354.71
(23,467,308.51)	**වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(හිඟය)**			**(12,722,038.18)**

ජාතික විද්‍යා පදනම

2021 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

සාරාංශය

	දායකත්ව ප්‍රාග්ධනය	නැවත තක්සේරු කිරීමේ සංචිතය	වෙනත් සංචිත	වෙනත් අරමුදල්	ජාතික විද්‍යා පදනම අරමුදල	මුළු සංචිත අරමුදල	මුළු එකතුව
01.01.2021 දිනට ශේෂය	-	1,249,216,114.91	883,002,124.00	498,701.11	(37,343,913.66)	(36,845,212.55)	2,095,373,026.36
ඒකාබද්ධ කිරීමේ ප්‍රතිපත්තියේ වෙනස්කම්	-	-	-	-	-	-	-
පෙර වසරේ ගැලපුම්	-	-	-		11,047,637.25	11,047,637.25	11,047,637.25
නැවත සඳහන් කරන ලද ශේෂය	-	1,249,216,114.91	883,002,124.00	498,701.11	(26,296,276.41)	(25,797,575.30)	2,106,420,663.61
2021 වර්ෂය සඳහා ශුද්ධ වත්කම් /සම කොටස්වල වෙනස්කම							
නැවත තක්සේරු කිරීමේ අතිරික්තය	-	-	-	-	-	-	-
ආයෝජන ගැලපුම	-	-	-	-	-	-	-
භාණ්ඩාගාරය වෙතින් ප්‍රදාන							
ප්‍රාග්ධන	-	-	-	-	61,672,900.00	61,672,900.00	61,672,900.00
පුනරාවර්තන	-	-	-	-	132,100,000.00	132,100,000.00	132,100,000.00
වෙනත් මෙහෙයුම්	-	-	-	-	11,841,416.53	11,841,416.53	11,841,416.53
වර්ෂය තුළ වියදම්							
ප්‍රාග්ධන	-	-	-	-	(67,848,154.02)	(67,848,154.02)	(67,848,154.02)
පුනරාවර්තන	-	-	-	-	(150,488,200.69)	(150,488,200.69)	(150,488,200.69)
කාල සීමාව සඳහා හඳුනාගත් මුළු ආදායම සහ වියදම්	-	-	-	-	(12,722,038.18)	(12,722,038.18)	(12,722,038.18)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**1,249,216,114.91**	**883,002,124.00**	**498,701.11**	**(39,018,314.59)**	**(38,519,613.48)**	**2,093,698,625.43**

ජාතික විද්‍යා පදනම

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2021 රු.		2020 රු.	
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ				
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(හිඟය)	(12,722,038.18)		(23,467,308.51)	
එකතු කරන්න: ජාතික විද්‍යා පදනම අරමුදලේ පෙර වසරේ ගැලපුම්	11,047,637.25		(16,654,295.92)	
	(1,674,400.93)		**(40,121,604.43)**	
පහත දැ සඳහා ගැලපුම්				
ක්ෂයවීම්	17,329,438.17		19,210,020.84	
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	1,324,162.96		1,678,416.48	
වසර තුල ගෙවන ලද පාරිතෝෂික	(4,185,352.50)		(4,877,633.32)	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,743,687.21		7,843,554.61	
ස්ථාවර වත්කම් බැහැර කිරීම	-		(4,368.75)	
අස්පෘශ්‍ය වත්කම් කපා හැරීම්	-		4,047,894.03	
විලම්බිත ආදායම්	(9,069,451.13)		(15,352,181.35)	
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)	**7,468,083.78**		**(27,575,901.89)**	
වෙනත් ලැබිය යුතු වෙළඳාමේ ශුද්ධ (ඉහළයාම)/පහළයාම	3,132,720.90		28,223,705.27	
භාණ්ඩ ලේඛනවල ශුද්ධ (ඉහළයාම)/පහළ යාම	(73,630.52)		(786,746.43)	
ගෙවිය යුතු වෙළඳ අගයන්හි ශුද්ධ (ඉහළයාම)/පහළ යාම	(319,169.79)		(8,231,639.40)	
මෙහෙයුම්වලින් ජනනය වූ මුදල්	2,739,920.59		19,205,319.44	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**10,208,004.37**		**(8,370,582.45)**
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ				
ස්ථාවර වත්කම් බැහැර කිරීම් ඉදිරියට ගෙනයාම	-		4,368.75	
වත්කම් මිලදී ගැනීම	(477,940.74)		(49,539,191.41)	
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**(477,940.74)**		**(49,534,822.66)**
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ				
රජයේ දායකත්වයන්	477,940.74		49,539,191.41	
ජාතික විද්‍යා පදනමේ සංරචක වෙතින් දායකත්වය	-		97,726.50	
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**477,940.74**		**49,636,917.91**
මුදල් හා මුදල් සමානයන්හි ශුද්ධ ඉහළයාම/ (පහළ යාම)		10,208,004.37		(8,268,487.20)
කාල සීමාව ආරම්භයේදී මුදල් හා මුදල් සමානයන්		18,267,547.64		26,536,034.84
කාල සීමාව අවසානයේදී මුදල් හා මුදල් සමානයන්		**28,475,552.01**		**18,267,547.64**
මුදල් හා මුදල් සමානයන්				
BOC - 0002323269		21,301,090.95		15,972,660.18
BOC - 0002323270		78,468.49		147,619.76
BOC - 0002322471		475,043.16		475,043.16
BOC ඉතුරුම් - 80771519		5,754,675.21		803,644.61
විශේෂ මුදල් අග්‍රිම		100,000.00		100,000.00
සුළු මුදල්		5,000.00		5,000.00
අතැති මුදල් හා චෙක් පත්		761,274.20		763,579.93
		28,475,552.01		**18,267,547.64**

ජාතික විද්‍යා පදනම

2021 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සටහන්

1. සාමාන්‍ය

1.1 වාර්තාකරණ අස්ථිත්වය

1994 අංක 11 දරන පනත යටතේ ස්ථාපිත කර ඇති ජාතික විද්‍යා පදනම, අංක 47/5, මේට්ලන්ඩ් පෙදෙස, කොළඹ - 07 ශ්‍රී ලංකාව යන ස්ථානයේ පිහිටා ඇත. ජාතික විද්‍යා පදනම ක්‍රියාත්මක වන්නේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ය.

1.2 වාර්තාකරණ කාල සීමාව

ජාතික විද්‍යා පදනමේ මූල්‍ය කාල සීමාව 2021 ජනවාරි 01 වන දා සිට 2021 දෙසැම්බර් 31 වන දක්වා ඉදිරිපත් කෙරේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සඳහා අනුමැතිය

2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 පෙබරවාරි 22 වැනි දින අවසර දෙන ලදී.

1.4 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

ඒ අනුව, ජාතික විද්‍යා පදනම දැනුම් ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සඳහා පහසුකම් සලසයි. ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා සියලු විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන්හි ධාරිතා සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය, තාක්ෂණ හුවමාරුව, දැනුම නිර්මාණය කිරීම සහ බෙදාගැනීම යන කාර්යයන් සඳහා ද එය පහසුකම් සලසයි.

ජාතික විද්‍යා පදනමේ කාර්යයන් වනුයේ

- ✓ විශ්ව විද්‍යාල, විද්‍යා හා තාක්ෂණ ආයතන සහ විද්‍යාඥයින් විසින් සිදු කරනු ලබන මූලික සහ ව්‍යවහාරික විද්‍යාත්මක පර්යේෂණ ආරම්භ කිරීම, ඒවාට පහසුකම් සැලසීම සහ සහාය වීම.
- ✓ සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ සහ විද්‍යා අධ්‍යාපන වැඩසටහන් ඇතුළුව විද්‍යාත්මක පර්යේෂණ විභවතාව ශක්තිමත් කිරීම.
- ✓ ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය කිරීම
- ✓ විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ ක්ෂේත්‍රයේ පුද්ගලයින් පුහුණු කිරීම
- ✓ ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල විද්‍යාඥයින් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරුව සඳහා පහසුකම් සැපයීම
- ✓ විද්‍යා හා තාක්ෂණ ආයතනවල විද්‍යාත්මක අධ්‍යයන හෝ විද්‍යාත්මක කටයුතු සඳහා ශිෂ්‍යත්ව සහ අධි ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
- ✓ පර්යේෂණ ප්‍රදාන සහ තාක්ෂණ ප්‍රදාන පිරිනැමීම
- ✓ විද්‍යාව ප්‍රචලිත කිරීම

1.5 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ මතයක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

2.1 අනුගත වීමේ ප්‍රකාශනය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට(SLPSAS's) අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇති අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් SLPSAS 01- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අනුව ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති නොමැති ක්ෂේත්‍රවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ද භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, සම කොටස්වල වෙනස්වීම් සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ.

2.2 සකස් කිරීමේ පදනම

ජාතික විද්‍යා පදනමේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමක් මත සහ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇති අතර නිරන්තරයෙන් අදාළ කෙරේ. සාධාරණ වටිනාකමින් මනිනු ලබන දේපළ, පිරියත හා උපකරණ සඳහා හැර මූල්‍ය ප්‍රකාශවලට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

2.3 සන්සන්දනාත්මක තොරතුරු

ආයතනය විසින් යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත්, පෙර වසරේ භාවිතා කළ ඒවාට අනුකූල වේ. වත්මන් වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි අවශ්‍ය සෑම තැනකම පෙර වසරේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ නැවත සකස් කර යොදා ඇත.

2.4 ක්‍රියාකාරී මුදල් ඉදිරිපත් කිරීම

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය වන ශ්‍රී ලංකා රුපියල්වලින් (LKR) ය.

2.5 අඛණ්ඩ පැවැත්ම

කළමනාකාරිත්වය විසින් ආයතනය අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇති අතර අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් එය සතුව පවතින බවට සෑහීමකට පත්වේ. තවද, ආයතනය අඛණ්ඩ ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතා පිළිබඳව කළමනාකාරිත්වය නොදනී. එබැවින්, අඛණ්ඩව ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව මත පදනම්ව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව සකස් කරනු ලැබේ.

3. දේපළ පිරියත හා උපකරණ

ජාතික විද්‍යා පදනමේ දේපල පිරියත සහ උපකරණවලට ඉඩම්, ගොඩනැගිලි, කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ, පුස්තකාල පොත්, මෝටර් රථ, උපාංග හා විවිධ දෑ, ලේඛනගත කිරීමේ උපකරණ යනාදිය ඇතුළත් වේ.

3.1 පිළිගැනීමේ පදනම

අදාළ අයිතමය හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්වය වෙතට ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම් හා අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් දේපල, පිරියත සහ උපකරණ හඳුනාගැනේ.

3.2 මූලික හඳුනාගැනීම

දේපල, පිරියත සහ උපකරණ මුලින් හඳුනාගනු ලබන්නේ වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේදී දැරීමට සිදුවන ඕනෑම අහඹු වියදම් සමඟ මිලදී ගැනීමේ පිරිවැය ඇතුළත් පිරිවැය සැලකිල්ලට ගෙනය. මූලික හඳුනාගැනීමෙන් පසුව, දේපල, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකර අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයෙන් මනිනු ලැබේ.

3.3 අව පිළිගැනීම

දේපළ, පිරියත හා උපකරණවල අයිතමයක ධාරණ වටිනාකම අවපිළිගැනීමට ලක් කරනු ලබන්නේ එය ඉවත් කරනු ලබන විට හෝ එය භාවිතයෙන් හෝ ඉවත් කිරීමෙන් අනාගත ආර්ථික වාසියක් නොලැබෙන අවස්ථාවකදීය. අවපිළිගැනීමට ලක් කිරීමෙන් ඇතිවන ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනෙන අතර ලාභය ආදායම් ලෙස වර්ගීකරණය නොකෙරේ. නැවත තක්සේරු කළ වත්කම් විකුණන විට, නැවත තක්සේරු කිරීමේ සංචිතයට ඇතුළත් ඕනෑම අදාළ මුදලක් රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

3.4 නැවත තක්සේරු කිරීම

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) අවශ්‍යතාවය පිළිබඳ නිසි අධ්‍යයනයකින් සහ බෙදාහැරීම සඳහා නිසි ක්‍රමවේදයකින් තොරව මුද්‍රණය කර තිබූ පිරිවැය වටිනාකම රු. 1,162,125 ක් වූ වර්ග 11 කට අදාල ප්‍රකාශන 9,900 ක් සමාලෝචිත වර්ෂයේදී තොගයෙන් ලියා හැර තිබුණි. එසේම පාසල් විද්‍යා සංගම්, විද්‍යා මධ්‍යස්ථාන, කලාප හා පළාත් විද්‍යා සංගම් වෙත නොමිලේ බෙදා හැරීමේ විශේෂිත අරමුණින් මුද්‍රණය කරනු ලබන විදුරාව නමැති අධ්‍යාපනික සහරාවෙහි පිටපත් 5,100 ක් රු. 963,484 ක පිරිවැයක් දරා සමාලෝචිත වර්ෂය තුළදී මුද්‍රණය කර තිබූ අතර වර්ෂයේ දෙවන කාර්තුවට අදාළව සිදුකර තිබූ මෙම මුද්‍රණයෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට පිටපත් 963 ක් පමණක් බෙදා හැරීමට කටයුතු කර තිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයකින් සමාලෝචිත වර්ෂය තුළ රු. 1,277,650 ක් වැයකර "Covid - 19" ග්‍රන්ථ පිටපත් 150 ක් මුද්‍රණය කර තිබූ අතර පිටපතක් සඳහා රු.7,500ක අලෙවි මිලක් නියම කර තිබුණි. අලෙවිය සඳහා පිටපත් 50 ක්ද, නොමිලේ බෙදා හැරීම සඳහා පිටපත් 100 ක්ද වෙන් කර තිබුණි. විගණිත දිනය වූ 2022 මාර්තු 07 දින වන විට ග්‍රන්ථ පිටපත් 03 ක් පමණක් අලෙවි කර තිබූ අතර පිටපත් 57 ක් පමණක් නොමිලේ බෙදා හැර තිබුණි. අලෙවි අපේක්ෂාවෙන් ග්‍රන්ථ මුද්‍රණය සිදු කළද ආයතනය විසින් නිසි අලෙවිකරණ ක්‍රමවේදයක් සකස් කිරීම හෝ අලෙවි සැලක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම කෙරෙහි හෝ අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) පර්යේෂණ ප්‍රදාන ලබාදීමේ මාර්ගෝපදේශයේ 05 වගන්තිය ප්‍රකාරව පර්යේෂණ නිම කර අවසන් මූල්‍ය වාර්තාව ඉදිරිපත් කල පසු මසක් ඇතුලත ඉතිරි මුදල පියවිය යුතු වුවත් පර්යේෂණ නිම කරන ලද හා 2021 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් මූල්‍ය වාර්තා ඉදිරිපත් කර තිබුණු ප්‍රදානයන් 12 කට අදාළ එකතු වටිනාකම රු.1,174,144ක් වූ ඉතිරි මුදල් 2022 මාර්තු විගණන දිනය වන විටත් පියවා නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති



විගණකාධිපතිවරයාගේ වාර්තාව සම්බන්ධයෙන් ජාතික විද්‍යා පදනමේ ප්‍රතිපෝෂණය

විගණකාධිපති,

ජාතික විගණන කාර්යාලය,

අංක 306/72, පොල්දූව පාර,

බත්තරමුල්ල,

2022.04.04

ජාතික විද්‍යා පදනමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ ව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර ව විගණකාධිපති වාර්තාවේ කෙටුම්පත සඳහා පැහැදිලි කිරීම්.

2.3 වෙනත් කරුණු

(අ) මෙම ණයහිමි ශේෂ 02 ක Cinnamon Project හා Biosafety project නියෝජනය වන ශේෂයන් වේ.

මින් Cinnamon Project රු.1,575,433 ශේෂයක් පෙන්වයි. එම ව්‍යාපෘතිය 2016/12/28 දින ආරම්භ කළ අතර 2019/12/27 දින අවසන් වීමට නියමිත ව තිබුණි. එහෙත් ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ 05ක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබූ අතර ඒවායෙහි කාලය අදාළ අමාත්‍යාංශයේ අනුමැතිය ඇති ව 2021 අගෝස්තු මාසය දක්වා දීර්ඝ කර දී තිබුණි. මෙයින් පර්යේෂණ 04ක් සාර්ථකව නිම කර ඇත. අනෙක් ව්‍යාපෘතියේ අවසන් වාර්තාව ලැබීමට නියමිත ය. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ එකඟතාවය ද මත මෙම පර්යේෂණයේ කටයුතු ද අවසන් වූ වහාම ව්‍යාපෘතියට අදාළ මූල්‍ය කටයුතු අවසන් කරනු ලැබේ.

ඉතිරි රු.1,672,266 ශේෂය Biosafety project නියෝජනය වන අතර එම ව්‍යාපෘතිය 2021/11/30 දිනෙන් අවසන් විය. ව්‍යාපෘතියේ සියළු අරමුණු සාර්ථකව නිම කර අවසන් වාර්තාව සපයා ඇත. සියළු ම මූල්‍ය කටයුතු ද අවසන් කර ඉතිරි මුදල වූ රු.3,969,856.61 ද 2022/02/24 දින ආපසු යවා ඇත. **(ඇමුණුම 01)**

(ආ) 2021 වසරේ රු. 1,162,125 වූ වර්ග 11 ට අදාළ ප්‍රකාශන 9,900 වටිනාකම තොගයෙන් ලියා හැර ඇත්තේ ආයතනයේ ගිණුම්කරණ ක්‍රමවේදය අනුව, 2010 නොවැම්බර් 15 දින කළමනාකරණ මණ්ඩලයන් ලබා ගත් අනුමැතිය මත මාස 06ක් පැරණි සඟරා වටිනාකමින් 50%ක් හා වසරක් පැරණි සඟරා වටිනාකමින් 100%ක් ද වන පදනම මත වේ. එය මූල්‍ය ප්‍රකාශනය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 6 මගින් හෙළිදරව් කර ඇත.

එසේම, එම වටිනාකම නියෝජනය වන්නේ JNSF, SLJSS ජර්නල් හා විදුරාව සඟරා වලින් වන අතර එම ප්‍රකාශන මුද්‍රණය කිරීමේ දී පෙර අවුරුදු වල දී විකුණූ, හුවමාරු කල සහ බෙදාහරින ලද ප්‍රමාණයන් පිළිබඳ ව අධ්‍යයනය කර ඇත. එහෙත් 2020 වර්ෂයේ දී මුහුණ

පැමට සිදු වූ COVID වසංගත තත්වය මත 2019 වර්ෂයේ අවසාන කාලයේ ප්‍රකාශයට පත් කරන ලද සහ 2020 මුද්‍රණය කල ජර්නල් හි ලිපි පලකල විද්වතුන් අතර බෙදාහැරීම සැලකිය යුතු පරිදි අඩු විය. ඊට අමතරව 2019 වර්ෂයෙන් පසු ජර්නල අන්තර්ජාලය මාර්ගයෙන් පරිශීලනයට හුරු වී ඇති අතර එය ද සැළකිල්ලට ගෙන ජර්නල මුද්‍රණය අඩු කර ඇත. මෙම නැඹුරුව නිරීක්ෂණය කිරීමෙන් පසුව 2021 වර්ෂයේ සිට ජර්නල මුද්‍රණය කිරීම නවතා දැමීමට තීරණය කරන ලද අතර, මෙතෙක් ජර්නලය මිල දී නොගත් හෝ හුවමාරු නොකරන ලද රාජ්‍ය සහ පෞද්ගලික ආයතන හඳුනාගෙන, ඔවුන් දැනුවත් කර, දැනට ඉතිරි වී ඇති ජර්නල පිටපත් බෙදාහැරීමේ යාන්ත්‍රණයක් මේ වන විටත් සකස් කෙරෙමින් පවතී.

විදුරාව ප්‍රකාශන පාසල් ළමුන් පාදක කර මුද්‍රණය කරන බැවින ජාතික විද්‍යා පදනම සමග ලියාපදිංචි වී ඇති පාසල් ප්‍රමාණය, විදාත මධ්‍යස්ථාන , පළාත් විද්‍යා සම්බන්ධීකාරකවරුන්, කලාප විද්‍යා අධ්‍යක්ෂක වරුන් සහ විශ්ව විද්‍යාල පුස්තකාල ප්‍රමාණය ද සැලකිල්ලට ගනිමින් මුද්‍රණය කරන පිටපත් ප්‍රමාණය තීරණය කර ඇත. කෙසේ වුව ද COVID වසංගත තත්වය හමුවේ මෙම කටයුතු ද අඩපනව තිබූ අතර නැවත සැලසුම් කළ පරිදි බෙදා හැරීමේ ක්‍රමවේදය ආරම්භ කර ඇත.

(ඇ) ජාතික විද්‍යා පදනමේ ප්‍රකාශන විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහාත්, විද්‍යා දැනුම වැඩි කිරීම සඳහාත් යොදා ගැනෙන අතර ඒවා අවශ්‍ය ප්‍රජාව වෙත විවිධ වැඩසටහන් වල දී බෙදා දෙයි. මෙම පෝස්ටරය සහ වීඩියෝ පට එසේ ලබා දී ඉතිරි වී ඇති තොගයක් වන අතර මෙම තොග, යෝජිත ප්‍රකාශන ප්‍රදර්ශනය හා අලෙවිය සඳහා වන කුටියේ ප්‍රදර්ශනය කර අවශ්‍ය පරිශීලකයන් වෙත ලබා දීමට ද, විද්‍යා වැඩසටහන් වල දී යොදා ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

මේ වන විටත් ප්‍රකාශන අවශ්‍යතාවය තහවුරු කර බෙදා හැරීමට සැලසුම් සහිත ව පමණක් මුද්‍රණය කිරීමට කටයුතු කර ඇත.

(ඈ) ජාතික විද්‍යා පදනම 2021 ජනවාරි 27 - 28 දිනයන්හි Covid - 19 සම්බන්ධව ජාතික සම්මන්ත්‍රණයක් පවත්වන ලදී . මෙම සම්මන්ත්‍රණයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාව covid - 19 වසංගත තත්ත්වය එහි ආරම්භයේ දී (1st wave) අනෙක් රටවල් අභිබවා සාර්ථකව මැඩ පැවැත්වීමට සමත්වූ ආකාරය හා ඒ සඳහා දායක වූ සියලුම අංශ සහ පුද්ගලයන් මෙම සාර්ථකත්වය උදෙසා කටයුතු කල ආකාරය සහ එහිදී ඔවුන් මුහුණ පෑ ගැටළු වලට පිළියම් යෙදූ ආකාරය විමසා අනාගත භාවිතය සඳහා ඓතිහාසික වටිනාකමක් සහිත ග්‍රන්ථයක් ලෙස දත්ත රැස්කර සැකසීමයි.

ඒ අනුව ජාතික වටිනාකමක් සහිත මෙම ග්‍රන්ථය බෙදාහැරීමේ හා අනාගත අවශ්‍යතාවයන් වෙනුවෙන් විකිණීමේ පදනම මත 2021.07.30 දින එලි දැක්වූ මෙහි මුද්‍රණ කටයුතු අවසන් වූයේ 2021. 09. 29 වන දිනය. ඉන්පසු උදා වූ covid - 4 th wave සහ ආර්ථික හේතු මත මෙම පොත කඩිනමින් අලෙවි කිරීමට හෝ අදාල ආයතන වලට නොමිලේ ලබාදෙන පිටපත් ලබාදීමට සැලසුම් කල පරිදි නොහැකි විය. කෙසේ වුව ද නොමිලේ බෙදාහරින පිටපත් තැපැලෙන් / අතින් බෙදාහැරීමට සැලසුම් කළ පරිදි කටයුතු කළ අතර මේ වන විට ඉන් පිටපත් 57 බෙදා දී ඇත.

එසේ ම මෙම පොත දීර්ඝකාලීන වටිනාකමක් ඇති දත්ත සහිත පොතක් බැවින් මෙය විකුණා අවසන් කිරීම කඩිනමින් කළ නොහැකි වේ. ඒ සඳහා ආයතනයේ වැඩ සටහන් වලදී හා වෙනත් ක්‍රම මගින් ප්‍රචාරයක් ලබා දී විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කරනු ලැබේ. යෝජිත ප්‍රකාශන ප්‍රදර්ශනය හා අලෙවිය සඳහා වන කුටියේ ප්‍රදර්ශනය කර අවශ්‍ය පරිශීලකයන් වෙත අලෙවි කිරීමට ද පියවර ගනු ලැබේ.

(ඉ) විදුරාව විද්‍යා සඟරාව ජාතික විද්‍යා පදනම මගින් කාලීන විද්‍යා හා තාක්ෂණය සම්බන්ධ මාතෘකාවක් යටතේ ප්‍රකාශයට පත් කරනු ලබයි . එම සඟරාව ජාතික විද්‍යා පදනම සමග ලියාපදිංචි වී ඇති පාසල් පුස්තකාල වෙත නොමිලයේ බෙදා හරිනු ලැබේ . එසේම විදාත මධ්‍යස්ථාන , පළාත් විද්‍යා සම්බන්ධීකාරකවරුන්, කලාප විද්‍යා අධ්‍යක්ෂක වරුන් සහ විශ්ව විද්‍යාල පුස්තකාල වෙත නොමිලයේ බෙදා හරිනු ලැබේ . මීට අමතරව අවශ්‍ය අවස්ථා වලදී තෑගි ලෙස ලබා දීමටත්, ප්‍රදර්ශන, වැඩමුළු ආදියේදී බෙදා හැරීමත්, සිදු කරන අතර කොටසක් පමණක් අලෙවිය උදෙසා තබා ගැනේ.

සඟරා බෙදා හැරීමේ තැපැල් ගාස්තු ආදී වියදම් සලකා බලා මුද්‍රිත පිටපත් කිහිපයක් (නවයක් පමණ) එකතු කර බෙදා හැරීම සිදු කරනු ලැබේ. එම නිසා මුද්‍රිත පිටපත් කිහිපයක් නිම වන තුරු ඒවා ප්‍රකාශන සඳහා වන ගබඩාවෙහි තැන්පත් කර තබනු ලැබේ . පසු ගිය 2020 වසරේ දී ඇති වූ Covid 19 වසංගත තත්වය නිසා ප්‍රකාශන මුද්‍රණය තරමක් ප්‍රමාද විය. එසේම පාසල් වසා දැමීමත් , තැපැල් කටුතු වල සිදු වූ බාධාකාරී තත්වයන් නිසාත් ඒවා බෙදා හැරීමේ කටයුතු ද තාවකාලිකව ප්‍රමාද කිරීමට සිදු විය.

කෙසේ වුව ද පාසල් යලි ඇරඹීමත් සමග ඉහත සඳහන් ප්‍රකාශන බෙදා හැරීමට කටයුතු කළ අතර මේ වන විට (2022/03/22) ඉතිරිව ඇත්තේ පහත දැක්වෙන ප්‍රමාණයන් පමණි.

ප්‍රකාශන	විගණනයේදී දක්වා ඇති ඉතිරි පිටපත්	දැනට ඉතිරි පිටපත්
36 :02 Tamil	750	518
36:04 Tamil	750	122
37:02 Sinhala	2000	1949
37: 02 English	1600	1548

මෙම ඉතිරි පිටපත් ද ඉල්ලුම පරිදි අලෙවිය උදෙසාද වැඩමුළු, ප්‍රදර්ශන ආදියේදී දැනුම බෙදා හැරීම උදෙසා යොදා ගනු ලැබේ.

(ඊ) විගණන නිරීක්ෂණයෙන් දක්වා ඇති ණයගැති ශේෂයන් 10 (රු.1,525,704/86) අතුරින් වටිනාකම වූ රු.351,571.04ක් ශේෂයන් 04ක් 2022.03.25 දින වන විට අයකර ගෙන ඇති අතර ඉතිරි ශේෂයන් 06ට අදාළ එකතුව රු.1,174,143.82 වන පහත දැක්වෙන ශේෂයන් අය කර ගත යුතුව ඇත.

ප්‍රදාන අංකය	ප්‍රදානය ලද තැනැත්තා	ඉතිරි මුදල රු.
Invoice No.5293	Ministry of environment	204,530.15
RG/2014/HS/03	Dr. B.G.Galhena	229,073.11
RG/2016/AG/01	Dr. T.H.P.S. Fernando	269,033.76
NSF/SCH/2016/10	Ms.A.K.I.U.Kapuge	92,925.20
RG/2017/HS/04	Dr.S.F.Jayamanne	162,114.61
RG/2017/AG/01	Rubber Research Institute	216,466.99
එකතුව		**1,174,143.82**

මින් පරිසර අමාත්‍යාංශය සඳහා අදාල රු. 204,530.15 ක මුදල කෙටිකාලීන ව්‍යාපෘතියක අවසන් ගෙවීම වන අතර මෙම මුදල එම ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යනයකින් පසුව වහාම ගෙවීමට එකඟ වී ඇත.

ආයතනික කටයුතු COVID 19 හමුවේ බිඳවැටීම ද මෙම ශේෂයන් පියවීම ප්‍රමාද වීමට බලපාන ලදී. කෙසේ වුව ද, හඳුන්වා දී ඇති සිහි කැඳවීම් ක්‍රියාවලිය අනුව කටයුතු කර 2022.05.31 දිනට පෙර අදාළ ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

පර්යේෂණ ප්‍රදාන ලබාදීමේ මාර්ගෝපදේශයේ 05 වගන්තිය ප්‍රකාරව ප්‍රදානයන්හි අවසන් මූල්‍ය වාර්තාව ලැබී මසක් ඇතුළත ඉතිරි මුදල් පියවා ගැනීම වෙනුවෙන් 2019 අවසානයේ සිට හඳුන්වා දී ඇති සිහි කැඳවීම් ක්‍රියාවලිය අනුව කටයුතු කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදානලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද 2022.03.25 දින ක්‍රියාත්මක කරන ලදී.

(උ) පසුගිය ජනාධිපතිවරණයේ (2019 නොවැම්බර්) රාජකාරී සඳහා ආයතනයේ රියදුරු මහතුන් 04 දෙනෙකු යොදවන ලද අතර, ඔවුන්ගේ සංයුක්ත දීමනා ලෙස රු. 6,000.00 ක මුදලක් ගෙවා ඇත. නමුත් අතපසුවීමකින් මෙම මුදල මැතිවරණ කොමිසමෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොමැත. මෙම මුදල ප්‍රතිපූරණය කරන මෙන් මැතිවරණ කොමිසමට ලිඛිතව දැනුම් දෙන ලදී.

National Science Foundation
47/5, Maitland Place
Colombo 07
Sri Lanka

සභාපති
ජාතික විද්‍යා පදනම

04-04-2022



ඇමුණුම්

ප්‍රධාන කාර්ය මණ්ඩලය -2021 දෙසැම්බර් 31 දිනට

ඇමුණුම 1

සභාපති

මහාචාර්ය රංජිත් සේනාරත්න
Ph.D.(Vienna),Ph.D.(Durham)h.c.

වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්

දමයන්ති කේ විජේසිංහ මෙය අමාත්‍යාංශය විසින් පත් කරන ලද වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්	*22.02.2021 සිට ක්‍රියාත්මක වන පරිදි 03.08.2021 දක්වා*
කේ රවීන්ද්‍ර පත්මප්‍රිය මහතා අමාත්‍යාංශය විසින් පත් කරන ලද වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්	*10.08.2021 සිට ක්‍රියාත්මක වන පරිදි අද දක්වා*

අතිරේක අධ්‍යක්ෂ

ආචාර්ය තමරා එෆ් ඩයස්
M.Sc.(Hons)(Moscow),Ph.D.(Moscow)

පර්යේෂණ අංශය (RD)

ආචාර්ය එස් ඒ වී මූර්ති, *B.Sc.(Jaffna),M.Sc.(Colombo),Ph.D.(Colombo)*	ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී/ප්‍රධානී 22.03.2021 දින දක්වා
ඉංජිනේරු ටී එම් ආර් දිසානායක, *B.Sc.Engineering(ProductionEng),M.Sc.in Processing & Food Engineering*	ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී/ප්‍රධාන 28.04.2021 දින සිට ක්‍රියාත්මක වන පරිදි
එච් ඩී එන් ජයවීර මෙය, *B.Sc.(Hons.)(Sri Jayewardenepura)*	විද්‍යාත්මක නිලධාරී
ඩබ්ලිව් එල් සී දසනායක මෙය, *B.Sc.Agric.(Hons)(Peradeniya),M.Sc.(Peradeniya),M.Sc.(Japan), M.Eng(Germany)*	ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී
පශු වෛද්‍ය එච් අයි සන්දනායක, *B.V.Sc.(Peradeniya),M.Sc.(London)*	විද්‍යාත්මක නිලධාරී
ආචාර්ය ඒ එම් එන් එස් නාදුගල,, *B.Sc.Agric.(Hons)(Peradeniya) M.Sc.(AsianInstituteofTechnology).Ph.D.(Sir John Kothalawala Uni.)*	ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී
පශු වෛද්‍ය පී වී එස් පනාවල, *B.V.Sc.(Peradeniya),M.Phil.(Peradeniya)*	විද්‍යාත්මක නිලධාරී
අමාලි රණසිංහ මෙය, *B.Sc.(Hons)(Bangalore),M.Sc.(Food & Nutrition)(Peradeniya)*	විද්‍යාත්මක නිලධාරී 01.03.2021 දින ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය වෙත නිදහස් කරන ලදී
ජී ජී කේ පී එස් කුමාරි මහත්මිය, *B.Sc.Special in Agric.(Peradeniya) MPhil in Agricultural Engineering (Peradeniya)*	විද්‍යාත්මක නිලධාරී
ඉංජිනේරු සුරේෂිනී වර්ණසූරිය *B.Sc.Special Eng.(Moratuwa),MSc.(Moratuwa)*	විද්‍යාත්මක නිලධාරී
එම් වීරසූරියගෙදර මෙය *B.Sc. Special Uva Wellassa),MSc.(Peradeniya)*	විද්‍යාත්මක නිලධාරී

විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය (STPRD)

එස් එම් ඒ ඩබ්ලිව් අනුරුද්ධ මහතා, *B.Sc.(Hons)(Colombo),M.Sc.(Colombo)*	ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී/ප්‍රධානී
චාමිකා ධර්මසේන මෙය, *B.Sc.Special(Hons)(Colombo)Postgraduate Diploma in Applied Sociology (Colombo)*	විද්‍යාත්මක නිලධාරී
එම් ඒ ඩී ඩී මුණසිංහ මෙය, *B.Sc.Special (Agric.)(Hons) (Peradeniya),M.Sc (Peradeniya)*	විද්‍යාත්මක නිලධාරී
පී ජී අයි පී ආරියදාස මහතා, *B.Sc.Agric.(Hons)(Peradeniya),M.Sc. Financial Economics (Colombo)*	විද්‍යාත්මක නිලධාරී
ජී ආර් පී අයි අබේසිරි මෙය, *B.Sc. Agric. Special (Wayamba) M.Sc. Crop Science (Peradeniya)*	විද්‍යාත්මක නිලධාරී

ජාත්‍යන්තර සබඳතා අංශය (IAD)

ජේ ජී ශාන්ත සිරි මහතා, *B.Sc.(Hons)(Colombo), M.Sc.(Kelaniya)*	ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී/ප්‍රධානී
ඊ එම් ඩී සී කේ ඒකනායක මෙය, *B.Sc.Agric.(Hons)(Peradeniya),M.Sc.(Peradeniya)*	ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී
කේ ඒ ටී කේ ජී කඳානමුල්ල මෙය, *B.Sc.Agric.(Hons)(Ruhuna),M.Sc.(Colombo)*	විද්‍යාත්මක නිලධාරී
එන් එල් මුහන්දිරම් මෙය,*B.Sc (Hons).(Uva Wellassa)*	විද්‍යාත්මක නිලධාරී

තාක්ෂණ සංවර්ධන හා නවෝත්පාදන අංශය (TDID)

කේ ජී ජේ කරුණාසේන මහතා, *B.Sc Agric.(Hons)(Peradeniya),M.Phil.Agric.(Peradeniya)*	ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී/ප්‍රධානී
ආර් එන් එන් ගමගේ මෙය, *B.Sc.(Hons)(Asian University)*	විද්‍යාත්මක නිලධාරී 15.12.2021 දින දක්වා
සරණි කේ මෙනේරිපිටිය මෙය, *B.Sc. Special (Hons.)(Kelaniya)*	විද්‍යාත්මක නිලධාරී

විද්‍යාව ප්‍රචලිත කිරීමේ හා ප්‍රජා වැඩසටහන් අංශය (SPOD)

ආචාර්ය පී ආර් එම් පී දිල්රුක්ෂි, *B.Sc.Special (Hons) (Peradeniya),Ph.D.(Peradeniya)*	ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී/ප්‍රධානී
එම් ඩී සේනාරත්න මෙය, *Graduateship in Chemistry (I.Chem.),M.Sc,Polymer Science (Sri Jayewardenepura)*	විද්‍යාත්මක නිලධාරී
ආර් ඒ ඒ ආර් රණතුංග මෙය, *B.Sc.Special (Hons)(Colombo)*	විද්‍යාත්මක නිලධාරී
ඩබ් ඒ ඩී එල් ආර් වර්ණකුල මහතා, *B.Sc. Special (Agric.)(Hons)(Wayamba)*	විද්‍යාත්මක නිලධාරී
එච් එම් ඒ ජේ හේරත් මෙය, *B.Sc.Special,Food Science & Nutrition (Wayamba)*	විද්‍යාත්මක නිලධාරී

සඟරා ප්‍රකාශන අංශය (JPU)

ඩී එන් වික්‍රමාරච්චි මෙය, *B.Sc.(Hons)(The Open University),M.Sc.(Sri Jayewardenepura)*	ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී/ප්‍රධානී 18.05.2021 දින සිට ක්‍රියාත්මක වන පරිදි
උත්පලා කරුණාරත්න මෙය, *B.Sc.Special (Hons)(Kelaniya),M.Sc.(Colombo)*	ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරී
ඩබ්ලිව් එම් යූ කේ රත්නායක මෙය, *B.Sc.Special (Hons)(Wayamba)*	විද්‍යාත්මක නිලධාරී
එස් සමරසේකර මහත්මිය, *B.Sc Special (Hons.)(Sri Jayewardenepura)B.Sc.(Economic & Mgt.)(Uni. of London)*	විද්‍යාත්මක නිලධාරී

අතිරේක අධ්‍යක්ෂ කාර්යාලය

පශු වෛද්‍ය කේ බී හසන්ති, *B.V.Sc.(Peradeniya)*	විද්‍යාත්මක නිලධාරී

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC)

මනූජ කරුණාරත්න මහතා *B.Sc.(Kelaniya),M.Sc Kelaniya)*	ප්‍රධාන තොරතුරු නිලධාරී/ප්‍රධානී
අමිලා ඒ තෙන්නකෝන් මෙය, *B.Sc.(Kelaniya)*	ජ්‍යෙෂ්ඨ තොරතුරු නිලධාරී
ආර් පී සුගතදාස මෙය, *B.Sc.(Sri Jayewardenepura)*	ජ්‍යෙෂ්ඨ තොරතුරු නිලධාරී
පූජිත ඩී හේවාවසම් මහතා, *B.Com.(Swinburn University)*	තොරතුරු නිලධාරී
එම් නියාස් තස්නීම් මෙය, *B.Sc.(Southern University), MSc (Peradeniya)*	තොරතුරු නිලධාරී
පී කේ බී ඒ එස් එම් පන්නල මහතා, *MSc(MIS),Colombo,B.Sc.(Hons.)(National Uni. of Ireland)*	තොරතුරු නිලධාරී (27.09.2021 දින දක්වා)
කේ එන් සමන්ති මෙය, *MA(Kelaniya),B.A(Peradeniya)*	තොරතුරු නිලධාරී
එන් ඒ එච් ප්‍රියදර්ශනී මෙය, *Diploma in Library & Information Science*	කණිෂ්ඨ තොරතුරු නිලධාරී

මුද්‍රණ අංශය

එස් එම් ඒ ඩබ් අනුරුද්ධ මහතා, *B.Sc.(Hons)(Colombo),M.Sc.(Colombo)*	ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී සහ රාජකාරී ආවරණය කරන මුද්‍රණ නිලධාරී

පරිපාලන අංශය

පී සපුමොහොට්ටි මහතා, *B.Sc.(Peradeniya), MPM (SLIDA)*	ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී
බී ටී වික්‍රමසිංහ මෙය, *B.Sc.(Sri Jayewardenepura)*	ප්‍රසම්පාදන හා ප්‍රවාහන නිලධාරී
සමන් සුජීව මහතා ,*Postgraduate Diploma in HRM Masters of Business Studies*	මානව සම්පත් සංවර්ධන නිලධාරී

මූල්‍ය අංශය

ටී ඩී පී පී සමරනායක මෙය, *Professional Part II of ICASL*	ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී 08.07.2021 දින දක්වා
ඊ එම් පී බමුනේන්ද්‍ර මෙය, *B.Com.(Sri Jayewardenepura), Master of Professional Accounting, Licentiate Certificate of ICASL*	ගණකාධිකාරී

අභ්‍යන්තර විගණන අංශය

එම් එම් ජයජීවනී මෙය, *B.Sc.(B.Ad.)Special (Sri Jayewardenepura)*	අභ්‍යන්තර විගණක

තොරතුරු තාක්ෂණ අංශය

එච් එම් එම් පෙරේරා මහතා, *MBCS*	තොරතුරු තාක්ෂණ කළමනාකරු
ඩබ්ලිව් ඒ බී ප්‍රනාන්දු මහතා, *B.Sc.(Networking) (Wolverhampton)*	ජාල පරිපාලක

රහස්‍ය ලේකම්වරු

අයෝමි පලිහවඩන මෙය	21.08.2021 දින දක්වා

2021 වසර තුළ විශ්‍රාමගැනීම්

ටී ඩී ඩී පී සමරනායක මෙය	ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී	08.07.2021 සිට
ආචාර්ය එස් ඒ වී මූර්ති	ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී	23.03.2021 සිට
පී ඒ පලිහවඩන මෙය	රහස්‍ය ලේකම්	22.08.2021 සිට
ඒ ඒ ඩයස් මහතා	රියදුරු	18.10.2021 සිට

2021 වසර තුළ ඉල්ලා අස්වීම්

එස් එම් පන්නල මහතා	තොරතුරු නිලධාරී	27.09.2021 සිට
ආර් එන් එන් ගමගේ මෙය	විද්‍යාත්මක නිලධාරී	15.12.2021 සිට
පී එල් එල් අබේගුණවර්ධන මෙය	කළමනාකරණ සහකාර	28.12.2021 සිට

පිරිනමන ලද පර්යේෂණ හා සංවර්ධන ප්‍රදාන - 2021

ඇමුණුම 2

කෘෂි විද්‍යාව හා ආහාර විද්‍යාව

ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
RG/2021/AG/02	**මහාචාර්ය එම් විතානගේ** පරිසර ගෝලීය ප්‍රත්‍යාස්ථිතිය පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය **ආචාර්ය ඒ යූ රාජපක්ෂ** පීඨාධිපති කාර්යාලය ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය **මහාචාර්ය සී වී එල් ජයසිංහ** ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය **ආචාර්ය පී යූ එස් පීරිස්** ජෛව සංඛ්‍යාලේඛන සහ කෘෂි විද්‍යා ඒකකය පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	කාබනික ආනයනිත අල බෝග ඉඟුරු හා කහවල පාංශු පෝෂක චක්‍රීකරණය, අස්වැන්න හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට පොහොරක් හා නෙමැටෝ-විකර්ෂකයක් ලෙස කාබනික-බණිජවලින් සුපෝෂිත ජෛව අඟුරු සංස්ලේශණය වසර 03	**3,180,000/-**
RG/2021/AG/03	**ආචාර්ය ඩබ්ලිව් ඒ යූ විතාරණ** පාංශු විද්‍යා අධ්‍යයනාංශය කෘෂි විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය **ආර් ඒ සී ජේ පෙරේරා මහතා** ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මහඉලුප්පල්ලම	ආසන්න හා දූරස්ථ සංවේදන පාදක ශිල්පීය ක්‍රම යොදා ගනිමින් වී වගාකරනු ලබන පසෙහි ලවණතාවය වර්ධනය වීම අනුරූපණය වසර 03	**4,086,680/-**
RG/2021/AG/04	**ආචාර්ය බී ආර් ප්‍රනාන්දු** පශු මහජන සෞඛ්‍ය හා ඖෂධවේද අධ්‍යයනාංශය පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය **ආචාර්ය එස් එස් පී සිල්වා** සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පේරාදෙණිය	පරිභෝජක සුරක්ෂිතතාවය තහවුරු කිරීම පිණිස සත්ව සම්භවයක් සහිත ආහාර සහ සත්වාහාරවල පශු වෛද්‍යමය ඖෂධ අවශේෂයන් හා සම්බන්ධ අවධානම් පැහැදිලි කිරීම වසර 02	**3,750,000/-**
RG/GAPF/2021/AG/01	**ආචාර්ය එල් ජේ පීඒ පී ජයසූරිය** **ආචාර්ය ඩී ඒ සතරසිංහ** මූලික පශු වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය පශු වෛද්‍ය විද්‍යා සහ සත්ව විද්‍යා පීඨය **මහාචාර්ය ටී එම් මදුජිත්** ආහාර විද්‍යා අධ්‍යයනාංශය කෘෂි විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය **මහාචාර්ය ගම්මික ප්‍රතාපසිංහ** පශු සම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	ප්‍රති පිළිකා ක්‍රියාකාරීත්වය සහිත ස්වාභාවික සංයුග්මක ලිනොලෙයික් අම්ල සහිත සුපෝෂිත බිත්තර කහමද ලිපිඩ මගින් කුකුළු බිත්තරවලට අගය එකතු කිරීම හා ඉන්පසු අගය එකතු කළ නිෂ්පාදන වාණිජ්‍යකරණය කිරීම වසර 01 මාස 03	**1,670,000/-**

මූලික විද්‍යාවන්

අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
RG/2021/BS/01	**ඩී සී කේ කේ දිසානායක මෙය** ජීව විද්‍යා අධ්‍යක්ෂ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ඔරුගොඩවත්ත වැල්ලම්පිටිය **ආචාර්ය එල් එල් ඩබ්ලිව් සී යාලේගම** **ආචාර්ය දුෂාන් කුමාරතුංග** පොල් පර්යේෂණ ආයතනය **ප්‍රියංගා රත්නායක මෙය** ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය	ආහාර සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම පිණිස පළතුරු හා එළවළු සැපයුම් දාම ප්‍රතිනිර්මාණය කිරීමට තිරණ සහායක පද්ධතියක් සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම වසර 03	1,929,600/-

ඉංජිනේරු විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය

අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
RG/2021/EA&ICT/01	**ආචාර්ය (ඉංජිනේරු)කේ එම් ඒ කේ කුලතුංග** **(ඉංජිනේරු)යූ එස් එස් ධර්මප්‍රිය මෙය** නිෂ්පාදනය හා කර්මාන්ත ඉංජිනේරු අධ්‍යයනාංශය ඉංජිනේරු පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ආහාර සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම පිණිස පළතුරු හා එළවළු සැපයුම් දාම ප්‍රතිනිර්මාණය කිරීමට තිරණ සහායක පද්ධතියක් සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම වසර 03	3,453,750/-
RG/GAPF/2021/EA&ICT/01	**මහාචාර්ය ජේ බී ඒකනායක** විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයනාංශය ඉංජිනේරු පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය **ආචාර්ය අකිල විජේතුංග** ද්‍රව්‍ය හා යාන්ත්‍රික තාක්ෂණවේද අධ්‍යයනාංශය තාක්ෂණ පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය **ආචාර්ය ජේ වී විජයකුලසූරිය** විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයනාංශය ඉංජිනේරු පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ගතික රේඛා ශේණිගත කිරීමේ ඒකාබද්ධ යෙදුමක් සහ බෙදාහැරීමේ ජාල වෙත වහලයේ සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා (PV)ඒකාබද්ධ කිරීම වැඩිදියුණු කිරීම සඳහා සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා අපවර්තක (PVinverter) පාලනය වසර 2 1/2	2,475,000/-

පරිසරය හා ජෛව විවිධත්වය

ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
RG/GAPF/2021/EB/01	**ආචාර්ය අයි ආර් එම් කෝට්ටෙගොඩ** ද්‍රව්‍ය තාක්ෂණ අංශය **ආචාර්ය ආර් සී එල් ද සිල්වා** ද්‍රව්‍ය තාක්ෂණ අංශය කාර්මික තාක්ෂණ ආයතනය 363 බෞද්ධාලෝක මාවත කොළඹ 07	උසස් අගය එකතු කිරීමක් ලෙස ශ්‍රී ලංකාවේ ග්‍රැෆයිට් පිරිපහදු කිරීම වසර 02	930,000/-

RG/GAPF/2021/EB/02	**මහාචාර්ය එම් එම් පත්මලාල්** සත්ව විද්‍යා අධ්‍යයනාංශය **මහාචාර්ය එස් ඩී එම් චින්තක** රසායන විද්‍යා අධ්‍යයනාංශය **ආචාර්ය ජී වයි ලියනගේ** ජලජ ජෛව සම්පත් අධ්‍යයනාංශය ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	නිර්මාණය කරන ලද ගෘහස්ථ ජල පෙරණය පානීය ජලයෙහි අඩංගු Geosmin, 2-MIB, cyanotoxins සහ ප්‍රතිදේහ ඉවත්කිරීම පිණිස වැඩිදියුණු කිරීම වසර 01	**2,000,000/-**

කොවිඩ් 19 නව ප්‍රදාන

TD/2021/COVID/AG/01	**මහාචාර්ය ප්‍රසාද් එම් ජයවීර** පරිගනක විද්‍යා අධ්‍යයනාංශය ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.	ලංකා කෘෂිකර්ම අන්‍යෝන්‍ය කාර්යකාරිතා රාමුව: කෘෂිකාර්මික සැපයුම් දාමය සඳහා තීරණ සහායක සේවාව වැඩිදියුණු කිරීමක් වසර 01	**1,764,000/-**

නව තාක්ෂණ සංවර්ධන ප්‍රදාන (තවදුරටත් අරමුදල් සැපයෙන තාක්ෂණ සංවර්ධන ප්‍රදාන)

TG/2021/Techd/01.	**කේ එම් එස් බණ්ඩාර මහතා** A R A Engineering, පනාවල පාර විල්ලෙගොඩ ඇහැලියගොඩ.	පොල් කර්මාන්තය සඳහා කාර්යක්ෂම පොල් ලෙලි ගැසීමේ යන්ත්‍රය- පහසු පොල්ලෙලි ගසනය මාස 06	**300,000/-**

සම්පූර්ණ කරන ලද පර්යේෂණ හා සංවර්ධන ප්‍රදාන - 2021

කෘෂි විද්‍යාව හා ආහාර විද්‍යාව

අංකය	ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
1.	RG/2017/AG/02	**මහාචාර්ය සී වී එල් ජයසිංහ** ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය **මහාචාර්ය ඩී චාමර කේ ඉලේපෙරුම** ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය කෘෂි විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය **මහාචාර්ය ඒ එන් නවරත්න** රසායන විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	වාණිජමය ආහාර නිෂ්පාදනය සඳහා පළතුරු කර්මාන්තයේ අපද්‍රව්‍යවලින් සාදා ගත් අමුද්‍රව්‍ය වසර 02	2,331,000/-
2.	RG/2017/AG/04	**ආචාර්ය ඩබ්ලිව් එම් පී බී වීරසිංහ** පශු පර්යේෂණ ආයතනයපේරාදෙණිය **ආචාර්ය ආරියන්තිලක මානවඩු** සත්ව විද්‍යා අධ්‍යයන අංශය කෘෂි විද්‍යා පීඨය රුහුණු විශ්වවිද්‍යාලය **ආචාර්ය කුමාර මහීපාල** සත්ව විද්‍යා අධ්‍යයනාංශය කෘෂි විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	කාළගුණ විපර්යාස හමුවේ ධරණීය ලෙස කිරි ආහාර නිෂ්පාදන වේගය වැඩි කරනු පිණිස අලුතෙන් හඳුන්වාදෙන ලද සත්වාහාර නාලස්ථව හා ජීවස්ථව පරීක්ෂාවට බඳුන් කිරීම වසර 03	3,985,000/-

මූලික විද්‍යා

අංකය	ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
1.	RG/2016/BS/01	**මහාචාර්ය ආර් එම් ජී රාජපක්ෂ** රසායන විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය **මහාචාර්ය ජී ආර් ඒ කුමාර** ජාතික මූලික අධ්‍යයන ආයතනය මහනුවර	අඳුරේ දී ඍජු ප්‍රදීපනය සඳහා අධෝරක්ත විකිරණ ලබා ගැනීමේ සහ ප්‍රදීපනය යටතේ මෙන්ම අඳුරේ දී ද විදුලිය ජනනය කිරීමට වර්ණක-සංවේදිකෘත සූර්ය කෝෂ සැකසීමේ මෙවලමක් ලෙස ෆෝටෝන ආරෝහණය. වසර 03	5,235,000/-

ජෛව තාක්ෂණවේදය

අංකය	ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
1.	RG/2016/BT/03	**ආචාර්ය ඒ අරුල්කාන්තන්** පශු ව්‍යාධි ජෛව විද්‍යා අධ්‍යයනාංශය පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	මිරිදිය විසිතුරු මසුන් තුළ වූ මයෝ බැක්ටීරියා පිළිබඳ අධ්‍යයනයන්- අවධානම් සාධක හා සායන- ව්‍යාධිවිද්‍යා ලක්ෂණ හඳුනා ගැනීම සහ ඉක්මණ් රෝග නිර්ණ ශිල්පක්‍රම ප්‍රවර්ධනය කිරීම වසර 03	3,759,000/-
2.	RG/2016/BT/04	**මහාචාර්ය රනිල් දසනායක** රසායන විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය	Pichia pastoris දිලීර මාදිලි පද්ධතියේ RNA නිරෝධන මාර්ගයෙහි ජාන සුසංයෝගී නැවත සකස් කිරීම වසර 04	4,534,135/-

පරිසරය හා ජෛව විවිධත්වය

අංකය	ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
1.	**RG/2017/EB/01**	**ආචාර්ය චන්දිම ඩී දංගල්ල** සත්ව විද්‍යා අධ්‍යයනාංශයවිද්‍යා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාවේ රුක්වාසි වග කුරුම්ණියාගේ (*Coleopteracicindelidae*) විවිධත්වය, ව්‍යාප්තිය හා වාසස්ථාන ආකාරය වසර 03	**4,267,505/-**
2.	**RG/2011/NRB/02**	**ආචාර්ය ආර් ඥානේස්වරන් මහත්මිය** සත්ව විද්‍යා අධ්‍යයනාංශයවිද්‍යා පීඨය යාපනය විශ්වවිද්‍යාලය	භූමියෙන් ඉහළ අපෘෂ්ඨවංශි ජෛවවිවිධත්වය පවත්වා ගැනීම මගින් අනෙකුත් පරිසර පද්ධති සම්බන්ධ කිරීමෙහි ලා කඩොලාන පරිසර පද්ධතියෙහි කාර්යභාරය වසර 02	**843,590/-**
3.	**RG/2017/EB/02**	**මහාචාර්ය එල් ඩී අමරසිංහ මහත්මිය** සත්ව විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය කැළණිය විශ්වවිද්‍යාලය	මඩුරුවන් අභිජනන වාසස්ථානවල ක්ෂුද්‍ර-සත්ව හා ක්ෂුද්‍ර-ශාක විවිධත්වය හා මඩුරු පිළවුන් කෙරෙහි ඒවායේ බලපෑම වසර 02	**2,264,030/-**
4.	**RG/2017/EB/05**	**ආචාර්ය එන් පී එස් කුඹුරේගම** සත්ව විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	නුවර එළියෙහි කෘෂිකාර්මික ඉඩම්වල ගැස්ට්‍රොපෝඩා පළිබෝධකයන්ගේ ව්‍යාප්තිය, කන්නය අනුව ඔවුන්ගේ බහුලතාවය හා වගාවන්ට ඇති කරන හානියේ ප්‍රමාණය වසර 02	**2,565,600/-**

සෞඛ්‍ය විද්‍යාවන්

අංකය	ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
1.	**RPHS/2016/CKDu/06**	**මහාචාර්ය ආර් එල් රෝහණ චන්ද්‍රජිත්** භූ විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	පාලිත කණ්ඩායම් දෙකක් මගින් නිධන්ගත වකුගඩු (CKD-u) රෝගීන්ගේ ස්වභාවික ඉතිහාසය, සායනික ප්‍රකාශනය, මරණ අනුපාතය හා රෝගාතුර වීම හඳුනා ගැනීම.	**10,662,000/-**
2.	**RPHS/2016/C/06**	**ආචාර්ය චතුර රත්නායක** ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය වෛද්‍ය පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	මානව පැපිලෝමා වයිරසය (HPV)ආසාදනය කල් තියා හඳුනා ගැනීම පිණිෂ අණුක ජෛව සලකුණු පාදක මෙවලම් ස්ථාපනය කිරීම හා ශ්‍රී ලාංකික කාන්තාවන් අතර ගැබ්ගෙල පිළිකාවල ව්‍යාධි භෞතවේදයට HPVහි සම්බන්ධතාව	**9,000,000/-**

තාක්ෂණ සංවර්ධන ප්‍රදාන

අංකය	ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා (ලාභීන්)/ ආයතනය	ව්‍යාපෘති මාතෘකාව /කාල සීමාව	වෙන් කළ මුළු මුදල (රු.)
1.	**TG/2016/Tech-D/04**	**එස් කේ සෙනෙවිරත්න මහතා** සූරියගොඩ කිරිබත්කුඹුර	ට්‍රක් ට්‍රේලර් සංයුක්ත වාහන පසුපසට ධාවනය කිරීම සඳහා රියදුරු උපකාරී අන්තර් මුහුණු පද්ධතිය නිර්මාණය කිරීමට අරමුදල් සපයන ලදී මාස 12	**680,000/-**

2.	**TG/2017/Tech-D/03**	**මහාචාර්ය එන් එම් එම් ජී එස් බී නවරත්න** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	සංයුක්ත පිටිවලින් සකස් කරන ලද සහල් ආශ්‍රිත මුහුම්කරන ලද ආහාර නිෂ්පාදනවල සිදුරු-කැටිති (Porous-Crumb)ව්‍යුහය වැඩිදියුණු කිරීම පිණිස පැසවීමේ කුටීරයක් නිර්මාණය කිරීම වසර 02	**3,031,552/-**
3.	**TG/2016/Tech-D/02**	**මහාචාර්ය ඩී ජී ජී පී කරුණාරත්න** රසායන ඉංජිනේරු අධ්‍යයනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ශ්‍රී ලාංකික ඩොලමයිට් හුණුවලින් අගය එකතු කළ නිෂ්පාදන සංස්ලේශණය හා වාණිජ්‍යකරණය වසර 03 මාස 09	**11,893,200/-**

2021 වසරේදී සම්පූර්ණ කරන ලද පර්යේෂණ ශිෂ්‍යත්ව

අංකය	ප්‍රදාන අංකය සහ කාල සීමාව	විද්‍යාර්ථියා හා ආයතනය	අධීක්ෂකවරයා/ අධීක්ෂකවරුන්	මාතෘකාව	ලබාගත් පශ්චාත් උපාධිය
1.	**NSF/SCH/2017/01** **වසර 3**	**මදුජා වී එම් දිවාරත්න මෙය** ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය වෛද්‍ය පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	**ආචාර්ය එෆ් නූර්දීන්** **ආචාර්ය ඒ ජේ මොරෙල්**	ශ්‍රී ලංකාවේ රෝහල්ගතව සිටින තෝරාගත් ළමුන් පිරිසකගේ උග්‍ර ශ්වසන මාර්ග ආසාදන ඇතිකරන ශ්වසන සංසෙලිය සහ මානව මෙටානියුමෝ වෛරස් වල ලක්ෂණ හඳුනාගැනීම	**PhD**
2.	**NSF/SCH/2019/01** **වසර 1.5**	**ඩබ්ලිව් එල් බී පී අභයවික්‍රම මෙය** ජෛව තාක්ෂණ අධ්‍යයනාංශය කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	**මහාචාර්ය එන් එස් කෝට්ටෙආරච්චි** **ආචාර්ය ඩී ආර් ගිම්හානි** **ආචාර්ය වෙනුර හේරත්**	වී ශාකයේ(*Oryzasativa*) ලවණ ප්‍රතිරෝධය සඳහා ඔබ සිතියම් පාදක අපේක්ෂක ජාන සොයාගැනීම	**PhD**
3.	**NSF/SCH/2016/03** **වසර 2**	**අබිරාමි තුරෙයිරාජා මෙය** කෘෂි විද්‍යා පීඨය යාපනය විශ්වවිද්‍යාලය	**ආචාර්ය නලිනා ඥානවෙල්රාජා ආචාර්ය රේණුකා ආර් රත්නායක**	නයිට්‍රිහාරක බැක්ටීරියා වෙන්කර ගැනීම හා යාපනය දිස්ත්‍රික්කයේ ළිං ජලයෙන් නයිට්‍රේට් ඉවත්කිරීමෙහි ලා ඒවායෙන් තිබිය හැකි ප්‍රයෝජන	**MPhil**
4.	**NSF/SCH/2018/12** **වසර 2**	**සුජන්කි රාසකුලේන්ද්‍රන් මෙය** සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශය කොළඹ විශ්වවිද්‍යාලය	**ආචාර්ය අයි සී පෙරේරා** **ආචාර්ය එන් ටී පෙරේරා**	*Mycobacteriumtuberculosis*හ ට එරෙහිව නව ඖෂධ ඉලක්කයක් ලෙස ලිගන්ඩවලට ප්‍රතිචාර දක්වන සමජාත MarR	**PhD**
5.	**NSF/SCH/2017/02** **මාස 16**	**ආචාර්ය තවරාජා විජයකුමාර්** ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය වෛද්‍ය පීඨය යාපනය විශ්වවිද්‍යාලය හා සිද්ධ ශික්ෂණ රෝහල කෙතඩ් චාවකච්චේරි	**ආචාර්ය එස් බාලකුමාර්** **ආචාර්ය ටී තයාලිනී මහත්මිය**	අක්මා, වෘක්කාණු, ස්නායු සහ රුධිරය පිළිබඳ සුරක්ෂිතතා ඇගයීම; සිද්ධ ශාකමය බණිජ ඖෂධයක්වන Sinna*SivappuMaathirai*හි ප්‍රතිඔක්සිකාරක ක්‍රියාකාරීත්වය	**MPhil**
6.	**NSF/SCH/2017/03** **වසර 3**	**සමින්ද සී ප්‍රේමරත්න මහතා** UCSC	**ආචාර්ය ලක්ෂ්මන් ජයරත්න**	බහුමාධ්‍ය දත්ත පදනමක වස්තු විභේදනය	**PhD**
7.	**NSF/SCH/2018/04** **වසර 3**	**ජසීකරන් තිල්ලෙයිනාදන් මහතා** PGIS පේරාදෙණිය	**මහාචාර්ය එම් ඒ කේ එල් දිසානායක** **මහාචාර්ය ජී කේ ආර් සේනාධීර**	සූර්ය කෝෂ සහ අධෝරක්ත අනාවරකවල යෙදවුම් සඳහා අර්ධ සන්නායක ක්වොන්ටම් තිත්	**MPhil**
8.	**NSF/SCH/2017/09** **වසර 3**	**එස් ඩබ්ලිව් ජී ආර් ටී කේ ආරියවංශ මෙය** කෘෂි ඉංජිනේරු අධ්‍යයනාංශය කෘෂි විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	**මහාචාර්ය බී එෆ් ඒ බස්නායක** **ආචාර්ය ඒ කේ කරුණාරත්න**	ජෛව රසායනික පරිණාමණ චාලක විද්‍යාව සඳහා අන්තර් ක්‍රියාකාරී ගණිතමය ප්‍රකාශන නිර්මාණය කිරීම	**PhD**
9.	**NSF/SCH/2019/07** **වසර 1**	**උවිඳු ඩී ඒ ඇන්තනි මහතා** පරපෝෂ විද්‍යා අධ්‍යයනාංශය වෛද්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	**මහාචාර්ය රේණු වික්‍රමසිංහ** **මහාචාර්ය ප්‍රීති උඩගම** **මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු**	ශ්‍රී ලංකාව තුළ මැලේරියාව පිටුදැකීම ස්ථාපනය කිරීම පිණිෂ ආධාරක සාක්ෂි සැපයීමට මස්තු විද්‍යාව සංගතවේදී අධ්‍යනයක්	**MPhil**
10.	**NSF/SCH/2017/05** **වසර 1**	**එන් ජී එල් නදී නානායක්කාර මෙය** ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය රුහුණු විශ්වවිද්‍යාලය	**ආචාර්ය නාලක රණසිංහ** **මහාචාර්ය කේ ආර් රංජිත් මහානාම** **මහාචාර්ය තිලක් හේවාවසම්**	සාගර ප්‍රතියුක්ත (marine proxies) භාවිතා කරමින් ශ්‍රී ලංකාව තුළ චාතුර්ථ දේශගුණික විචල්‍යතාවය ප්‍රතිනිර්මාණය කිරීම	**MPhil**

11.	**NSF/SCH/2015/07** **3years**	**නිමේෂ් මදුශංක දෙනෙත්ති මහතා** පශු සම්පත් නිෂ්පාදන අධ්‍යයනාංශය කෘෂි විද්‍යා පීඨය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	**ආචාර්ය මංජුලපී සුමිත් මාගමගේ** **ආචාර්ය එච් ඒ ඩී රුවන්දීපික**	අළුත උපන් ගෝරු පැටවුන්ගේ ඩිම්බ කෝෂවලින් සහ නාලස්ථව කෝෂීයසහුනිකා සහිත වැඩිහිටි ඩිම්බකෝෂවලින් සම්භවය වන ගෝරන්ගේ සහුනිකාවිකසනය වීමේදී Angiogenic VEGF isoforms සහ Anti-angiogenic VEGF165B හි බලපෑම	**MPhil**
12.	**NSF/SCH/2016/02** **3years**	**අශෝක රංජීව දීගොඩ ගමගේ මහතා** විද්‍යා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය	**මහාචාර්ය දේවක වීරකෝන් ආචාර්ය ප්‍රීතිවිරාජ් ප්‍රනාන්දු**	ආසියානු පිරිමි අලියා: ශ්‍රී ලංකාවේ උඩවළවෙහි ආසියානු පිරිමි අලියාගේ හැසිරීම සහ ජීවන අවධි	**MPhil**
13.	**NSF/SCH/2016/04** **4years**	**ජොඇන් ටිෆානියා කොතලාවල මෙය** IBMBB කොළඹ විශ්වවිද්‍යාලය	**මහාචාර්ය කමණි එච් තෙන්නකෝන්** **ආචාර්ය කණිෂ්ක ද සිල්වා**	විකිර්ණ පියයුරු පිළිකාවල D-loop සහ mtDNA ඒකගුණ කණ්ඩායම් තුළ මයිටකොන්ඩ්‍රිය DNA විකෘතිවල ලක්ෂණ හඳුනා ගැනීම	**MPhil/ PhD**
14.	**NSF/SCH/2017/04** **2years**	**ෆාතිමා සබ්‍රිනා නසීර් මහත්මිය** ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය වාස්තු විද්‍යා පීඨය මොරටුව විශ්වවිද්‍යාලය	**ආචාර්ය සචී ගුණතිලක** **ආචාර්ය තනුජා රාමචන්ද්‍ර**	පහසුතා කළමණාකරණ (FM) පිළිවෙත්වලට තිරසාරභාවය ඒකාබද්ධ කිරීම පිණිෂ හැකියා රාමුවක් නිර්මාණය කිරීම	**MPhil**
15.	**NSF/SCH/2018/10** **1year**	**ඒ කේ අයි යූ කපුගේ මෙය** සාගර විද්‍යා සහ සමුද්‍රීය භූ විද්‍යා අධ්‍යයනාංශය රුහුණු විශ්වවිද්‍යාලය	**ආචාර්ය ප්‍රදීප් නාලක රණසිංහමහාචාර්ය ඒ එල් තිලක් හේවාවසම් ආචාර්ය සී එච් ඊ ආර් සිරිවර්ධන**	චාතුර්ථික යුගයේදී රත්නපුර ද්‍රෝණිය තුළ පුරාදේශගුණික හා පුරාපාරිසරික වෙනස්වීම් අධ්‍යයනය කිරීම	**MPhil**
16.	**NSF/SCH/2019/05** **2years**	**සෙන්තුරන් සිවසුබ්‍රමණියම් මහතා** භෞතික විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය යාපනය විශ්වවිද්‍යාලය	**මහාචාර්ය එම් ඒ කේ එල් දිසානායක** **මහාචාර්ය ජී කේ ආර් සේනාධීර**	වර්ණක සංවේදීකෘත සූර්ය කෝෂ සඳහා නැනෝ ව්‍යුහාත්මක TiO_2 ප්‍රකාශ ඇනෝඩය පිරිසැකසීම හා ලක්ෂණ හඳුනාගැනීම	**MPhil**

2021වසරේදී සම්පූර්ණ කරන ලද පශ්චාත් උපාධි පර්යේෂණ අධිශිෂ්‍යත්ව

අංකය	අධිශිෂ්‍යත්ව අංකය හා කාල සීමාව	විද්‍යාර්ථියා හා ආයතනය	මාතෘකාව
1.	**NSF/PDRS/2018/01** **3years**	**ආචාර්ය සී එල් විතාන** භූ විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාවේ මුතුරාජවෙල වගුරු බිම් පසෙහි ආසනික් හටගැනීම හා එහි සචලතාව සඳහා ඇති හැකියාව: අම්ල සල්ෆෙට පාංශු ද්‍රව්‍ය සමග සම්බන්ධතාවය

පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන සහය යෝජනා ක්‍රමය (SUSRED) යටතේ ප්‍රදානයන් 2021

ඇමුණුම 5

අංකය	අධීක්ෂණ කණ්ඩායමේ සාමාජිකයින්ගේ නම් හා අනුබද්ධ ආයතන	නිබන්ධනයේ මාතෘකාව	ශිෂ්‍යයා හා පිරිනමන විශ්වවිද්‍යාලය
	-PhD-		
1.	**මහාචාර්ය මේනක හපුගොඩ** අණුක වෛද්‍ය විද්‍යා ඒකකයවෛද්‍ය පීඨය කැළණිය විශ්වවිද්‍යාලය **මහාචාර්ය ඩබ්ලිව් අබයවික්‍රම** පරිපූරක සායනික විද්‍යා අධ්‍යයනාංශය වෛද්‍ය පීඨය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	Anopheles මදුරු අභිජනන වාසස්ථානවල ජලයෙහි ගුණාත්මකභාවය කෙරෙහි ඇති බලපෑම පිළිබඳ අධ්‍යනය කිරීම සහ කීටභක්ෂක මසුන් හා මාංශ භක්ෂක කොපෙපොඩාවන් භාවිතා කරමින් Anopheles මදුරුවන් පාලනය	**ආචාර්ය ආර් එම් ටී බී රණතුංග** කැළණිය විශ්වවිද්‍යාලය
2.	**මහාචාර්ය ලෝහිනී විජයේන්ද්‍රන් අකිත්තන්** ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය වෛද්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, **ආචාර්ය සුනිල් පෙරේරා** සෙන්ට්‍රල් රෝහල කොළඹ **මහාචාර්ය හේමන්ත පීරිස්** ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය වෛද්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාවේ තෝරාගත් ස්නායු ශල්‍ය ඒකකවල lumbardiscectomy සඳහා භාජනය කර ඇති රෝගීන් තුළ කටී අන්තර් කශේරුක මඩලෙහි හර්නියා හටගැනීම හා සම්බන්ධ සාධක	**ආචාර්ය එන් ඩී විතානගේ** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
3.	**මහාචාර්ය රංගික යූ හල්වතුර** සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය ඉංජිනේරු පීඨය මොරටුව විශ්වවිද්‍යාලය	මඩ සිමෙන්ති තාක්ෂණය සඳහා විකල්ප ස්ථායීකාරකවල සාඵල්‍යතාවය	**ආචාර්ය සී දුස්සන්ත උඩවත්ත** මොරටුව විශ්වවිද්‍යාලය
4.	**මහාචාර්ය ආර් කේ ශ්‍රියානි ඛයස්** සත්ව විද්‍යා සහ පරිසර කළමනාකරණ අධ්‍යයනාංශය විද්‍යා පීඨය කැළණිය විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වනාන්තර රක්ෂිත දෙකක් තුළ තෝරාගත් ප්‍රදේශයක Aneuretussimoni Emery ආශ්‍රිත කුහුඹු ප්‍රජාව තුළ කැදලි ලක්ෂණවල සහ සේවක හටගැනීමේ ගතිකත්වය	**ආචාර්ය ඩබ්ලිව් එස් කඟ උදයකාන්ත** කැළණිය විශ්වවිද්‍යාලය
5.	**මහාචාර්ය පත්මලාල් එම් මානගේ** **මහාචාර්ය එස් එම් ඩී ඒ යූ ද අල්විස්** **මහාචාර්ය බී ජී ඩී එන් කේ ද සිල්වා** සත්ව විද්‍යා අධ්‍යයනාංශය ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	ජලය හා අවසාදිත තුළ තෝරාගත් ප්‍රතිජීවක අපවිත්‍රවීම් වෙන්කර ගැනීම සහ ප්‍රතිජීවක ප්‍රතිරෝධී බැක්ටීරියාවල ලක්ෂණ හඳුනා ගැනීම	**ආචාර්ය ගයානි වයි ලියනගේ** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
6.	**මහාචාර්ය කේ කේ ඩී එස් රණවීර** ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	ශ්‍රීලංකාවේ වැවෙන අඩුවෙන් ප්‍රයෝජනයට ගැනෙන හරිත පලා එළවළුවල ප්‍රතිඔක්සිකාරක හා ප්‍රති-ප්‍රදාහික ගුණ හඳුනාගැනීම සහ ලක්ෂණ විදහා දැක්වීම	**ආචාර්ය කේ ඩී පී පී ගුණතිලක** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
7.	**මහාචාර්ය එම් වයි උඩුගල -ගනේහේනගේ** රසායන විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය **ආචාර්ය සී එස් කල්පගේ** රසායනික හා සැකසුම් ඉංජිනේරු අධ්‍යයනාංශය ඉංජිනේරු පීඨයපේරාදෙණිය විශ්වවිද්‍යාලය	විෂම ජාතිය උත්ප්‍රේරක භාවිතා කරමින් ජෛව ඉන්ධන හා කාර්මික රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම පිණිෂ පරිසර දූෂක හා ජෛවසංකන්ධ ප්‍රයෝජනයට ගැනීම	**ආචාර්ය ටී එම් එම් මාසෝ** පේරාදෙණිය විශ්වවිද්‍යාලය
8.	**මහාචාර්ය සී ඒ එන් ප්‍රනාන්දු** **ආචාර්ය එස් එන් ටී ද සිල්වා** නැනෝ විද්‍යා තාක්ෂණ අධ්‍යයනාංශය තාක්ෂණ පීඨය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	CAC සහ p-AgO තුනී පටල තැන්පත් කිරීම ඔස්සේ n-CuO ක්ලොන්ටම් තිත් (QDS) සංවේදිකෘත සූර්ය කෝෂ පිරිසැකසීම සහ ඒවායේ ප්‍රකාශ ලාක්ෂණික ගුණ වැඩිදියුණු කිරීම	**ආචාර්ය පී ජී ඩී සී කේ කරුණාරත්න** ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

9.	**මහාචාර්ය සී ඒ එන් ප්‍රනාන්දු** නැනෝ විද්‍යා තාක්ෂණ අධ්‍යයනාංශය තාක්ෂණ පීඨය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය	අඩු වියදම් නැනෝ ද්‍රව්‍යවලින් පිරිසකසන ලද සූර්ය ශක්ති පරිවර්තන උපාංගවල ප්‍රකාශ ආවරණ හා ඒවායේ භාවිතාවන් පරීක්ෂා කිරීම	**ආචාර්ය එස් පී ඒ යූ කේ සමරකෝන්** ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
10.	**මහාචාර්ය එල් බී ඩී ආර් පී විජේසුන්දර** **මහාචාර්ය ඩබ්ලිව් පී සිරිපාල** භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රොනික විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය කැලණිය විශ්වවිද්‍යාලය	විද්‍යුතාව සාදුනය කළ CuO සන්ධි වල අන්තර්මුහුණත් ගුණාංග හා කාර්යක්ෂම සමසන්ධි සූර්ය කෝෂ නිර්මාණය කිරීම 2	**ආචාර්ය එෆ් එස් බී කාෆි** කැලණිය විශ්වවිද්‍යාලය
11.	**මහාචාර්ය වයි කේ විරකෝන් බණ්ඩා** මූල්‍ය අධ්‍යයනාංශය කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය **මහාචාර්ය ඒ ඒ අසීස්** මූල්‍ය අධ්‍යයනාංශය කළමනාකරණ හා මූල්‍ය පීඨය කොළඹ විශ්වවිද්‍යාලය	ලාභාංශ ප්‍රතිපත්තියෙහි නිර්ණායක සහ ශ්‍රී ලංකාවෙන් ව්‍යාපාර වස්තු මිල වාෂ්පශීලිතා සාක්ෂි මත එහි බලපෑම	**ආචාර්ය ඩී එන් ජයන්ත** කොළඹ විශ්වවිද්‍යාලය
12.	**මහාචාර්ය පී වී උඩගම** සත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය **මහාචාර්ය ඩබ්ලිව් ඩී රත්නසූරිය** මූලික විද්‍යා අධ්‍යයනාංශය සම සෞඛ්‍ය විද්‍යා පීඨය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය **ආචාර්ය ජී ඒ එස් ප්‍රේමකුමාර** මූලික විද්‍යා හා සමාජ විද්‍යා අධ්‍යයනාංශය හෙද පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	*Caricapapaya* ශ්‍රී ලාංකික වල් දර්ශ වගා ප්‍රභේදයෙහි පරිණත පත්‍ර සාන්ද්‍රිතයෙහි රක්තවේදීය, ස්නායු මූර්ඡක සහ පිළිකා රසායනික නිවාරක ක්‍රියාකාරීත්වය	**ආචාර්ය චානිකා ඩී ජයසිංහ** කොළඹ විශ්වවිද්‍යාලය
13.	**මහාචාර්ය ආර් ඒ ආර් සී ගෝපුර** **ආචාර්ය වයි ඩබ්ලිව් ආර් අමරසිංහ** යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය ඉංජිනේරු පීඨය මොරටුව විශ්වවිද්‍යාලය	රොබෝ තාක්ෂණික උත්තර ප්‍රගණ්ඩ ප්‍රකෘතිකරණය සඳහා දෘශ්‍ය ආධාරක reach-to-grasp මාර්ග සැලසුම්කරණයක් සහ පාලක ක්‍රමවේදයක් නිර්මාණය කිරීම	**ආචාර්ය ඩී ජී කණිෂ්ක මදුසංක** මොරටුව විශ්වවිද්‍යාලය
14.	**ආචාර්ය ඒ ජී බී පී ජයසේකර** විදුලි ඉංජිනේරු අධ්‍යයනාංශය ඉංජිනේරු පීඨය මොරටුව විශ්වවිද්‍යාලය	ස්නායු-නොපැහැදිලි එළඹුමක් භාවිතා කරමින් සේවා රොබෝ යන්ත්‍ර සඳහා යාත්‍රණ විධානවල අනියත තොරතුරු අර්ථ දැක්වීම වැඩිදියුණු කිරීම	**ආචාර්ය එම් ඒ වී ජේ මුතුගල** මොරටුව විශ්වවිද්‍යාලය

අංකය	අධීක්ෂණ කණ්ඩායමේ සාමාජිකයින්ගේ නම් හා අනුබද්ධ ආයතන	නිබන්ධනයේ මාතෘකාව	ශිෂ්‍යයා හා පිරිනමන විශ්වවිද්‍යාලය
	-MPhil-		
1.	**මහාචාර්ය එස් බී නවරත්න** ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය **මහාචාර්ය සී එම් නවරත්න** **ආචාර්ය බී එම් ජිනේන්ද්‍ර සිරිවිජය** කෘෂි ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය කෘෂි විද්‍යා පීඨය රුහුණු විශ්වවිද්‍යාලය	ගෝලීය උෂ්ණත්වයට අනුකූල වන පරිදි විවිධ උෂ්ණත්ව යටතේ ගබඩාකරන ලද වීවල පසු අස්වන ප්‍රාඩුව තක්සේරු කිරීම සහ අනුවර්තනය කළ හැකි ශිල්පීය ක්‍රම	**එම් ජී ජී අවන්ති මෙය** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2.	**ආචාර්ය ආර් එන් අත්තනායක** උද්භිද විද්‍යා අධ්‍යයනාංශය **ආචාර්ය සී එස් කේ රාජපක්ෂ** රසායන විද්‍යා අධ්‍යයනාංශය විද්‍යා පීඨය කැලණිය විශ්වවිද්‍යාලය **කේ පී සෝමචන්ද්‍ර මහතා** නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රාදේශීය කෘෂි පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය බණ්ඩාරවෙල	ගෝවාවල *Sclerotiniasclerotiorum* ගහණ විවිධත්වය සහ කාබන් මූලාශ්‍ර මත රඳා පවතින නිර්වායු පාංශු පෘෂ්ඨීක ව්‍යාසාදනය(ASD)	**තිරේගා මහලිංගම් මෙය** කැලණිය විශ්වවිද්‍යාලය
3.	**ආචාර්ය ඩී රොමේන් ජයවර්ධන** **ආචාර්ය ජයම්පති කේ රත්නායක** ගණිත අධ්‍යයනාංශය විද්‍යා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය	On the initial algebras and final coal gebrasofendofunctorsarising from self-similar systems on the category of k-pointed metric spaces	**එම් අන්නන්තක්‍රිෂ්ණා මහතා** කොළඹ විශ්වවිද්‍යාලය
4.	**ආචාර්ය කේ එම් තිළිණි දක්ෂිණා ගුණසේකර** බහු අවයවක විද්‍යා අධ්‍යයනාංශය **ආචාර්ය අසිත ටී කුරේ** රසායන විද්‍යා අධ්‍යයනාංශය ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය **ආචාර්ය දිල්රූ රත්නවීර** ප්‍රධානී, ඩිස්කවරි ලැබ්ස් MAS ඉනොවේෂන් පුද්ගලික සමාගම කොළඹ02	ජලීය මාධ්‍යවලින් තෝරාගත් ඇනායන හා කැටායන ඉවත්කිරීම පිණිස පොලිඇක්‍රයිලික 'අම්ල-ඇක්‍රයිලැමයිඩ් පාදක ජල පිරිපහදු පද්ධති	**එස් කේ ටී තත්සරා මෙය** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
5.	**මහාචාර්ය රූපිකා රාජකරුණා** සත්ව විද්‍යා අධ්‍යයනාංශයවිද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	සාමාන්‍ය කඳුකර ගස් මැඩියා (*Polypedatescruciger*) තුළ ට්‍රමෙටෝඩා ආසාදනය: බහු පරපෝෂිතතාව සහ වයස මත රඳා පවතින ප්‍රතිරෝධිතාව හා ඔරොත්තු දීම	**නුවන්දි යූ කේ පතිරණ මෙය** පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ප්‍රකාශන ගාස්තු සඳහා සහාය යෝජනා ක්‍රමය (SSPF)

ඇමුණුම 6

අංකය	කතුවරුන්/ආයතන	පර්යේෂණ පත්‍රිකාවේ මාතෘකාව	සඟරාවේ නම, සඟරාවේ බලපෑම් සාධකය සහ දර්ශකය	ප්‍රදාන මුදල (රු.)
1.	**අනෝමා පෙරේරා** උද්භිද විද්‍යා අධ්‍යයන අංශය විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය **අසංක මුදන්නායක** උද්භිද විද්‍යා අධ්‍යයන අංශයවිද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය **ලහිරු රණවීර** **මහාචාර්ය ප්‍රේමින්ද සමරවීර** **සුනෙත් සූරියපතිරණ** අණුක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ අධ්‍යයනාංශය විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාව තුළ දේශගුණික වශයෙන් සීමා සහිත වූ අනාවරණය *Cycaszeylanica* සංකීර්ණයෙහි රූප ජනක හා පරිසර විද්‍යාත්මක නිකේතන විශ්ලේෂණ *https://doi.org/10.1038/s41598-019-53011-w*	Scientific Reports (Nature) 4.011 (2019) SCIE	**200,000/-**
2.	**වරුණි ජයසූරිය** වන හා පාරිසරික විද්‍යා අධ්‍යයනාංශය ව්‍යවහාරික විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය **AnneNg** College of Engineering and Science වික්ටෝරියා විශ්වවිද්‍යාලය ඕස්ට්‍රේලියාව **ශෝභා මුතුකුමාරන්** College of Engineering and Science වික්ටෝරියා විශ්වවිද්‍යාලය ඕස්ට්‍රේලියාව **ක්‍රිස් පෙරේරා** College of Engineering and Science වික්ටෝරියා විශ්වවිද්‍යාලය ඕස්ට්‍රේලියාව	අපධාවය කළමණාකරණය කිරීම පිණිස කාර්මික ප්‍රදේශවල හරිත යටිතල පහසුකම් භාවිතාවන් ප්‍රශස්තකරණය: ගැටළු, අභියෝග ශා අවස්ථාවන් පිළිබඳ සමාලෝචනයක් *https://doi.org/10.3390/w12041024*	MDPI Water 2.544 (2019) SCIE	**150,000/-**
3.	**සුබාජිනි සිවකාන්තන්** **ජෙරින් ක්ලෙයාර් පෙරෙයිරා** **එස් වසන්තරූබා** කෘෂි රසායන විද්‍යා අධ්‍යයනාංශය කෘෂි විද්‍යා පීඨය යාපනය විශ්වවිද්‍යාලය	තෙලෙන් බැඳීමේදී වේගවත් උදුන් ගබඩාකරණය යටතේ තලතෙල්වල *(Sesamumindicum)* ඔක්සිකරණ ස්ථායීතාව කෙරෙහි කාමරංගා *(Averrhoacarambola L.)* අතුරුඵලවල බලපෑම *https://doi.org/10.5650/jos.ess19248*	Journal of Oleo Science 1.304 (2019) SCIE	**54,018/-**

අංකය	නම	පුහුණු වැඩසටහන	කාලසීමාව	ආයතනය
1.	එස් සී එස් ප්‍රනාන්දු මහතා	NCT විදුලි හා විද්‍යුත් ඉංජිනේරු විද්‍යා NVQ 5 (සමාසිකය II) විභාගය	දින 7	කාර්මික විද්‍යාලය, කළුතර
2.	ඒ එන් එල් පෙරේරා මෙය	ඩිප්ලෝමාව Graphic Design, Design, Develop and Create	වසර 1	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
3.	මදුකා සේනාරත්න මෙය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් ඵලදායිතාව වර්ධනය කිරීම	ඔක්තෝම්බර් 11, 18 සහ 25 (දින 03)	දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය (DLC)
4.	නදීජා වික්‍රමාරච්චි මෙය	Editorial processesfor journal editors	021 ඔක්තෝම්බර් 05 සිට නොවැම්බර් 08 දක්වා	International Network for Advancing Science and policy (INASP)
5.	උපුලි රත්නායක මෙය	Editorial processesfor journal editors	2021 ඔක්තෝම්බර් 05 සිට නොවැම්බර් 08 දක්වා (සතියකට පැය 45)	International Network for A dvancing Science and policy (INASP)
6.	තිළිණා කඳානමුල්ල මෙය	විද්‍යාල තාක්ෂණ, ඉංජිනේරු හා ගණිත ක්ෂේත්‍රය පිළිබඳ ජනතාවගේ දැනුවත්භාවය සහ එම ක්ෂේත්‍රය තුළ කාන්තාවන්ගේ කාර්යභාරය දියුණු කිරීම	2021 අගෝස්තු 10 සහ 11 (සතියකට පැය 45)	STEM
7.	තිළිණා කඳානමුල්ල මෙය	බලපෑම් සහගත පර්යේෂණ ලිවීම (WIR)	2021 අප්‍රේල් 22 සිට අගෝස්තු 05 දක්වා	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
8.	දිලුෂි මුණසිංහ මෙය	සමාජ විද්‍යා මාර්ගගත පාඨමාලාවේ පර්යේෂණ ලිවීම සමාජ විද්‍යා මාර්ගගත පාඨමාලාවේ පර්යේෂණ ලිවීම (2021)	2021 ජුනි 08 සිට ජුලි 26 දක්වා	AuthorAID and INASP
9.	ප්‍රදීප් සපුමොහොට්ටි මහත	රාජ්‍ය ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	2020 දෙසැම්බර් සිට 2022 ආප්‍රේල් දක්වා	MILODA

ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ - 07,
ශ්‍රී ලංකාව.

දුරකථන : +94 112694170
+94 112696771

ෆැක්ස් : +94 112694754

ඊ මේල් : dg@nsf.gov.lk
info@nsf.gov.lk

වෙබ් : www.nsf.gov.lk

: https://www.facebook.com/nsflk/

: https://twitter.com/NSFSriLanka

: https://www.youtube.com/user/NSFSL